# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,869 — 1969 අගෝස්තු 29 වැනි සිකුරාද — 1969.8.29

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1477 | තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 1516 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1493 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1496 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 1514 | විවිධ දැන්වීම් ... ... ... | 1518 |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ජෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසි වලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය.
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදනම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(සී) චරිත සහතිකදෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතකට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සළකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිළධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතකුදු වුවත්, තම ඉල්ලුම්පත්‍ර එසේ එවූවේ කවදදැයි ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද (''ආ'' සළකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර, මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිළධාරියකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ 1 වන කොටසේ (II) වන ඡෙදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවයේ තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම්පත්‍ර පෝර්මය සමග තමන්ට නිකුත් කරන ලද (''අ'' සළකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම්පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුන බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද, ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති 3 ක් ඇතුලත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දන්වීමක් නොලැබෙන්නාවූද, අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවෙකු ගැන සළකා බැලීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍යසේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 අගෝස්තු මස 22 දින,
කොළඹ 1,
තැ. පෙ. 500,
ගාලු මුවදෙර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍යසේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

8–1436/1—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒ. බී. 16/එක්ස්. 2134/69

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### (බරවා රෝග මර්දන ව්‍යාපාරයේ) කීට විද්‍යාඥ තනතුර

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ (බරවා රෝග මර්දන ව්‍යාපාරයේ) කීට විද්‍යාඥ තනතුරක් සඳහා අයදුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලයෙන් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතු ය.

(අ) මෙරට අයදුම් පත් 1969, සැප්තැම්බර් මස 12 වැනි දින

(ආ) පිටරට අයදුම් පත් 1969, සැප්තැම්බර් මස 19 වැනි දින

සටහන—

(i) මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක්ද නැද්ද යනු ඉතාමත් පැහැදිළිව සඳහන් කරමින් 9" × 4" ප්‍රමාණයට කුඩා නොවූද තම ලිපිනය ලියන ලද්දවූ ද, මුද්දර නොගැසුවා වූද ලියුම් කවරයක් එවිය යුතු ය.

(ii) අයදුම්පතක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා තම අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතු යි.

(iii) පිටරටවල අයැදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම්පත් ආකෘතීන් විදේශීය රටවල සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකි ය. තම ඉල්ලුම්පත් ලංකාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කරනු ලැබ සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළත දී භාර දීමට අයදුම් කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය සහ නැව් ගාස්තු**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශීය රටවලින් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දනගනු පිණිස පිළගත් වෛද්‍ය වරයෙකු ඉදිරියේ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වේ.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

3. **මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය,**—වර්ෂයකට රු. 4,080 කින් පටන් ගෙන රු. 360 වාර්ෂික වැඩිවීම් 12 කින්ද, රු. 480 වාර්ෂික වැඩිවීම් 10 කින්ද වැඩි වෙමින් වර්ෂයකට රු. 11,280 හි දී දුවුරුද්දක නැවතීමක් ඇති ව හා වර්ෂයකට රු. 8,400 සහ රු. 11,760 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇතුව රු. 13,200 දක්වා වැඩිවන වැටුපක් මෙම තනතුරට අයත් ය.

(i) වාර්ෂික වැටුප රු. 8,400 න් ඔබ්බට යාමට පෙර කීට විද්‍යාව විෂයයෙහි පී.එච්.ඩී. උපාධිය ලබාගත යුතු ය.

(ii) පිළිගත් විශ්ව විද්‍යාලයක කීට විද්‍යාව විෂයයෙහි ඇම්.ඇස්.සී., හෝ පී.එච්.ඩී., උපාධියක් ඇති අපේක්ෂකයෙකු තෝරා ගනු ලැබුව හොත් ඉහත දක්වෙන වැටුප් ක්‍රමයෙහි වර්ෂයකට රු. 5,160 වැටුප මත පත් කිරීමට ඔහු සුදුස්සෙක් වෙයි.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදයක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) තමා විශිෂ්ඨ චරිතයකින් සහ මනාශාරීරික සනීපයෙන් හෙබි බව;

(ආ) 1969 සැප්තැම්බර් මස 12 වනදට තම වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි බව (දනටමත් රජයේ සේවයේ නියුක්ත අපේක්ෂකයින් කෙරෙහි උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

(ඉ) පිළිගත් විශ්ව විද්‍යාලයක කීට විද්‍යාව විශේෂ විෂයයක් සහිතව සත්ව විද්‍යාව විෂයයෙහි (විශේෂ) බී.එස්.සී., උපාධිය ලබා ඇති බව, (පළමුවන හෝ දෙවන පෙළ ගෞරව උපාධි ලබා ඇති අයට වැඩි කැමැත්තක් දක්වනු ලැබේ), හෝ

(ඊ) පිළිගත් විශ්ව විද්‍යාලයක කීට විද්‍යාව විෂයයෙහි පී.එච්.ඩී., හෝ ඇම්.ඇස්.සී. උපාධිය ලබා ඇති බව.,

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදනම් විය යුතුය.

(අ) උප්පැන්න සහතිකය
(සැ.යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික මේ සඳහා බාරගනු නොලැබේ.)

(ආ) උපාධිය හෝ ලැබූ ඉහළම අධ්‍යාපන සහතිකය.

(ඉ) චරිත සහතික දෙකක්, මින් එකක් අධ්‍යයන අධ්‍යක්ෂකගෙන් හෝ විද්‍යාල ශික්ෂකගෙන් හෝ මහාචාර්යාගෙන් හෝ විය යුතු ය.

(ඊ) ලබා ඇති වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(උ) සිංහලෙන්, දෙමළෙන් හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් වූ ඉහළම විභාගය දක්වෙන සහතික.

සැ. යු. :—

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතු ය.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ කල්හි ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් ගේ අයැදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. එතෙකුදු වුවත් තම ඉල්ලුම්පත්‍ර එසේ එව්වේ කවද දැයි ඉල්ලුම් පත්‍ර භාර

ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද (" බී " සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා පාවිච්චි කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධිත අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සාභාවේ ලේකම් තැනට හැර, මෙම දෙපාර්තමේන්තුවේ කිසිදු නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතු ය.

8. මෙම ගැසට් පත්‍රයේ I වන කොටස (II) වන ඡෙදයේ ආරම්භයේ සඳහන්, රාජ්‍ය සේවා තනතුරුවලට කෙරෙන පත්වීම් සම්බන්ධයෙන් අදල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද (" ඒ " සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතු ය. එවිට ඉල්ලුම්පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ මේ නියමය පිළිපදින්නා වූ ද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දන්වීමක් නොලැබෙන්නා වූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතු ය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරිය හොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969, අගෝස්තු මස 22 දා,
කොළඹ, තැ. පෙ. 500 දරණ
ගාලු මුවදෙර, මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

8–1436/2—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒබී. 64/එක්ස් 2135/69.

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### සමාජ විද්‍යාඥ තනතුර

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සමාජ විද්‍යාඥ තනතුර සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම් පත්—1969 සැප්තැම්බර් මස 12 වැනිද.

(බී) විදේශීය ඉල්ලුම් පත්—1959 සැප්තැම්බර් මස 19 වැනිද.

සටහන් :—

(i) මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක්ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9" × 4" ප්‍රමාණයට කුඩා නොවූද, නම ලිපිනය ලියන ලද්දවූද මුද්දර නොගැසුවාවූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලෙදී නැතිවූ බවට හෝ ප්‍රමාදවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයත් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝර්ම විදේශයන්හි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. තම ඉල්ලුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුලදී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :—**

(i) මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් රහිතය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දයක මුදල් ගෙවිය යුතුය. මෙම පත්වීම අවුරුදු 3ක කාලයක පරීක්ෂණයකට යටත්වය.

3. **මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය.**—වර්ෂයකට රු. 4,080—360 × 12, 480 × 10—13,200. (රු. 11,280 දී දෙවර්ෂයක නැවතීමක්ද රු. 8,880 හා රු. 11,760ට පෙර කාර්යක්ෂමතා කඩඉම්ද වෙයි.)

සටගන.—

(i) පශ්චාත් උපාධි සුදුසුකම් ඇති තැනැත්තෙකු පත්කරගනු ලැබුවහොත් ඔහු ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ රු. 5,160 ක ආරම්භක වාර්ෂික වැටුපේ තැබිය හැක.

(ii) පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව පිළිබඳව නියමිත පශ්චාත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් ලබා නොගතහොත් තෝරාගනු ලබන අපේක්ෂකයාට වර්ෂයකට රු. 8,880 ඉක්මවා යෑමට නොහැක.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශරීර සනීපයෙන් යුක්ත බව.

(බී) 1969.9.12 වැනි දිනට අවුරුදු 22ට නො අඩු බව, පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව පිළිබඳ පළමුවැනි හෝ දෙවැනි පෙල ගෞරව උපාධියක් දරන්නවුන් අවුරුදු 30ට නොවැඩි බව හා පිළිගත් පශ්චාත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් දරන්නවුන් අවුරුදු 35ට නොවැඩි බව. (රාජ්‍ය සේවයේ දැනටමත් ස්ථිර තනතුරු උසුලන්නවුන් කෙරෙහි මෙම උපරිම වයස් සීමාව බලනොපානු ඇත.)

(සී) පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව පිළිබඳ පළමුවැනි පෙළ හෝ දෙවැනි පෙළ ගෞරව උපාධියක්, හෝ සමාජ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ඇති බව.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලක්ම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදනම් විය යුතුය—

(ඒ) උප්පැන්න සහතිකය (සැ.යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතිස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) **චරිත සහතික දෙකක්.**—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචායර්වරයාගෙන් විය යුතුය.

(ඩී) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ.යු.—

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිනිය යුතුය.

(ii) ඉල්ලු අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළයුතුය. එතෙකුදු වුවත්තම ඉල්ලුම්පත්‍ර එසේ එවුවේ කවදදැයි ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙනසේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කල හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡෙදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සළකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම්පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුනු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිලිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුනු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද, ඉල්ලුම්පත්, භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුලත තම ඉල්ලුම්පත්‍රය ලැබුන බවට දන්වීමක් නොලැබෙන්නාවූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,

1969 අගෝස්තු මස 22 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදෙර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ.පෙ. 500.

8–1436/3—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

අංකය : ඊබී. 87/එක්ස්. 2137/69.

## අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

### කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ I වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුර හෝ එම තනතුරට පුහුණු වන්නකු තෝරා ගැනීම

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ '' හාඩි '' ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ I වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුර හෝ එම තනතුරට පුහුණු වන්නකු ලෙස පත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මඟින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1969 සැප්තැම්බර් මස 12 වැනි ද.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1969 සැප්තැම්බර් මස 19 වැනි ද.

සටහන.—(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද, නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9″ × 4″ ප්‍රමාණයට කුඩා නොවූද, තම ලිපිනය ලියන ලද්දවූ ද, මුද්දර නො ගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සළකා බැලිය හැකි නො වේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදු විය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකි ය. තම ඉලලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළත දී භාර දීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු :** ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැන ගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. තෝරා ගනු ලබන අයදුම්කරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ඔහුගේ පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට භාජනය කරනු ලැබේ.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය. වාර්ෂිකව රු. 8,880 — 480 — රු.13,200 (රු. 11,280 ක වැටුපෙහි අවුරුදු දෙකක නැවතීමක් සහ රු. 11,760 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක්)

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(ආ) 1969.9.12 වැනිද තමන්ගේ වයස අවුරුදු 30ට නො අඩු හා අවුරුදු 45ට නො වැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(ඉ) පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ I වැනි හෝ II වැනි පෙළ ගෞරව උපාධියක් ලබා තිබීම ; සහ

(ඊ) කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ පිළිගත් පශ්චාත් උපාධියක් හෝ එම්. එස්. සී. හෝ පී. එච්. ඩී. උපාධිය ලබා තිබීම.

සහ

(උ) රජයේ ආයතනයක හෝ සංස්ථාවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක හෝ අවුරුදු 5 ක ඉගැන්වීමේ හා/හෝ ප්‍රායෝගික පළපුරුද්ද.

සහ

(ඌ) සිංහලෙන් ඉගැන්වීමට පුළුවන්වීම හෝ පත්වීමේ දින සිට අවුරුදු 3ක කාලයක් ඇතුළතදී සිංහල භාෂාවේ ප්‍රවීණත්වයක් ලබා ගැනීම.

5. (i) **පුහුණුව සඳහා පිරිනැමෙන ශිෂ්‍යත්ව පිළිබඳ කොන්දේසි.**—4 වැනි ඡේදයේ සඳහන් සුදුසුකම් ඇති කිසිවෙකුගෙන් ඉල්ලුම් පත්‍ර නො ලැබුණහොත් හෝ තනතුර සඳහා සුදුසු අයදුම්කරුවෙකු නොසිටිය හොත් පුහුණුවන්නකු පත් කර ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයගේ ඉල්ලුම් පත්‍ර සැළකිල්ලට භාජනය කරනු ලැබේ.

(අ) වයස් සීමාවන් 1969.9.12 දිනට වයස අවුරුදු 28ට නො අඩු අවුරුදු 40 ට නො වැඩි විය යුතුය. (මෙම වයස් සීමාවන් සියලුම අයදුම් කරුවන්ට එකසේ බලපායි.)

සහ

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ I වැනි හෝ II වැනි පෙළ ගෞරව උපාධියක් ලබා තිබීම.

(ඉ) රජයේ ආයතනයක හෝ සංස්ථාවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක හෝ අවුරුදු 5 ක ඉගැන්වීමේ හා/හෝ ප්‍රායෝගික පළපුරුද්ද.

(ඊ) විශිෂ්ඨ චරිතයක් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බවත් ය.

(ii) තෝරාගනු ලබන අපේක්ෂකයාට පිටරට ගොස් පුහුණුවක් ලබන ලෙස නියම කරන්නට ඉඩ තිබේ. එසේ පුහුණුවන කාලය තුළ සුදුසු අන්දමේ දීමනාවක් ඔහුට ගෙවනු ලැබේ.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයා පිටරට ගොස් පුහුණුවක් ලැබිය යුතු යයි නියම කළහොත් ඔහු ලංකාණ්ඩුව සමඟ ගිවිසුමකට බැඳිය යුතු වන්නේය. එම ගිවිසුම යටතේ පොරොන්දු විය යුතු වෙනත් දේවල් අතර ඔහු පහත සඳහන් පොරොන්දුවලට ද බැඳිය යුතු වේ. එනම්,

(අ) නියමිත අභ්‍යාස පාඨමාලාව අවංක ලෙස සහ උත්සාහවන්තව හදාරා සතුටුදායක අන්දමින් නිම කිරීමට සහ එසේ නිම කිරීමෙන් පසු නියමිත කාල පරිච්ඡේදයක් තුළ ලංකාණ්ඩුවේ සේවය කළ යුතු යයි කියා සිටියහොත් (කාල පරිච්ඡේදය නියම කිරීම ලංකාණ්ඩුව විසින් කෙරෙනු ඇත.) එසේ සේවය කිරීමට ද,

(ආ) ගිවිසුමේ රෙගුලාසි සහ කොන්දේසි පිළිපැදීමට තමා අපොහොසත් වුවහොත් ලංකාණ්ඩුව විසින් සහ/හෝ ශිෂ්‍යත්ව ප්‍රදාන ඒජන්සිය විසින් පුහුණු කිරීමේ මූළු කාර්යය වෙනුවෙන් කරන්නට යෙදුන සියලුම වියහියදම් (එනම් වැටුප් දීමනා, යාන ගාස්තු සහ වෙනත් ගාස්තු ආදිය) ලංකාණ්ඩුවට ආපසු ගෙවීමට ද සිදුවෙයි.

(iv) තෝරා ගනු ලබන අපේක්ෂකයා කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි හෝ එම්. එස්. සී. හෝ පී. එච්. ඩී. උපාධිය ලබා ගත යුතුය.

6. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විස යුතුය.

(අ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතිස්ම සහතික භාරගනු නො ලැබේ.)

(ආ) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඉ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයා ගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඊ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික,

(උ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය. (ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නො හැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

7. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින්ම තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමඟ තමන්ට එවන ලද ('' ආ '' සලකුණ දරණ) මුද්‍රිත තැපැල්පත මේ සඳහා භාවිත කළ හැකිය.

8. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

9. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ II ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍යසේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

10. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමඟ තම තමන්ට නිකුත් කරන ලද ('' අ '' සලකුණ දරණ) මුද්‍රිත තැපැල්පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නො පිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුනු බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 අගෝස්තු මස 22 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදෙර මහ ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය,
තැ. පෙ. 500.

8–1436/4—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

## කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තීය අභ්‍යාස මධ්‍යස්ථානවල උපදේශක තනතුරු

පහත දක්වෙන වෘත්තීන් සම්බන්ධයෙන් උපදේශක තනතුරු සඳහා මෙහි පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගත් අයදුම් පත් 1969 සැප්තැම්බර් 12 වැනි දිනට හෝ එදිනට පෙර ලැබෙන පරිද්දෙන් කොළඹ, තරුණ බෞද්ධ සමිති ගොඩනැගිල්ලේ 3 මහලේ, කම්කරු කොමසාරිස් වෙත එවිය යුතුය :—

1. යන්ත්‍ර ශිල්පය
2. පැස්සීම

**2. වේතනය.**—සියලු දීමනාවන් ඇතුලුව මසකට රු. 400 සිට රු. 450 දක්වා වූ ගාස්තුවකි.

**සටහන.**—ගෙවන නියම ගාස්තුවේ ප්‍රමාණය, තෝරා ගනු ලබන අයදුම් කරුවන්ගේ සුදුසුකම්, පලපුරුද්ද හා ප්‍රවීණත්වය අනුව තීරණය කෙරේ.

**3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—පත්වීම, කම්කරු කොම සාරිස්වරයා විසින් නියම කරනු ලබන පරිදි පළමුවෙන්ම නියමිත කාල පරිච්ඡේදයකට කොන්ත්‍රාත්තු පදනමක් මත වේ.

පසුව අවශ්‍ය වුවහොත් කොන්ත්‍රාත්තුවේ කාලය දීර්ඝ කිරීමට ඉඩ ඇත.

**4. සේවා කොන්දේසි.**—(1) තෝරා ගනු ලබන අයදුම්කරුවන් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත් විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධි විධානයන් ක්‍රියාවට නැගීම පිණිස ද, සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කෙරෙන හෝ යම් යම් ව්‍යවස්ථාවන්ට අනුකූලව ක්‍රියා කල යුතුය.

(2) තෝරා ගනු ලැබූ අයදුම්කරුවන් මුදලින් රු. 1,000 ක් බැගින් ඇප තැබිය යුතුය. තෝරා ගනු ලැබූ උපදේශකයින් ස්වල්ප දෙනෙකු ඔවුන්ගේ අදල වෘත්තීන් පිළිබඳව තවදුරටත් පුහුණු කිරීම සඳහා ඉන්දියාවට හෝ වෙනයම් රටකට යැවීමට ඉඩ තිබේ.

**5. වයස් සීමාව.**—වයස අවුරුදු 25 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (රජයේ සේවයේ යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බල පාන්නේ නැත.)

6. අයදුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුයි :—

(I) අධ්‍යාපනික—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ දෙකකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් හයකින් වත් ලබා ගන්නා ලද අධ්‍යාපන පොදු සහතිකය (සාමාන්‍ය පෙල), හෝ,

(ආ) එයට සමාන හෝ උසස් සහතිකයක්, හා

(II) කාර්මික—

(අ) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ අවසාන සහතිකය, හෝ

(ආ) ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ කාර්මික අභ්‍යාස ආයතනයේ ඩිප්ලෝමා සහතිකය, හෝ

(ඉ) ලංකා කාර්මික විද්‍යාලයේ වෘත්තීය පුහුණු ගුරුවරුන්ගේ අවසාන සහතිකය, හෝ

(ඊ) ඊට සමාන හෝ උසස් සහතිකයක් සමඟ අදල වෘත්තීය සම්බන්ධයෙන් පස් අවුරුදු ප්‍රායෝගික පලපුරුද්දක්.

**සටහන.**—අයදුම්කරුවන් තෝරාගනු ලබන්නේ වෘත්තීය පරීක්ෂණයකින් හා ඉගැන්වීම පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකින් පසුවය.

7. රජයේ සේවයේ දැනටමත් යෙදී සිටින අයදුම්කරුවන් තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉල්ලුම් පත් එවිය යුතුය. අයදුම් කරුවන් මේ තනතුරු සඳහා තෝරා ගනු ලැබුව හොත් කම්කරු දෙපාර්තමේන්තුවේ සේවය සඳහා මුදා හරින බවට දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නිර්දේශ කරනු ලබන අයදුම්කරුවන් පමණක් සැලකිල්ලට භාජන වේ.

8. අයදුම්කරුවන් විසින් තම ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පත්වල පිටපත් (මුල් පිටපත් නොව) යාකොට එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක් ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතිකය හෝ බව්තීස්ම සහතිකය භාර ගනු නොලැබේ.)

(ආ) (I) ලබා ඇති උසස්ම අධ්‍යාපන පිළිබඳ සහතික. (II) කාර්මික අධ්‍යාපන පිළිබඳ සහතික.

(ඇ) මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක් (දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් මෙම සහතික ඉදිරිපත් කිරීම අනවශ්‍යය).

අයදුම්කරුවන් විසින් සම්මුඛ පරීක්ෂණයේදී සහතික පත්වල මුල් පිටපත් ඉදිරිපත් කල යුතුය. සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනය හා වේලාව පසුව දන්වනු ලැබේ.

ටී. ආර්. ආර්. විජේවික්‍රම,
කම්කරු කොමසාරිස්.

### ආදර්ශ අයදුම්පත්‍ර ආකෘතිය

## කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තීය අභ්‍යාස මධ්‍යස්ථානවල උපදේශක තනතුර, යන්ත්‍ර ශිල්පය/පැස්සීම

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)
2. ලිපිනය :————.
3. 1969.10.12 දිනට නිවැරදි වයස :————.
අවුරුදු :————, මාස :————, දින :————.
උපන් දිනය :————.
4. උපන් ස්ථානය :————.
(අ) ඉල්ලුම්කරුගේ :————.
(ආ) ඉල්ලුම්කරුගේ පියාගේ :————.
5. ජාතිය :————.
6. අධ්‍යාපන සුදුසුකම් :————.
(සහතික පිටපත් අමුණා එවිය යුතුයි.)
7. උපදෙස් දීමට හැකි ද යන වග :————.
(අ) සිංහලෙන් :————.
(ආ) දෙමළෙන් :————.
(ඇ) ඉංග්‍රීසියෙන් :————.
8. කාර්මික සුදුසුකම් :————.
(සහතික පිටපත් අමුණා එවිය යුතුයි.)
9. වෘත්තීය පිළිබඳව ඇති පුරුද්ද විස්තර සහිතව :————.
(සහතිකවල පිටපත් සමඟ අමුණා එවිය යුතුයි.)
10. සහතික දෙනු ලැබූ අයගේ නම :————.
11. තව තොරතුරු කිසිත් වේ නම් එය :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(අයදුම්කරු එක් වෘත්තියට වඩා අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම් ඒ එක් එක් වෘත්තීන් සඳහා වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.) (නොගැලපෙන වචන කපා හරින්න.)

8–1437—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

වරාය කොමිෂන් සභා දෙපාර්තමේන්තුවෙහි II පන්තියේ සැලසුම්කරු තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා එවන අයදුම්පත් මෙහි පහත සඳහන් ආකෘතියට අනුව සම්පූර්ණකොට 1969.9.20 වැනි දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන්නට එවිය යුතුයි.

**2. සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—(i) ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතවන II පන්තියේ සැලසුම්කරු තනතුරුවලට පත්කර ගනු ලබන අය වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු අතර තාවකාලික තනතුරු සඳහා පත්කර ගනු ලබන අය රජයේ අර්ථසාධක අරමුදලට දායක විය යුතු ය.

(ii) තෝරා පත්කර ගනු ලබන අයදුම්කරුවන් කෙටි දැනුම් දීමකින් තනතුර භාර ගැනීමට සූදානමින් සිටිය යුතුය.

**3. වැටුප් ක්‍රමය.**—වාර්ෂික වැටුප රුපියල් 1,260—21 × 120—රු. 3,780

**4. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ම පහත සඳහන් දේ සම්බන්ධයෙන් සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(i) වැඩි සැලකිලි ලැබෙන වයස් සීමාව වන අවුරුදු 45 නොඉක්මවා තිබීම.

(ii) යහපත් චරිතයකින් හා හොඳ ශාරීරික සෞඛ්‍ය තත්ත්වයකින් යුතු බව.

(iii) **අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්.**—(අ) ආධුනිකත්වය (ඒ ඒ අයට අදාල වන පරිදි අවුරුදු 1 හෝ 2 ක්) සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබිය යුතු අතර, ආධුනික සැලසුම්කරුවකු ලෙස දෙපාර්තමේන්තුවට බැඳුණු පසුව, දෙවසරක පුහුණුවක් ලබා අවසාන පරීක්ෂණයෙන් සමර්ථ වී සිටීම.

නැතහොත්

(ආ) ගණිතය විෂයයක් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළත්ව විෂයයන් හයකින්, දෙවරකට නොවැඩි වාර ගනනකදී පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගයේ සාමාන්‍ය පෙළෙන් සාමාර්ථය සහ ඊට අතිරේකව පහත දක්වෙන සුදුසුකම් වලින් එකක් තිබිය යුතුය.

(අ) ලංකා කාර්මික විද්‍යාලයේ විවිධ ශ්‍රෙණිවල ත්‍රිවාර්ෂික සන්ධ්‍යා පන්ති අනුගමනය කර තිබීම සහ ප්‍රසිද්ධ ඉංජිනේරු සමාගමක් හෝ බලපත්‍ර ලත් (චාර්ටඩ්) ඉංජිනේරුවන් හෝ නිර්මාණ ශිල්පීන් හෝ යටතේ අවුරුදු 4 ක් අඛණ්ඩ ආධුනිකත්වයක සේවය කර තිබීම.

(මෙම සුදුසුකම් ඇති අයදුම්කරුවකු ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ වර්ෂයකට රු. 1,620 නොඉක්මවන වැටුප් පියවරක් මත පත් කිරීම සඳහා සලකා බලනු ඇත.) හෝ ;

(ආ) ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි කර්මාන්තය II කොටසේ විභාගයෙන් 1947 ට පෙර සමත්වී සැලසුම් කරුවකු වශයෙන් රජයේ දෙපාර්තමේන්තුවක හෝ ප්‍රසිද්ධ වෙළෙඳ සමාගමක හෝ දෙවර්ෂයකට වැඩි කාලි සීමාවක් සේවය කර තිබීම හෝ

(ඇ) ප්‍රසිද්ධ ඉංජිනේරු සමාගමක හෝ බලපත්‍ර ලත් (චාර්ටඩ්) ඉංජිනේරුවන් හෝ නිර්මාණ ශිල්පීන් හෝ යටතේ සැලසුම්කරුවකු වශයෙන් පස් වර්ෂයක් සේවය කර තිබීම.

5. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත්වලට පහත සඳහන් ලියකියවිලිවල පිටපත් යාකොට එවිය යුතුය.

(ඒ) උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සහතිකය.

(බී) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සහතික.

(සී) චරිත සහතික දෙකක්.

(ඩී) ලබා ඇති වෘත්තීය සහ කාර්මික සුදුසුකම්වල සහතික.

6. රජයේ සේවයේ නිලධාරීන්ගේ අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

7. අයදුම් පත්‍රය හා ඒ පිළිබඳ වූ වෙනත් ලියවිලි එවිය යුත්තේ වරාය කොමසාරිස්, කොළඹ වරාය කොමිෂන් සභාව, තැ. පෙ. 528, කොළඹ, කියා මිස මෙම දෙපාර්තමේන්තුවේ කිසියම නිලධාරියකුගේ පෞද්ගලික ලිපිනයට නොවේ.

8. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) වැනි ඡෙදයේ සඳහන් රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත් කිරීම් පිළිබඳ පොදු කොන්දේසිවල ඔබගේ අවධානය යොමු කෙරේ.

වරාය කොමසාරිස්

1969.8.1 දින,
කොළඹ වරාය කොමිෂමේදීය.

**අයදුම් පත් ආකෘතිය**

## කොළඹ වරාය කොමිෂන් සභාවේ II වැනි පන්තියේ සැලසුම්කරු තනතුර සඳහා අයදුම්පත්

1. සම්පූර්ණ නම :————.
2. ලියුම් ලැබෙන පිළිවෙල :————.
3. ජාතිය :————.
4. උපන් දිනය :————.
5. අධ්‍යාපනික සුදුසුකම් :————.
6. වෘත්තීය සුදුසුකම් :————.
7. පාසැලෙන් අස්වූදා සිට යෙදුන රැකියාවල (කාල ක්‍රමානුගත පිළිවෙලට) :————.
8. සුදුසුකම් ලැබුවේ නිවේදනයේ 4(iii) වැනි ඡෙදයේ මොන උප ශීර්ෂය යටතේද යන වග :————.
9. චරිත සහතික දුන් අයගේ නම් සහ තරාතිරම :————.

මෙම අයදුම් පතෙහි දක්වන ලද තොරතුරු සියල්ල සත්‍ය සහ නිවැරදි බව මම සහතික කරමි. මෙහි සඳහන් කිසිම කරුණක් අසත්‍ය හෝ වැරදි සහගත බැව් තෝරා ගැනීමට පෙර එළිදරව් වුවහොත්, මා මේ තනතුර සඳහා නොසුදුස්සෙකු වන බවත්, තෝරා ගැනීමෙන් පසුව එළිදරව් වුවහොත්, කිසිම වන්දියක් නොගෙවා වහාම සේවය නවත්වනු ලබන බවත් මම දනිමි. මා කිසි කලෙක සේවයෙන් පහකරනු ලැබ හෝ සේවය නතර කරනු ලැබ හෝ ආණ්ඩුවේ තනතුරක් මා විසින් අත්හැර ගොස් හෝ නොමැති බවත් උසාවියක් මගින් වරදකට අසුවී හෝ නොමැති බවත් තව දුරටත් ප්‍රකාශ කරමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :

8–1291—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව

### කාර්මික සහකාර තනතුර

භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්මික සහකාර තනතුර සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙම දැන්වීම අගට යොදා ඇති ආකෘති පත්‍රය අනුව පිළියෙල කළ අයදුම් පත්‍ර, 1969 සැප්තැම්බර් 26 දින හෝ ඊට පෙර කොළඹ 2, ශ්‍රී ජිනරතන පාරේ අංක 48 දරන ස්ථානයේ භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති සහ කොන්දේසි :**—තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. එහෙත්, පත්වීම ප්‍රථමයෙන්, තුන් අවුරුදු ආධුනික කාලසීමාවකට යටත්වනු ඇත.

3. **වැටුප් සහ දීමනා:**—තනතුරට අදාළ වැටුප් පරිමාණය රු. 3,180–120 බැගින් 6,180 බැගින් 8ක් සහ 240 බැගින් 6 කින් රු. 6,780 දක්වා වනු ඇත. රු. 4,080, රු. 4,800 සහ රු. 5,580ට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත.

තෝරාගත් අයදුම්කරුගේ සුදුසුකම් සහ පළපුරුද්ද අනුව, ඔහු වැටුප් පරිමාණයෙහි ඉහළ ස්ථානයක තැබීම සුදුසුයැයි පෙනී ගියහොත්, භාණ්ඩාගාරයෙන් විමසා එසේ කරනවා ඇත.

4. **අවශ්‍ය සුදුසුකම් :**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් සහ හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(ආ) පරම්පරාවෙන් හෝ ලියා පදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියකු බව,

(ඇ) 1969.9.26 වැනි දිනට වයස අවුරුදු 20 ට නොඅඩු බව සහ අවුරුදු 30ට නොවැඩි බව. (දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයගේ ඉල්ලුම්පත් වයස් සීමාවන් නොතකා සලකා බලනු ඇත.)

(ඈ) ශුද්ධ හෝ ව්‍යවහාරික ගණිතය හෝ ගණිතය සහ භෞතික විද්‍යාව හෝ රසායන විද්‍යාව විෂයයන් වශයෙන් ඇතිව පිළිගත් විශ්ව විද්‍යාලයයක, විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධිධාරියෙක් බව උපාධිය සඳහා විෂයයක් වශයෙන් භූ විද්‍යාවෙන් හෝ අදල විද්‍යාවන් පිළිබඳ රසායනාගාර සහ ක්‍ෂෙත්‍ර ක්‍රම පිළිබඳ පලපුරුද්ද ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ඉ) දෙපාර්තමේන්තුවේ පසලොස් වර්ෂයකට නොඅඩු සේවයක් ඇති භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුවේ ක්‍ෂෙත්‍ර සහකාරවරුන් ගෙන් හා රසායනාගාර සහකරුවන්ගේන් ද අයදුම්පත් භාරගනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයකුට සූදනම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) උපාධි හෝ උසස් ම අධ්‍යාපනික සහතිකය,

(ඇ) චරිත සහතික දෙකක්, මින් එකක් අධ්‍යපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික,

(ඉ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලසා බලනු නොලැබේ.

6. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ගේ ඉල්ලුම් පත්‍ර, එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නියමිත දිනට පෙර ලද බව හා ප්‍රමාදවීම ගැන පිළිගත හැකි කරුණු ඉදිරිපත් කරමින් එම ඉල්ලුම් පත්‍ර පිළිගන්නා මෙන් නිර්දේශ නොකළහොත් එවැනි ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

7. නියමිත දිනක සහ වේලාවක මෙම කාර්යාලයේදී පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකට අයදුම්කරුවන් පෙනී සිටීමක් අවශ්‍යවනු ඇත. මේ සඳහා ගමන් ගාස්තු කිසිවක් ගෙවනු නොලැබේ.

8. සියලුම අයදුම්පත්, භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂ වෙත හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ, II වන ඡෙදයේ ආරම්භයේ සඳහන්, රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරවනු ලැබේ.

එල්. ජේ. ඩී. ප්‍රනාන්දු,
භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂ.

භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව,
48, ශ්‍රී ජිනරතන පාර,
කොළඹ 2.

### ආදර්ශ අයදුම්පත

**භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව—කාර්මික සහකාර තනතුර**

1. සම්පූර්ණ නම : ————.
   (පැහැදිලි අකුරෙන්)
   (අ) පෙලපත් නාමය : ————.
   (ආ) වෙනත් නම් : ————.

2. ලිපිනය : ————.
   (ලිපිනයෙහි වෙනස්වීමක් වුවහොත් ඒ බව වහාම දන්විය යුතුය)

3. (අ) උපන් දිනය : ————.
   (ආ) 1969.9.26 දිනට වයස : ————.

4. ජාතිය : ————.
   (පරම්පරාවෙන්ද නැතහොත් ලියාපදිංචි වීමෙන්ද යන බව සඳහන් කරන්න. ඔබ ලියා පදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියෙක් නම්, ඔබට නිකුත් කර ඇති පුරවැසි සහතිකයේ යොමු අංකය සහ දිනය සඳහන් කරන්න.)

5. උපන් ස්ථාන : ————.
   (අ) අයදුම්කරුගේ : ————.
   (ආ) පියාගේ : ————.
   (ඇ) පියපස මුත්තාගේ : ————.
   (ඈ) පියපස මී මුත්තාගේ : ————.
   (අයදුම්කරු ලංකාවේ උපන්නේ නම්, (අ) වලට අමතරව, (ආ) හෝ (ඇ) සහ (ඈ) සම්පූර්ණ කළ යුතුය. ඔහු/ඇ උපන්නේ ලංකාවේ නොවේ නම්, (අ) වලට අමතරව, (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) සම්පූර්ණ කළ යුතුය.

6. අයදුම්කරු විවාහකද, අවිවාහකද හෝ වැන්දඹු ද : ————.

7. ඉගෙනීම ලත් පාසැල් හා විද්‍යාල, ඒවාට ඇතුල් වූ සහ අස්වූ දිනයන්ද සහිතව:
   (අ) පොදු අධ්‍යපනය සඳහා : ————.
   (ආ) වෘත්තීය අධ්‍යාපනය සඳහා : ————.

8. ක්‍රීඩා ආදියෙන් ලබා ඇති විශිෂ්ටතාවයක් වෙතොත් ඒ පිළිබඳ විස්තර : ————.

9. (අ) ඔබ මුදල් කරදරවලින් නිදහස් අයෙක්ද? එසේ නැත්නම් ඔබේ වගකීම් හෙවත් බැදීම් ප්‍රමාණය කොපමණද? : ————.
   (අ) සාපරාධි වරදක් වෙනුවෙන් ඔබට විරුද්ධව උසාවියක නඩු පවරා තිබේද? එසේ නම්, දින සහ නඩු අංක දක්වමින් සම්පූර්ණ විස්තර සඳහන් කරන්න : ————.

10. අධ්‍යාපනික, වෘත්තීය සහ කාර්මික සුදුසුකම් : ————.
    (දිනයන්, පංති වෙතොත් ඒවාද, පෙනී සිටි විෂයයන් සහ ආයතන වල නම්ද සහිත කාර්මික සුදුසුකම් ආදිය පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.)

11. දැන් රක්ෂාව සහ කලින් දැරූ තනතුරු කිසිවක් වෙතොත් : ————

12. විශේෂ අයිතිවාසිකම්, සුදුසුකම්, පුහුණුවීම් හෝ පළපුරුදුකම් : ————.

13. ඔබ ගැන තොරතුරු දැන ගැනීමට හැකි තිදෙනෙකුගේ තනතුර සහිත නම්, ලිපිනයන් : ————.
    1.
    2.
    3.

මෙම අයදුම්පතෙහි දැක්වෙන සියළුම තොරතුරු සත්‍ය සහ නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කර ඇති යම් කරුණක් වැරදි හෝ අසත්‍ය බව හෝ පත්වීම් දෙන්නට පෙර එළිදරව් වුවහොත් මා නුසුදුස්සකු වීමටත් ඒ බව පත්වීම ලැබුවාට පසු එළිදරව් වුවහොත් කිසිම වන්දි ගෙවීමක් නැතිව මා නිලයෙන් අස් කිරීමටත් යටත්වන බවද, මම දනිමි.

.....................................
අයදුම්කරුගේ අත්සන.

ස්ථානය : ————.

දිනය : ————.

8–1377—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### සිංහල මාධ්‍ය පාසල්වලට උපාධි අපේක්ෂක විද්‍යා ගුරු භවතුන් බඳවා ගැනීම

රජයේ පාසල්වල විද්‍යා උප ගුරු තනතුරු සඳහා ගැහැණු සහ පිරිමි උපාධි අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පුරප්පාඩු ඇත්තේ සිංහල මාධ්‍යයෙන් ඉගැන්වීම කරන පාසැල් වලය.

2. මෙහි පහත දැක්වෙන ආදර්ශ පෝර්මය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 1969 සැප්තැම්බර් මස 20 වැනි දින හෝ ඊට ප්‍රථම කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, පාඨශාලා පරිපාලන ශාඛාවේ ස්ථිර ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය. ලියුම් කවරයේ වම් කෙළවරේ "විද්‍යා උපාධි අපේක්ෂක" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය මෙසේය :

රු. 1,344—15/72, 3 × 120—3,000

ජීවන වියදම් දීමනාව, විශේෂ ජීවනාධාර දීමනාව හා ගෙවල් කුලී දීමනාව නියමිත ප්‍රමාණයන්ට අනුව ගෙවනු ලැබේ.

4. **සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :

(i) 1969.9.20 වැනි දිනට වයස අවුරුදු 18 ට අඩු හෝ 45 ට වැඩි හෝ නොවන බව (මෙම උපරිම වයස් සීමාව දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුක්තව සිටින්නන් සඳහා අදාල නොවේ.)

(ii) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධි පරීක්ෂණයට පෙනී සිට ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින්නකු විය යුතුය.

(iii) යටත් පිරිසෙයින් පහත සඳහන් විෂයයන්ගෙන් දෙකක්වත් උපාධි පරීක්ෂණය සඳහා ගෙන තිබිය යුතුය :—

(අ) භෞතික විද්‍යාව
(ආ) රසායන විද්‍යාව
(ඉ) උද්භිද විද්‍යාව
(ඊ) සත්ව විද්‍යාව
(උ) ශුද්ධ ගණිතය
(ඌ) ව්‍යවහාර ගණිතය

(iv) සිංහල මාධ්‍යයෙන් අධ්‍යයන පොදු සහතික පත්‍රය සාමාන්‍ය පෙළ පන්තිවල ඉගැන්වීම කළ හැකි අය විය යුතුය. අඩු ගණනේ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී ප්‍රායෝගික සිංහලෙන් හෝ රජයේ සේවකයන් සඳහා වූ සිංහල ප්‍රවීනතා විභාගයේ (iv) වැනි ශ්‍රෙණියේ විභාගයෙන් හෝ සමත් අය විය යුතුය.

(v) විශිෂ්ඨ චරිත ශුද්ධියකින් යුක්ත බව.

(vi) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති බව හා ඊට සුදුසු ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත බව.

5. අයදුම්කරුවන් විසින් ස්වකීය ඉල්ලුම් පත්වලට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් ඇමිණිය යුතුය :

(අ) උප්පැන්නය ලියා පදිංචි කිරීමේ සහතිකය

සැ.යු.—බවුතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහය පරිදි නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ පිළිගනු නො ලැබේ.

(ආ) ලබාගත් උසස්ම ශාස්ත්‍රිය සුදුසුකම් පිළිබඳ සහතික පත්‍රය හා සිංහල භාෂාවෙන් සාමාර්ථය ලත් උසස්ම සහතික පත්‍රය.

(ඉ) චරිත සහතික දෙකක්, ඉන් එකක් තම ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගෙන් විය යුතුය.

6. **සේවයට භාර ගැනීමේ හා සේවා කොන්දේසි.**—(i) මෙම තනතුරු ගුරු විශ්‍රාම වැටුප් රෙගුලාසි යටතේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

(ii) මෙම තනතුරු වලට පත්වීම ලබන්නන් විසින් ගුරු විශ්‍රාම වැටුප් රෙගුලාසි යටතේ විශ්‍රාම වැටුපට දායක වීම අවශ්‍යය. පත්වීම ලබන පිරිමි අපේක්ෂකයන් විසින් ගුරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ද දායක විය යුතුය.

(iii) පත්වීම ලබන්නන් දැනටමත් ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත රජයේ සේවයේ නියුක්තව නොසිටිත් නම්, ඔවුන්ගේ පත්වීම් අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත් වේ. දැනටමත් ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත රජයේ සේවයේ නියුක්ත වූවන් අවුරුද්දක කාලයක් තනතුරෙහි වැඩ බැලීම අවශ්‍ය වේ.

(iv) පත්වීම සඳහා තෝරාගනු ලබන්නන්, දිවයිනේ කවර ප්‍රදේශයක හෝ සේවය කළ යුතුය.

(v) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන්ම වර්ෂ 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත්, දනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින්මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව පත්වීම් ලබන්නන් ක්‍රියා කළ යුතුය.

7. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු වේ.

8. අයදුම් පත් හා ඒ පිළිබඳ වෙනත් ලිපි ස්ථිර ලේකම් වෙත එවිය යුතු අතර මෙම අමාත්‍යාංශයේ වෙනයම් නිලධාරියෙකු නමට පෞද්ගලිකව නො එවිය යුතුය.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡෙදයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදල වන පොදු කොන්දේසි වෙත අවධානය යොමු කරවනු ලැබේ.

10. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් පිළිගනු නො ලැබේ. තැපැලේදී සිදු වන ප්‍රමාදයන් වෙතොත් එය මග හැරවීම සඳහා සිය අයදුම් පත් කල්වේලා ඇතිව ඉදිරිපත් කරන ලෙස අයදුම් කරුවන්ට දනුම් දෙනු ලැබේ.

ඩී. ජී. දයාරත්න,
ස්ථිර ලේකම් සහ අධ්‍යාපන අධ්‍යක්ෂ ජෙනරාල්.

පා.ප/12/320
1969 අගෝස්තු මස 16 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

## ආදර්ශ අයදුම්පත්‍රය

### උපාධි අපේක්ෂක විද්‍යා ගුරු පත්වීම්

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. ස්ත්‍රී පුරුෂ භාවය :————.
4. විවාහක අවිවාහක බව :————.
   (විවාහක නම් ස්වාමිපුරුෂයා/භාර්යාව රජයේ සේවකයෙක්ද/සේවිකාවක් ද) (විස්තර සඳහන් කරන්න.)
5. අයදුම්කරුගේ උපන් දිනය :————.
6. උපන් ස්ථානය :—
   (අ) අයදුම්කරු :————.
   (ආ) අයදුම්කරුගේ පියා :————.
   (ඉ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.
   (ඊ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තා :————.
7. ජාතිය :————.
   (ලාංකික වූයේ පරම්පරාවෙන් ද ලියා පදිංචි කිරීමෙන් ද)
8. අධ්‍යාපනික සුදුසුකම් :————.
   (i) උපාධි අපේක්ෂකයෙක් ද :————.
   (ii) උපාධියට ගන්නා ලද විෂයයන් :————.
   (iii) විශ්ව විද්‍යාලය :————.
   (iv) වර්ෂය :————.
9. සිංහල පිළිබඳ සුදුසුකම් :————.
10. වෘත්තීය සුදුසුකම් තිබේ නම් ඒ පිළිබඳ විස්තර :————.
11. කලින් සේවය :————.
12. (i) ගුරුවරයකු/වරියක වශයෙන් :
   (අ) ලියා පදිංචි කළ අංකය :————.
   (ආ) සේවා විස්තර :————.
   පාසලේ නම :————.
   ———— දින සිට ———— දින
   දක්වා දරූ තනතුරු :————.
   (ii) වෙනත් රජයේ සේවකයෙකු/සේවිකාවක වශයෙන් :
   දරූ තනතුරු :————.
   ———— දින සිට ———— දින දක්වා.
13. ගුරුවරයකු/වරියක හෝ රජයේ සේවකයකු/සේවිකාවක හෝ වශයෙන් සේවය අවසන්/අත්හිටුවීම/ඉල්ලා අස්වීම/නිදහස් කිරීමට හේතුව (සම්පූර්ණ විස්තර සඳහන් කළ යුතුය) :————.

ඉහත සඳහන් විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මා රජයේ සේවයෙන් පහ කරනු ලැබූවකු නොවන බවත්, රජයේ සේවය හැර ගිය අයකු ලෙස සලකා සේවය නතර කිරීමක් සිදු වී නැති බවත්, උත්පත්තියෙන්/ලියා පදිංචි කිරීමෙන් මා ලාංකිකයෙකු බවත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට මා සතුටු බවත්, මෙයින් සහතික කරමි. මෙම අයදුම් පත්‍රයෙහි දක්වෙන යම් කිසි කරුණක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ මා තෝරා ගැනීමට පෙර එළිදරව් වුවහොත් එයින් මා නුසුදුස්සකු වන බවත්, එම දෝෂය පත් කිරීමෙන් පසුව එළිදරව් වුවහොත් කිසිදු වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කරනු ලැබිය හැකි බවත්, මම පිළිගනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8–1303—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## ලංකා උසස් කාර්මික විද්‍යායතනය කටුබැද්ද, මොරටුව

### පූර්ණකාලීන පදනම මත අර්ධකාලීන (තාවකාලික) උපදේශක තනතුර

පහත සඳහන් විෂයයන් ඉගැන්වීම සඳහා පූර්ණකාලීන පදනම මත අර්ධකාලීන (තාවකාලික) උපදේශක තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ :—

(1) යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව
(2) විදුලි ඉංජිනේරු විද්‍යාව
(3) සිවිල් ඉංජිනේරු විද්‍යාව
(4) ගණිතය
(5) භෞතික විද්‍යාව

2. මෙම තනතුරු තාවකාලික වන අතර කෙටි කාලයකින් සේවය නතර කළ හැකිය. පහත දක්වෙන ආකෘතිය අනුව පිළියෙල කළ ඉල්ලුම් පත්‍ර 1969 සැප්තැම්බර් මස 15 වෙනි දිනට හෝ ඊට පෙර මොරටුව, කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ එවිය යුතුයි.

3. තෝරාගත් අයදුම්කරුවන්ට පහත දක්වෙන අන්දමට වැටුප් ගෙවනු ලැබේ :—

**යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව :**

(i) පහත සඳහන් සුදුසුකම් ලබා ඇති පූර්ණකාලීන පදනම මත අර්ධකාලීන (තාවකාලික) උපදේශකයින්ට රුපියල් 285ක ස්ථිර මාසික මූලික වැටුපක් සමග ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර දීමනා ගෙවනු ලැබේ :—
   (අ) ඉංජිනේරු උපාධි හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක ඒ හා බී කොටස්, හෝ
   (ආ) ඉංජිනේරු උපාධියක I වන කොටස හෝ ලංකා කාර්මික විද්‍යාලයේ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා සහතිකය හෝ
   (ඇ) සමාන හෝ උසස් සුදුසුකම්.

(ii) පහත සඳහන් සුදුසුකම් ලබා ඇති පූර්ණකාලීන පදනම මත අර්ධකාලීන (තාවකාලික) උපදේශකයින්ට රු. 215ක ස්ථිර මාසික මූලික වැටුපක් සමග ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර දීමනා ගෙවනු ලැබේ :—
   (අ) ලංකා කාර්මික විද්‍යාලයේ (යාන්ත්‍රික ඉංජිනේරු) සන්ධ්‍යා සහතිකය, හෝ
   (ආ) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ (විදුලි සහ යාන්ත්‍රික) සහතිකය හෝ සමාන සුදුසුකම්.

**විදුලි ඉංජිනේරු විද්‍යාව :**

(i) පහත සඳහන් සුදුසුකම් ලබා ඇති පූර්ණකාලීන පදනම මත අර්ධකාලීන (තාවකාලික) උපදේශකයින්ට රුපියල් 285ක ස්ථිර මාසික මූලික වැටුපක් සමග ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර දීමනා ගෙවනු ලැබේ :—
   (අ) ඉංජිනේරු උපාධි හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක ඒ හා බී කොටස්, හෝ
   (ආ) ඉංජිනේරු උපාධියක I වන කොටස හෝ ලංකා කාර්මික විද්‍යාලයේ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා සහතිකය හෝ
   (ඇ) සමාන හෝ උසස් සුදුසුකම්.

(ii) පහත සඳහන් සුදුසුකම් ලබා ඇති පූර්ණකාලීන පදනම මත අර්ධකාලීන (තාවකාලික) උපදේශකයින්ට රු. 215ක ස්ථිර මාසික මූලික වැටුපක් සමග ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර දීමනා ගෙවනු ලැබේ :—
   (අ) ලංකා කාර්මික විද්‍යාල දෙපාර්තමේන්තුවේ (විදුලි සහ ඉංජිනේරු) සන්ධ්‍යා සහතිකය, හෝ
   (ආ) ලංකා කාර්මික විද්‍යාල දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ (විදුලි සහ යාන්ත්‍රික) සහතිකය හෝ සමාන සුදුසුකම්.

**සිවිල් ඉංජිනේරු විද්‍යාව :**

(i) පහත සඳහන් සුදුසුකම් ලබා ඇති පූර්ණකාලීන පදනම මත අර්ධ කාලීන (තාවකාලික) උපදේශකයින්ට රුපියල් 285ක ස්ථිර මාසික මූලික වැටුපක් සමග ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ගෙවනු ලැබේ :—

(අ) ඉංජිනේරු උපාධි හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක ඒ හා බී කොටස්, හෝ

(ආ) ඉංජිනේරු උපාධියක I වන කොටස හෝ ලංකා කාර්මික විද්‍යාලයේ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා සහතිකය හෝ

(ඇ) සමාන හෝ උසස් සුදුසුකම්.

(ii) පහත සඳහන් සුදුසුකම් ලබා ඇති පූර්ණකාලීන පදනම මත අර්ධ කාලීන (තාවකාලික) උපදේශකයින්ට රුපියල් 215ක ස්ථිර මාසික මූලික වැටුපක් සමග ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර දීමනා ගෙවනු ලැබේ :—

(අ) ලංකා කාර්මික විද්‍යාල දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු විද්‍යාව සඳහා සන්ධ්‍යා සහතිකය, හෝ

(ආ) ලංකා කාර්මික විද්‍යාල දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ (සිවිල්) සහතිකය, හෝ

(ඇ) ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ කාර්මික අභ්‍යාස ආයතනයේ ඩිප්ලෝමා සහතිකය, හෝ

(ඉ) සමාන හෝ උසස් සුදුසුකම්.

**ගණිතය :**

පහත සඳහන් සුදුසුකම් ලබා ඇති පූර්ණකාලීන පදනම මත අර්ධකාලීන (තාවකාලික) උපදේශකයින්ට රුපියල් 285ක ස්ථිර මාසික මූලික වැටුපක් සමග ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර දීමනා ගෙවනු ලැබේ :—

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ගණිතය විෂයයක් ලෙස සාමාර්ථය ලබා ඇති උපාධි සහතිකය.

**භෞතික විද්‍යාව :**

පහත සඳහන් සුදුසුකම් ලබා ඇති පූර්ණකාලීන පදනම මත අර්ධකාලීන (තාවකාලික) උපදේශකයින්ට රුපියල් 285ක ස්ථිර මාසික මූලික වැටුපක් සමග ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර දීමනා ගෙවනු ලැබේ :—

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් භෞතික විද්‍යාව විෂයයක් ලෙස සාමාර්ථය ලබා ඇති උපාධි සහතිකය.

4. තෝරාගත් අයදුම්කරුවන් සාමාන්‍යයෙන් මෙම විද්‍යායතනයේ වැඩ කෙරෙන සම්පූර්ණ කාලය තුළ (පෙ.ව. 8.30 සිට ප.ව. 4.30 දක්වා) රාජකාරියෙහි නියුක්ත විය යුතුය. සවස පන්තිවල වැඩ කිරීම ගැන සුදුසු පිළිවෙලක් යොදු ගත හැකිය.

5. සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් මෙම විෂයයන් ඉගැන්වීමේ සෑහෙන පළපුරුද්දක් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. අයදුම්කරුවන් තමා අපේක්ෂා කෙරෙන විෂයය කුමක්ද යන වග අයදුම් පත්‍රයේ ඉහළින් සඳහන් කිරීම අත්‍යාවශ්‍ය වූවකි. සහතිකවල මුල් පිටපත් ඉල්ලුම් පත්‍රය සමග එවිය යුතු නොවේ.

එල්. එච්. සුමනදස,
ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ අධ්‍යක්ෂ.

1969 අගෝස්තු මස 22 වෙනි දින,
මොරටුව, කටුබැද්දේ,
ලංකා උසස් කාර්මික විද්‍යායතනයේදීය.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**————ශිල්පය පිළිබඳ පූර්ණකාලීන පදනම මත අර්ධකාලීන (තාවකාලික) උපදේශක තනතුර**

1. සම්පූර්ණ නම :————.
2. නිත්‍ය ලිපිනය :————.
3. උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණන්න) :————
4. ජාතිය :
   (1) ලාංකිකයෙකු වනුයේ පරම්පරාවෙන්ද, ලියාපදිංචි වීමෙන්ද යන වග :————.
5. අධ්‍යාපන සුදුසුකම් (පිටපත් අමුණන්න) :————.
6. වෘත්තීය/කාර්මික සුදුසුකම් (පිටපත් අමුණන්න) :————.
7. විවාහක, අවිවාහක බව :————.
8. මෙතෙක් කරන ලද රැකියාවල් :————.
9. ඉගැන්වීමේ පළපුරුද්ද :————.
10. වෙනත් දැක්විය හැකි විස්තර :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8–1443—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව (පරිවර්තන අංශය)

### 1 වැනි ශ්‍රෙණියේ (දෙමළ) පරිවර්තක තනතුරු

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ (පරිවර්තන අංශයේ) 1 වෙනි ශ්‍රෙණියේ දෙමළ පරිවර්තක තනතුරු තුනක් සඳහා ඉල්ලුම් පත්‍ර මෙයින් කැඳවනු ලැබේ. මේ සඳහා එවන ඉල්ලුම් පත්‍ර පහත සඳහන් ආකෘතිය අනුව සම්පූර්ණ කොට 1969.9.30 වෙනි දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතු ය.

2. **සේවයට බඳවා ගැනීමේ ක්‍රමය.**—අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට සහ තේරීම් මණ්ඩලයක් මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසු ව තෝරා ගනු ලැබේ.

3. **සේවයට බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි.**—විශ්‍රාම වැටුප් සහිත වූ ද ස්ථිර වූ ද මේ තනතුර සඳහා පත් කරනු ලබන අයදුම්කරු තුන් අවුරුදු කාලයක ආධුනිකත්වයකට යටත් විය යුතු ය.

4. **කාර්යය.**—ඉංග්‍රීසියෙන් සකස් කරන ලද නීති ප්‍රඥප්ති, පනත් කෙටුම්පත් ආදිය දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම මේ නිලධාරියා වෙත පවරනු ලැබේ.

5. **වැටුප් ක්‍රමය.**—මේ තනතුරට අදළ වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 3,900 න් පටන් ගෙන රු. 180 බැගින් වූ වාර්ෂික වැඩිවීම් අටක් හා රු. 240 බැගින් වූ වාර්ෂික වැඩිවීම් පහකින් ද පසු රු. 6,540 තෙක් වැඩි වේ. රු. 5,340ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත.

6. **වයස් සීමාව.**—1969.9.30 වැනි දිනට තමාගේ වයස අවුරුදු 21ට නො අඩු සහ අවුරුදු 45ට නො වැඩි විය යුතු ය. රජයේ සේවයේ දැනට නියුක්ත ව සිටින්නන්ට මෙම වයස් සීමාව බල නොපානු ඇත.

7. **අධ්‍යාපන හා අනිකුත් සුදුසුකම්.**— අයදුම්කරුවන්,

(අ) විශිෂ්ය චරිතයෙන් හා මනා ශරීර ශක්තියෙන් යුක්ත විය යුතුය.

(ආ) (i) දෙමළ විෂයයක් වශයෙන් ඇති පිළිගත් විශ්ව විද්‍යාල උපාධිධාරීන් විය යුතුය. (සටහන : දෙමළ පිළිබඳ විශේෂ උපාධියක් ඇති අයට සහ දෙමළ ඉංග්‍රීසියට පරිවර්තනය කිරීමේ පළපුරුද්දක් ඇති අයට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ): නැතහොත්

(ii) විශේෂයෙන්ම දෙමළ ප්‍රවීණතාවයක් ඇතිව සිටින අධිනීතිඥයකු හෝ නීතිඥයකු විය යුතු ය; නැතහොත්

(iii) දෙමළ පරිවර්තකයෙකු වශයෙන් අවුරුදු දහයක පළපුරුද්දක් ඇති අය විය යුතු ය.

8. පහත සඳහන් ලේඛනවලින් කිසිවක් හෝ ඒ සියල්ල ම ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ඇත :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බව්තීස්ම සහතික හෝ ආධාර ලබන පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්ය සඳහා නිකුත් කරනු ලැබූ උප්පැන්න සහතික භාර ගනු නො ලැබේ).

(ආ) උපාධි සහතික හෝ උසස් ම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක් (රජයේ සේවයෙහි යෙදී සිටින අයදුම්කරුවන් විසින් මේ සහතික පත්‍ර එවිය යුතු නොවේ).

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික; හා

(ඉ) දෙමළ විෂයයෙන් සමර්ථ වූ උසස් ම විභාගය පිළිබඳ සහතිකය.

9. රජයේ සේවයෙහි නියුක්ත අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. ස්ථිර පත්වීම් ලත් නිලධාරීන් ඉල්ලුම් පත්‍ර එවන විට, මේ පත්වීම් සඳහා ඔවුන් තෝරා ගනු ලැබුවහොත් ඔවුන් දරන තනතුරුවලින් නිදහස් කළ හැකි බව දැක්වෙන පිටසන් සහිත ඉල්ලුම් පත්‍ර පමණක් සලකා බලනු ලැබේ. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් වෙත නියමිත දිනයෙහි හෝ ඊට පෙර ලැබුණු බවත්, ප්‍රමාද වීම ගැන පිළිගතහැකි කරුණු ඇති බවත් දන්වා පිළිගත යුතු යයි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නිර්දේශ නො කරතහොත්, සලකා බලනු නොලැබේ.

10. ඉල්ලුම් පත්‍ර හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම මේ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොව, නීති කෙටුම්පත් සම්පාදක, තැ. පෙ. 554, අළුත්කඩේ, කොළඹ 12. යනුවෙන් එවිය යුතු ය.

11. **සේවයේ කොන්දේසි.**—රාජ්‍ය භාෂා පනතේ අවශ්‍යතාවන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයෙකු වන්නේ නම්—

(අ) (i) ඔහු/ඇය 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන වලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහා

දනට පවත්නා සියළු ම නීතිරීති හා ව්‍යවස්ථාවලටත්, මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් එකඟ ව කටයුතු කිරීමේ කොන්දේසිය පිළිගත යුතුයි.

(ii) ආධුනික කාලසීමාව ඇතුළත ඔහු/ඇය විසින් සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතු ය.

(iii) ආධුනික කාලසීමාව අවසානයේ දී තනතුරෙහි ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර, නියමිත කාලසීමාවක් ඇතුළත දී නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීම ද මත රඳා පවතිනු ඇත. නියමිත කාලසීමා තුළ දී මෙම ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීමට අපොහොසත්වීම, වැටුප් වැඩිවීම් අත්හිටවනු ලැබීමට හේතුවනු ඇති අතර, නියමිත කාලසීමාව ඉක්මවා තවත් සමසක් ඇතුළත දී පරීක්ෂණයකින් සමත් නො වූවහොත් එම "අත්හිටුවීම" නතර කිරීමකට පරිවර්තනය කර, පරීක්ෂණය සමත් වන තෙක් එම නතර කිරීම ක්‍රියාත්මක ව තබනු ඇත.

(iv) ආධුනික කාලසීමාව අවසාන වීමට පෙර, සිංහල භාෂා විෂයයෙන් නියමිත තත්ත්වයේ ප්‍රවීණතාවක් ලබා ගෙන නො තිබුණ හොත්, අංක 120 හා 121 දරන පාලන රෙගුලාසිවල විධිවිධාන බල පවත්වනු ඇත. "(ඉහත දැක්වෙන අංක (ii) (iii) (!v) දරන කොන්දේසි දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් බඳවා ගනු ලබන්නට අදළ වෙයි.)"

(ආ) මේ ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II) වෙනි ඡේදයේ ආරම්භයෙහි පළ කර තිබෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් පිළිබඳ පොදු කොන්දේසි කෙරෙහි අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ව්‍යවස්ථාවලට, මුදල් රෙගුලාසිවලට, කාර්ය විධාන සංග්‍රහයේ රෙගුලාසිවලට, දෙපාර්තමේන්තු නියෝගවලට සහ රජය විසින් කලින් කල නිකුත් කෙරෙන වෙනයම් රෙගුලාසි හෝ නියෝගවලට ද යටත් විය යුතු ය.

13. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු ඇත. ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට දින 7 ක් ඇතුළත එවැනි දන්වීමක් යම් අයදුම්කරුවකුට නො ලැබුණහොත්, ඔහු/ඇය විසින් ඒ බව නීති කෙටුම්පත් සම්පාදක වෙත වහාම දන්වා එවිය යුතු ය. මේ නියමය අනුව ක්‍රියා කිරීම පැහැර හරින අයදුම්කරුවකු වෙතොත්, තම ඉල්ලුම් පත්‍රය සලකා බලන ලෙස ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට/ඇයට අහිමි වනු ඇත.

පර්සි ද සිල්වා,
නීති කෙටුම්පත් සම්පාදක.

1969 අගෝස්තු මස 17 වන දින
නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 554, අළුත්කඩේ—කොළඹ 12.

## ඉල්ලුම් පත් ආකෘතිය

### නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ භාෂා පරිවර්තක තනතුර (දෙමළ) I වෙනි ශ්‍රේණිය

1. සම්පූර්ණ නම : ————.
   (අ) පෙළපත් නම (පැහැදිලි අකුරෙන්) : ————.
   (ආ) වෙනත් නම් : ————.
2. ලිපිනය : ————.
3. උපන් දිනය හා 1969.9.30 වෙනි දිනට වයස : ————.
4. ජාතිය හා ජාතිකත්වය ලැබූ පිළිවෙල : ————.
5. උපන් ස්ථානය : ————.
   (අ) අයදුම්කරුගේ : ————.
   (ආ) අයදුම්කරුගේ පියාගේ : ————.
   (ඇ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තාගේ : ————.
   (ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තාගේ : ————.
6. අයදුම්කරු විවාහක ද අවිවාහක ද හෝ වැන්දඹු භාවය : ————.
7. ඉගෙනීම ලත් පාසැල් හා විද්‍යාල (පොදු අධ්‍යාපනය සඳහා ඒවාට ඇතුළත් වූ හා අස්වූ දිනයන් සමග) : ————.
8. අධ්‍යාපන සුදුසුකම් : ————.
9. දෙමළ භාෂාවෙන් ලැබූ උසස්ම සුදුසුකම් : ————.
10. පරිවර්තන සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ දැනීම ද, කෘතහස්ත භාවය ද පිළිබඳ සම්පූර්ණ විස්තර : ————.
11. පාසැලෙන් හෝ විද්‍යාලයෙන් අස් වූ පසු කළ රක්ෂා පිළිබඳ විස්තර සහ ඒවාට පත් වූ හා ඉන් අස් වූ දින : ————.
12. විශේෂ අයිතිවාසිකම්, සුදුසුකම්, පුහුණුවීම් හෝ පළපුරුද්ද : ————
13. අයදුම්කරු සම්බන්ධයෙන් වගකිය හැකි, ඥාතීන් නොවන, දෙදෙනෙකුගේ නම් හා තරාතිරම් : මේ අය පෞද්ගලික ජීවිතයෙහි අයදුම්කරු හොඳින් දන්නා අය විය යුතු ය. (රාජ්‍ය සේවයෙහි නියුක්ත අයදුම්කරුවන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍ය ය.) : ————.
14. වෙනත් කරුණු : ————.

මේ ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සඳහන් කොට තිබෙන සියළු විස්තර සත්‍යවූද නිවැරදි වූද කරුණු බව මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ ඔප්පු වුවහොත්, තෝරා ගැනීමට පෙර වරද අනාවරණය වී නම් නුසුදුස්සකු වීමට ද, තෝරා ගැනීමෙන් පසු වරද අනාවරණය වී නම් කිසි වන්දි ගෙවීමක් නොමැතිව සේවයෙන් පහ කරනු ලැබීමටද මා යටත් වන බව මම දනිමි.

..............................
අයදුම්කරුගේ අත්සන.

දිනය : ————.

8–1335—69.8. 29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

## රාජකීය ලංකා ගුවන් හමුදාව

### රාජකීය ලංකා ගුවන් හමුදාවේ (සාමාන්‍ය රාජකාරි අංශයේ) සේවය සඳහා නියමු ආධුනිකත්ව

1. රාජකීය ලංකා ගුවන් හමුදාවේ නියමුවන් වශයෙන් පුහුණු කිරීම සඳහා ඇති ආධුනිකත්ව කුනක් සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

2. තෝරාගන්නා ලද අය, ඔවුන්ගේ පුහුණුවීමේ කාලසීමාවෙන් පසු, රාජකීය ලංකා ගුවන් හමුදාවේ අධිකාරි නොලැබූ නියමු නිලධාරීන් වශයෙන් පත් කරනු ඇත.

3. අපේක්ෂකයින්ට ඔවුන්ගේ පියසර පුහුණුව ලංකාවේදීම ලැබෙනු ඇත. නමුත් සේවයේ අවශ්‍යතා අනුව ඔවුන් කලින් කලට විශේෂ පාඨමාලාවන් හැදෑරීම සඳහා පිට රටවල් වෙත යවනවා ඇත.

4. නියමුවන් වශයෙන් පුහුණු කිරීමට තෝරා ගැනීමේදී—

(අ) අපේක්ෂකයින් 2 වෙනි පෙල 'ඩී' ගණයේ ගුවන් භටයින් වශයෙන් අවුරුදු 12 ක නිත්‍ය සේවයක් සඳහා රාජකීය ලංකා ගුවන් හමුදාවට බැඳිය යුතුයි.

(ආ) පුහුණුව ලබන්නන්, ගුවන් හමුදාධිපති තුමා සමග සාකච්ඡා කිරීමෙන් පසුව රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර ඇමති විසින් තීරණය කරණු ලබන පරිදි ලංකාවේ පිහිටි ස්ථානවල පුහුණුව ලබා ගත යුතුයි.

(ඇ) පුහුණුව ලබන කාලය තුලදී ආධුනිකයන්ගේ තත්වය ගුවන් භටයින්ගේ තත්වයයි. ඔවුන් ගුවන් හමුද නීතියට යටත්විය යුතුයි.

(ඈ) පුහුණුව ලබන අයෙකුට, ඔහු උසස් පියසර පුහුණුව ආරම්භ කරන අවස්ථාව දක්වා අවුරුද්දකට රුපියල් 930 බැගින් ගෙවනු ලැබේ. ඉන්පසු ඔහු අධිකාරී නොලැබූ නිලධාරියෙකු වශයෙන් පත්කර ගන්නා තුරු ඔහුට පුහුණුව ලබන ආධුනිකයෙකු වශයෙන් මසකට රුපියල් 225 ක් ගෙවනු ලැබේ. ඔහුට දිනාකට ශත 50 ගණනේ සෑම දිනකටම පියසර උපදේශාත්මක ගෙවීමක්ද ගෙවනු ලැබේ. කෙසේ හෝ ආධුනිකයන් පුහුණුව ලබමින් අඩුම වශයෙන් පැය 30 ක කාලයක් ගුවන් යානා පදවා එයින් ද පැය 20 ක කාලයක් ජෙට් ගුවන් යානා පදවා ඇති අයට දිනකට රුපියල් 2 ක පියසර උපදේශාත්මක ගෙවීමත් ගෙවනු ලැබේ.

(ඉ) පුහුණුව ලබන කාලය තුලදී පුහුණුව ලබන ආධුනිකයන්ට ගුවන් හමුදාවේ නේවාසිකාගාරයක නැවතීම සඳහා ඉඩකඩ සලස්වන අතර, ඔවුන්ට රජයේ වියදමින් ආහාර, නිල ඇඳුම් සහ වෛද්‍යාධාර සපයනු ලැබේ. නිවාඩු පිට සිටින කාලය තුළදී ඔවුන්ට ජීවන වියදම් දීමනා, විශේෂ ජීවනාධාර දීමනාවද ගෙවනු ලැබේ.

(ඊ) (i) පුහුණුව ලබන කාලය තුලදී යම්කිසි පුහුණුව ලබන ආධුනිකයෙක් සිය කැමැත්තෙන් ඔහුගේ ආධුනිකත්වය අවසන් කරන්නේනම්, එවැනි ආධුනිකයෙක් වෙනුවෙන් එම අවස්ථාව දක්වා ලංකා රජයට දැරීමට සියළුම වියදම් ඔහුගේ දෙමව්පියන් විසින් හෝ භාරකරු විසින් ලංකා රජයට ගෙවිය යුතුයි.

(ii) ආධුනිකයෙක් පුහුණුව ලබන ඕනෑම අවස්ථාවක නරක හැසිරීම නිසා හෝ වුවමනානම් ඔහුට වලකාගත හැකි වෙනත් දුර්වලකම් හේතු කොටගෙන නිලධාරීන් විසින් ඔහු නුසුදුසු කෙනෙක් ලෙස පැමිණිලිද කරනු ලැබුව හොත් ඔහු වෙනුවෙන් ලංකා රජයට දැරීමට සිදුවූ සියළුම වියදම් ඔහුගේ දෙමාපියන් විසින් හෝ භාරකරු විසින් ලංකා රජයට ගෙවිය යුතුයි.

(iii) පුහුණුව ලබන කාලය තුලදී පුහුණුව ලබන ආධුනිකයෙක් ඔහුගේ උත්සාහයෙන් වලකාගත නොහැකි හේතූන් නිසා තවදුරටත් පියසර පුහුණුව සඳහා නුසුදුසුයයි වැටහී ගියහොත් එවැනි ආධුනිකයෙකුට සේවයෙන් අස්වීමට හෝ ඔහු මුලදී බඳවා ගත් අයුරු ගුවන් භටයෙකු ලෙස සේවය කිරීමට සිය කැමැත්ත අනුව තීරණය කරගත හැක. එවැනි ආධුනිකයෙක් ඔහුට සුදුසුයයි හැඟෙන වෘත්තීයකට නැවත යොදවා ගන්නවා ඇත.

(උ) ඉහත සඳහන් උප ඡේද (ඊ) (i) සහ (ii) සම්බන්ධයෙන් මෙම නිවේදනයේ 'අ' පරිශිෂ්ඨයේ ඇති අයදුම් පතේ 22 වන තීරයේ සඳහන් කර ඇති පරිදි ප්‍රකාශන දෙමව්පියන් හෝ භාරකරුවන් විසින්

අත්සන් කර ඒවා අයදුම් පත සමග ඉදිරිපත් කළ යුතුයි. තෝරා ගන්නා ලද අපේක්ෂකයින්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් මෙහි සඳහන් කර ඇති අන්දමට මෙම අපේක්ෂකයින් පත් කර ගැනීමට ප්‍රථම ලංකා රජය සමග ඇප ඔප්පුවකට බැඳිය යුතුයි.

(උ) පුහුණුව සම්පූර්ණ කිරීමෙන් පසුව ආධුනිකයන් අධිකාරී නොලැබූ නියමු නිලධාරීන් ලෙස පත්කර ගනු ලැබේ. අධිකාරී නොලැබූ නියමු නිලධාරීන් සැරයන් කෙනෙක් වශයෙන් අවුරුදු හතරක සතුටුදයක සේවයකින් පසුව බලපංති සැරයන් තනතුරටද, බලපංති සැරයන් කෙනෙක් වශයෙන් අවුරුදු හතරක සතුටුදයක සේවයෙන් පසු බලලත් නියමු නිලධාරී තනතුරටද උසස් කිරීමට සුදුස්සෝ වෙති. අධිකාරී නොලත් නියමු නිලධාරී වශයෙන් සේවය කරන කාලය තුලදී, කිසියම් අවස්ථාවක ඔවුන් අධිකාරී ලැබූ නිලධාරීන් වශයෙන් පත් කිරීමට සලකා බලනු ලැබේ.

**වැටුප් හා දීමනා—රා.ලං.ගු.හ.**

5. රාජකීය ලංකා ගුවන් හමුදාවේ සේවා කොන්දේසි අංක 10,240 හා 1951 අප්‍රේල් මස 27 වෙනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලකර ඇති රාජකීය ලංකා ගුවන් හමුද (නිත්‍ය සහ නිත්‍ය උප සේවා) ව්‍යවස්ථාවල සහ කලින් කල කර ඇති සංශෝධනවල අඩංගු අන්දමටය. වැටුප් හා දීමනා 1961 රාජකීය ලංකා ගුවන් හමුද වැටුප් සංග්‍රහය පරිදි මෙ පහත සඳහන් අන්දමටය.

| | වැටුප් මසකට රු. ශ. | පියසර වැටුප් දිනකට රු. ශ. |
|---|---|---|
| (අ) අධිකාරී නොලැබූ නිලධාරීන් | | |
| සැරයන් කෙනෙකුට ... | 247 50 ... | 8 0 |
| බලපංති සැරයන් කෙනෙකුට ... | 285 0 ... | 8 89 |
| බලලත් නිලධාරී කෙනෙකුට ... | 325 0 ... | 9 77 |

(ආ) **වෙනත් දීමනා**—රජයේ ප්‍රමානානුකූලව ජීවන වියදම් දීමනාව, විශේෂ ජීවනාධාර දීමනාව සහ ගෙවල් කුලී දීමනාව ගෙවනු ලැබේ.

6. මෙරට දේශ ගුණය සහ සීත දේශ ගුණය සඳහා (අවශ්‍ය පරිදි) නිල ඇඳුම් සපයනු ලැබේ.

**සේවා කොන්දේසි :**

7. 1962 සැප්තැම්බර මස 14 වෙනි දින අංක 13,301 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර වරින්වර සංශෝධනය කරනු ලැබූ 1962 ගුවන් හමුද විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප් පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. විශ්‍රාම වැටුප් සඳහා රජය යටතේ කරන ලද ස්ථිර විශ්‍රාම වැටුප් සහිත සේවය හෝ ලංකා ආරක්ෂක සේවයන්හි කලින් සේවය කර තිබේ නම් එම සේවය හෝ බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මංඩලයේ රටක වෙනත් හමුද සේවයක යෙදී සිටියේ නම් එම සේවය ගණන් ගනු ලැබේ.

8. නේවාසිකාගාරයේ පදිංචි වී සිටින අවිවාහක අධිකාරී නොලැබූ නිලධාරීන්ට ගෘහ භාණ්ඩ සහිත නිවාස පහසුකම් හා ඔවුන්ගේ ආහාර ද සපයනු ලැබේ.

9. විවාහ වූ අධිකාරී නොලැබූ නිලධාරීන්ට (හැකිනම්) ගෘහ භාණ්ඩ සහිත විවාහක නිවෙස් සපයනු ලැබේ.

10. රාජකාරිය සඳහා හෝ පුහුණුව සඳහා ලෝකයේ කවර පෙදෙසක ඕනෑම අවස්ථාවක සේවය කිරීමට ගුවන් හමුද සේවයේ නියුක්තවූවන් බැඳී ඇත.

11. රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස, විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම පිණිස, මේ දක්වා පනවා ඇති හෝ ඉදිරි කාලයේ පනවන ව්‍යවස්ථාවන් තෝරගත් අපේක්ෂක යින් විසින් පිළිපැදිය යුතුයි.

12. සන්නද්ධ සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල සඳහා තම දයක මුදල වශයෙන් තම මූලික වැටුපෙන් සියයට 4ක මුදලක් අඩුකර ගැනීම සඳහා තම කැමැත්ත ප්‍රකාශ කරන ලියවිල්ලක් තෝරා ගනු ලබන අපේක්ෂකයා විසින් දිය යුත්තේය.

**අවශ්‍ය මූලික සුදුසු කම් :**

13. පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

(අ) **ජාතිය**—අයදුම්කරුවන් ලාංකික විය යුතුයි. එනම් :

(i) උප්පත්තියෙන් ලංකාවේ පුරවැසියන් වීම, හෝ

(ii) ලියා පදිංචි කරනු ලැබීමෙන් පුරවසියෙක් වීම.

(ආ) **වයස**—අයදුම්කරුවන් 1969 සැප්තැම්බර් මස 17 දිනට වයස අවුරුදු 18ට අඩු හෝ අවුරුදු 24ට වැඩි නොවිය යුතුයි.

(ඇ) **අධ්‍යාපන සුදුසුකම්**—අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගය (සාමාන්‍ය) ඉංග්‍රීසි, සිංහල, භෞතික විද්‍යාව සහ ගණිතය සහිතව විෂයන් හයකින් සමත් වී සිටින අපේක්ෂකයින්ගෙන් ලැබෙන ඉල්ලුම් පත් ගැන සලකා බලනු ලැබේ. නමුත් විෂයයන්ගෙන් උසස් සමර්ථය ලබා සිටින අය හෝ වඩා උසස් අධ්‍යාපන සුදුසුකම් ඇති අය ගැන වඩා සැලකිල්ල දක්වනු ලැබේ. (අපේක්ෂකයින්, අවසාන තෝරාගැනීමට ප්‍රථමයෙන් නිලධාරී ස්වභාවය මැනීමේ සහ සාමාන්‍ය දැනීමේ පරීක්ෂණයකින්ද සමත් විය යුතුයි).

(ඈ) **සිවිල් තත්වය**—අපේක්ෂකයින් අවිවාහක විය යුතුයි. (පුහුණු වන කාලය තුල හෝ පුහුණුව සම්පූර්ණ කර අවුරුදු දෙකක් ගත වන තෙක් කිසිම ආධුනිකයෙකුට විවාහ වීමට අවසර දෙනු නොලැබේ.)

(ඉ) **සෞඛ්‍ය තත්වය**—අපේක්ෂකයින්ගේ සෞඛ්‍ය තත්වය ගුවන් හමුදවට ගැලපෙන පරිදි විය යුතුයි. (අඩු වශයෙන් උස අඩි 5යි අඟල් 5ක්, පපුව අඟල් 34ක් හා බර රාත්තල් 105 ද විය යුතුයි.)

(ඊ) **ගුවන් යානා පැදවීමේ හැකියාව මැණීමේ පරීක්ෂණය**—අවසාන තෝරාගැනීමට පෙර අපේක්ෂකයින් ගුවන් යානා පැදවීමේ හැකියාව මැණීමේ පරීක්ෂණය සඳහා ගුවනෝදීම පවත්වන පරීක්ෂණ වලට ඉදිරිපත් විය යුතුයි.

**අයදුම් කරුවන්ට උපදෙස්**

14. නියමුවන් වශයෙන් පුහුණුවීම සඳහා අයදුම් පත් මෙම නිවේදනයේ 'අ' පරිශිෂ්ඨයේ ඇති ආකෘති පත්‍රයේ පිටපතක ලියා ගුවන් හමුදාධිපතිතුමා, තැ.පෙ. 594, කොළඹ කියා 1969 සැප්තැම්බර් මස 17 දින දහවල් 12 ට පෙර එවිය යුතුයි. අයදුම් පත බහාලන කවරයේ 'අයදුම්පත නියමු ආධුනිකත්වය' යනුවෙන් සඳහන් කළ යුතුයි.

15. අයදුම් පත සමග චරිත සහතික දෙකක්ද එවිය යුතුයි. ඉන් එකක් අයදුම්කරු පුද්ගලිකව පසුගිය අවුරුද්ද තුල හඳුනන වයස්ගත වගකිය යුතු පුද්ගලයකුගෙන් විය යුතුයි. අනික් සහතිකය අයදුම්කරු අවසාන වරට ගිය පාසැලේ ප්‍රධානාචාර්ය තුමාගෙන් විය යුතුයි. එහි අයදුම්කරු විසින් ලබාගෙන ඇති අධ්‍යාපන සහ ක්‍රීඩා පිළිබඳ සුදුසුකම් සඳහන් කළ යුතුයි.

16. යම් අයදුම්කරුවෙකුගේ ඉල්ලුම් පතෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහහන්ව ඇති බව අනාවරනය වීනම්, 1949, 41 දරණ ගුවන් හමුද පනත යටතේ විනයනුකූලව ක්‍රියා කිරීමට සිදුවනු ලැබේ.

17. අයදුම්කරුවන් අයදුම් පත සමග පහත සඳහන් ලියකියවිලි වල පිටපත් අමුනා එවිය යුතුයි.

(i) උප්පැන්න සහතිකය (බෞතිස්ම් සහතික පත්‍ර හෝ අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහය යටතේ නිකුත් කරණ ලද සහතික පත්‍ර බාරගනු නො ලැබේ.)

(ii) ලබාගත් උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික පත්‍රය ;

(iii) ඉහත සඳහන් 15 වෙනි ඡෙදයේ සඳහන් කර ඇති සහතික පත්‍ර.

**සැලකිය යුතුයි.**—මෙම සහතික පත්‍රවල සහ චරිත සහතික පත්‍රවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුත්තේ අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයනට කැඳවූවහොත් ඒ අවස්ථාවේ පමණි.

18. යම්කිසි අපේක්ෂකයකු ගැන නිර්දේශ කිරීමට යමෙකුට අවශ්‍ය නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට චරිත සහතිකයක් දීමෙනි. යම්කිසි අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයන් ලබාගැනීමට හෝ බලපෑමකට උත්සාහ කරණු ලැබුවහොත් ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

19. අයදුම් පත ලැබීමෙන් පසුව යම්කිසි අපේක්ෂකයකුට 12 වන ඡෙදයේ සඳහන් අවශ්‍ය සුදුසුකම් ඇති බව පෙනී ගොස් ඔහු සුදුසුයයි සලකනු ලබන්නේනම්, ඔහුට, ඔහුගේ වියදමින් නියමිත දිනයක සහ වේලාවක දන්වන ලබන තැනකට පැමිණ තේරීමේ මංඩලයක් ඉදිරිපිට පෙනී සිටීමට උපදෙස් දෙනවා ඇත.

20. මෙම මංඩලය මගින් තෝරාගන්නා අයට, අධ්‍යාපන පිළිබඳ පරීක්ෂණයක් (ඉහත සඳහන් 13 වන ඡෙදය බලන්න) වෛද්‍ය පරීක්ෂණයක්, ගුවන් යානා පැදවීමේ හැකියාව මැණීමේ පරීක්ෂණයක් සහ අපේක්ෂකයාගේ සුදුසුකම් වටහා ගැනීම සඳහා පිළිවෙල කරණ වෙනත් ඕනෑම පරීක්ෂණ යකට පෙනී සිටීමට සිදුවෙනවා ඇත. මෙම පරීක්ෂන ආදිය සම්බන්ධයෙන් අපේක්ෂකයින්ට දැරීමට සිදුවන වියදම් රජයෙන් ගෙවනු නොලැබේ.

21. අවසාන තේරීම කරනු ලබන්නේ, රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශය විසින් පත්කරනු ලබන මංඩලයක් මගිනි. තෝරාගන්නා ලද අපේක්ෂකයින්ට ඒ බව මංඩලය විසින් දන්වනු ලැබේ. ඉන්පසු වහාම ආධුනිකත්වය සම්බන්ධයෙන් ඇප ඔප්පුවට සහ ගිවිසුමට අත්සන් තැබිය යුතුයි.

**අයදුම් පත් පිරවීම**

22. මෙම නිවේදනයේ 'අ' පරිශිෂ්ඨයේ ඇති අයදුම් පත සාමාන්‍ය ෆුල්ස්කැප් ප්‍රමාණයේ කඩදසියට පිටපත් කරගත යුතුයි. අයදුම්පතේ ඇති සියළුම කොටු පැහැදිලි අකුරෙන් ලියා හෝ යතුරු ලියනයෙන් ලියා පුරවා තිබිය යුතුයි. කිසිම කොටුවක් හිස්ව හෝ කටුගා නොතිබිය යුතුයි. අයදුම් පතේ උඩ කෙලවරේ කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා අඟල් දෙකක හිස් තීරයක් ඉඩ තැබිය යුතුයි. අයදුම් පතේ පිටු සියල්ලම එකට අමුණා අයදුම් පත උඩින් තබා එකට එවිය යුතුයි.

ඊ. ආර්. අමරසේකර,
එයාර් වයිස් මාෂල්,
ගුවන් හමුදාධිපති තැන.

69.8.13,
ගුවන් හමුද මූලස්ථානය,
තැ.පෙ. 594,
කොළඹ.

## 'අ' පරිශිෂ්ඨය

### රාජකීය ලංකා ගුවන් හමුදාවේ නියමුවන් වශයෙන් පුහුණුවීම සඳහා අයදුම් පත

පුද්ගලික විස්තර :

1. අගට යොදන නම :————. සෙසු නම් :————.
2. දැනට ලිපිනය :————.
   (i) දුරකථන අංකය :————.
   (ii) නුදුරු දුම්රිය පල :————.
   (iii) නුදුරු පොලිස් ස්ථානය :————.
   (iv) විදුලි පණිවුඩ කාර්යාලය :————.
3. ස්ථිර පදිංචිය :————.
   එහි වාසය කල කාලය :————.
4. විවාහක තත්වය :————.
5. මව්පිය විස්තර :—
   (අ) පියාගේ නම :————.
   උපන් ස්ථානය :————.
   උත්පත්තියෙන් පුරවැසි භාවය :————.
   (ආ) මවගේ නම :————.
   උපන් ස්ථානය :————.
   උත්පත්තියෙන් පුරවැසි භාවය :————.
6. පාසැල් හා විශ්ව විද්‍යාලය වරියාව :————.
   (අ) පාසැල් ආදියෙහි නම :————.
   ඇතුලත්වූ දිනය :————.
   අස්වූ දිනය :————.
7. පාසැලෙන් අස්වූ පසු නියුක්තවූ රක්ෂාවල් (මෙය සම්පූර්ණ වාර්තාවක් විය යුතුයි)
   (අ) ස්වාමියාගේ නම :————.
   (ආ) රක්ෂාවේ ස්වභාවය :————.
   රක්ෂාව කල කාලසීමාව :————.
8. මීට පෙර යුෂ්මතා සන්නද්ධ සේවයක යම් පුරප්පාඩුවක් සඳහා සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටියේද ? එසේ නම් ඉල්ලුම් කල තනතුරේ විස්තර හා දිනයද දක්වන්න :————.
9. යම්කිසි වරදක් සම්බන්ධයෙන් සිවිල් උසාවියක හෝ හමුද අධිකරණයක් මගින් යුෂ්මතා වරදකරු බව තීරණයක් කර තිබේද ? උත්තරය 'ඔව්' නම් විස්තර දක්වන්න.
10. ඔබට ඇති අධ්‍යාපන සුදුසුකම් (විෂයයන් සමග විස්තර දක්වන්න):————
11. උපන් දිනය :————.
    උපන් ස්ථානය :————.
    උප්පත්තියේදී පුරවැසිභාවය :————.
    දැනට පුරවැසි භාවය :————.
12. (අ) උස : අඩි :————. අඟල් :————.
    (ආ) පපුව : අඟල් :————. බර : රාත්තල් :————.
13. අතිරේක සුදුසුකම් :————.
    (පහත සඳහන් කොටුවල සඳහන් අයිතිවාසිකම් සනාථ කිරීමට අයදුම්කරුවන්ට පුළුවන් විය යුතුයි)
14. ක්‍රීඩාවන්හි ඇති දක්ෂතා පිළිබඳ විස්තර :————.
    (කණ්ඩායම් හා තරඟ විස්තර දක්වා දිනයන් හා ලබාගත් දක්ෂතාවයන් සඳහන් කරන්න)
15. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ලබාගත් වෙනත් දක්ෂකම් :————
16. නිත්‍ය හෝ ස්වේච්ඡා සන්නද්ධ සේවයක හෝ බාලදක්ෂ ආයතනයක කල සේවය :————.
17. විශේෂ සුදුසුකම් යමක් ඇත්නම් එහි විස්තර :————.
18. මෙම අයදුම් පතට අමුනා ඇති සහතික පත්‍ර (පිටපත් පමණක් එවිය යුතුයි) :————.
19. චරිත සහතික පත් ලබාගත් අයගේ නම් :————.
20. මෙම අයදුම් පතට අමුනා ඇති වෙනත් දේ :————.
21. අයදුම්කරු විසින් අත්සන් තැබිය යුතු ප්‍රකාශය :

ඉහත් සඳහන් ප්‍රශ්න වලට මා විසින් සපයා ඇති පිළිතුරු මාගේ දැනීමේ සහ විශ්වාසයේ හැටියට සත්‍ය බව දිවුරා ප්‍රකාශ කරමි. ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලකර තිබෙන පරිදි ලංකා ගුවන් හමුදාවේ ආධුනිකත්වය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් ඇති ක්‍රියා මාර්ගය සහ ඔවුන්ට බලපාන නීති රීති ද මා විසින් කියවා තේරුම් ගන්නා ලදි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනම :————.

22. අයදුම්කරුගේ මව්පිය/භාරකරු විසින් අත්සන් තැබිය යුතු ප්‍රකාශය :—

(අ) රාජකීය ලංකා ගුවන් හමුදාවේ ආධුනිකත්වය සඳහා ඉල්ලුම් කර ඇත්තාවූ ද, ඉහත සඳහන් අයදුම්පතේ 21 වෙනි කොටුවේ ඇති ප්‍රකාශයට අත්සන් තබා ඇත්තාවූද,........................නමැති අයගේ මව්පිය/භාරකරු මම වෙමි.

(ආ) ඉහත නම සඳහන් අයදුම්කරු පුහුණුවීමේ පාඨමාලාවක් හැදෑරීම සඳහා තෝරාගනු ලැබුවහොත් මෙහි පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් වගකීම මම භාරගන්නා බව මෙයින් දන්වමි:—

(i) පුහුණුව ලබන කාලය තුලදී ඉහත නම් සඳහන් අයදුම්කරු සිය කැමැත්තෙන් ඉල්ලා අස්වූ විට, එම අයදුම්කරු වෙනුවෙන් එම අවස්ථාව දක්වා ලංකා රජයට දැරීමට සිදුවූ සියළුම වියදම් ලංකා රජයට ආපසු ගෙවීමට ;

(ii) ඉහත නම සඳහන් අයදුම්කරු (නරක හැසිරීම නිසා හෝ වුවමනා නම් ඔහුට වලකාගත හැකි වෙනත් දුර්වල කම් හේතුකොට ගෙන) සේවයේ තබා ගැනීමට නුසුදුසු යයි නිලධාරීන් විසින් පැමිණිලි කරනු ලැබූ විට, ඔහු වෙනුවෙන් ලංකා රජයට දැරීමට සිදුවූ සියළුම වියදම් ආපසු ලංකා රජයට ගෙවීමට.

————,
මව්පිය හෝ භාරකරුගේ අත්සන.

දිනම :————.

නම :————.
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :————.

සාක්ෂිකරුගේ අත්සන :————.

නම :————.
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :————.

8—1473—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### කෑගල්ල කණිෂ්ඨ කාර්මික ආයතනයේ බාහිර උපදේශක තනතුරු 1969–70

කෑගල්ල කණිෂ්ඨ කාර්මික ආයතනයේ පහත සඳහන් විෂයයන් උගැන්වීම සඳහා බාහිර උපදේශක වරුන් වශයෙන් බඳවා ගැනීමට ඊට සුදුසුකම් ඇති අයගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘතියේ ප්‍රකාර සකස් කරගත් ඉල්ලුම් පත්‍ර 1969 සැප්තැම්බර් මස 12 වෙනි දින දහවල් 12.00ට පෙර කෑගල්ල කණිෂ්ඨ කාර්මික ආයතනයේ ආයතනාධිපති වෙත ලැබෙන සේ ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

බාහිර උපදේශක ඇබෑර්තු අදාල විෂයයන් :—

| | |
|---|---|
| (1) සිංහල භාෂාව | සිංහල මාධ්‍යය |
| (2) වාණිජ අංක ගණිතය | |
| (3) වාණිජ භූගෝලය | |
| (4) ගණන් තැබීම | |
| (5) ඉංග්‍රීසි භාෂාව | |

2. බාහිර උපදේශක වරුන්ට ගෙවන ගාස්තු ඔවුන්ගේ සුදුසුකම් පළ පුරුද්ද හා උගන්වන පංතිය අනුව පැයකට රු. 5.00 සිට රු. 10.00 දක්වා වෙනස් වනු ඇත.

3. මෙම තනතුර අවුරුද්දේ ඔක්තෝබර් මස පටන්ගෙන ඊළඟ අවුරුද්දේ අගෝස්තු මස අවසන් වේ. අවශ්‍යතාවයේ හැටියට ඊට කලින් වුවද අවසන් කෙරෙනු ඇත.

4. අංක 1 සිට 4 දක්වා ඇති විෂයයන් සඳහා පංති පැවැත්වෙනුයේ සවස 5.00 සිට 7.15 දක්වා වන අතර, අංක 5 දරණ විෂයය සඳහා පංති උදේ 8.30 සිට සවස 4.30 දක්වා පැවැත්වේ. මේ කාලසීමාවන් ඇතුළත උගැන්වීමට හැකි අයගෙන් ලැබෙන ඉල්ලුම් පත්‍ර පමණක් සලකා බලනු ලැබේ.

5. බාහිර උපදේශක වරුන් විසින් මධ්‍ය වාර්ෂික පරීක්ෂණයන්හි සහ අභ්‍යන්තර නොවූ පරීක්ෂණයන් නොයෙදවන වර්ෂ අවසාන පරීක්ෂණයන්හි දී අමතර ගාස්තුවක් නොමැතිව තමන්ගේ පංතිවල ශිෂ්‍යයන් පරීක්ෂා කළ යුතුය.

6. රාජ්‍ය සේවාවෙහි යෙදී සිටින ඉල්ලුම් කරුවන් තම ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ තම තමන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මගිනි. එවැනි ඉල්ලුම් පත්‍ර නියම කරන ලද දිනට පෙර කෑගල්ල

කණිෂ්ඨ කාර්මික ආයතනයේ ආයතනයාධිපති වෙත නොලැබුනහොත් ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ ප්‍රතික්ෂේප කරනු නොලබන්නේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ඒවා කළට වේලාවට ලැබී, පිළිගතහැකි හේතුවක් නිසා ප්‍රමාද වුවොත් පමණි.

7. අයදුම් පත්‍රයේ තමා අපේක්ෂා කරන තනතුරට අදල විෂයය පැහැදිලිව දක්වීම ඉතා වැදගත් අවශ්‍යතාවයක් බව සැලකුව මැනවි.

ඔලිවර් අබේසේකර,
කෑගල්ල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 අගෝස්තු මස 19 වෙනි දින,
කෑගල්ල,
ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයේ දීය.

## ආදර්ශ ආකෘතිය

### කෑගල්ල කණිෂ්ඨ කාර්මික ආයතනයේ බාහිර උපදේශක තනතුරු 1969–70 ඉල්ලුම් පත්‍රය

1. නම (මුලකුරු සමඟ) :————.
2. වයස :————.
3. පෞද්ගලික ලිපිනය :————.
4. වෘත්තීය හෝ රැකියාව :————.
5. මාසික මූලික වැටුප හා වැටුප් ක්‍රමය :————.
6. රැකියාව කරන ස්ථානයේ ලිපිනය :————.
7. අධ්‍යාපනික සුදුසුකම් :————.
8. වෘත්තීය සුදුසුකම් :————.
9. උගැන්වීමේ පලපුරුද්ද :————.
10. බාහිර උපදේශක වරයෙකු වශයෙන් ඉගැන්වීමට බලාපොරොත්තුවන විෂයයන්:—

| විෂයය | මාධ්‍ය |
|---|---|
| ———— | ———— |
| ———— | ———— |

11. සතියක් තුලදී ඔබට කළහැකි උපරිම දේශන ගණන :————.

ඉහත සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

8–1300—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

අංකය : මහ/සාපා/8/කාවි/49.

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව—මහනුවර

### මහනුවර කණිෂ්ඨ කාර්මික ආයතනයේ බාහිර උපදේශක තනතුරු 1969/70

මහනුවර අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ ඇති මහනුවර කණිෂ්ඨ කාර්මික ආයතනයෙහි 1969/70 වර්ෂයේ පහත සඳහන් බාහිර උපදේශක තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත්, මහනුවර කණිෂ්ඨ කාර්මික ආයතනයේ ආයතනාධිපති වෙත 1969 සැප්තැම්බර් මස 15 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ යැවිය යුතුය. (අයදුම්පත් මෙම කාර්යාලය වෙත නොඑවිය යුතුය. එසේ එවන යම් අයදුම්පතක් ගැන මෙම කාර්යාලයය වගකීමක් භාර නොගන්නා බව විශේෂයෙන්ම සැලකුව මැනවි.) අපේක්ෂකයින් විසින් තම තමන්ගේ අධ්‍යාපනික, වෘත්තීය, කාර්මික සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සියලුම විස්තර අයදුම් පතේ සඳහන් කළ යුතුයි.

| | බාහිර උපදේශක තනතුරු අදාල විෂයයන් | පන්ති පැවැත්වෙන මාධ්‍යය |
|---|---|---|
| 1. | ඉංග්‍රීසි භාෂාව | |
| 2. | ගණිතය | |
| 3. | භෞතික විද්‍යාව | |
| 4. | වාණිජ භූගෝලය | |
| 5. | වාණිජ අංක ගණිතය | |
| 6. | වාණිජ්‍යය | |
| 7. | ගණකාධිකරණය | |
| 8. | ලඝුහනය | |
| 9. | යතුරු ලියනය | |
| 10. | විද්‍යුත් විද්‍යාව | |
| 11. | යාන්ත්‍රික ඇඳීම | ඉංග්‍රීසි |
| 12. | ජ්‍යාමිතික ඇඳීම | |
| 13. | මිණුම් සැලසුම් වැඩ | |
| 14. | මැනීම හා මට්ටම් කිරීම | |
| 15. | සෞඛ්‍ය ඉංජිනේරු විද්‍යාව | |
| 16. | උපකරණ බලය හා නිර්මාණය | |
| 17. | ගෘහ නිර්මාණ ද්‍රව්‍ය හා සංඛ්‍යාව | |
| 18. | ගොඩනැගිලි නිර්මාණය | |
| 19. | කර්මාන්තශාලා පිරිවැය ක්‍රම | |
| 20. | තාප ඇන්ජින් | |
| 21. | යාන්ත්‍රික විද්‍යාව | |
| 22. | වාණිජ භූගෝලය | |
| 23. | වාණිජ අංක ගණිතය | |
| 24. | වාණිජ්‍යය | |
| 25. | ගණකාධිකරණය | |
| 26. | ලඝුහනය | |
| 27. | යතුරු ලියනය | |
| 28. | ඔර්ලෝසු අලුත් වැඩියාව | |
| 29. | යන්ත්‍රහල් පරිචය | සිංහල |
| 30. | වඩු සටහන් ඇඳීම | |
| 31. | විදුලි කම්බි සවි කිරීම | |
| 32. | ගුවන් විදුලි යන්ත්‍රඅලුත්වැඩියා කිරීම (න්‍යාය) | |
| 33. | එම (ප්‍රයෝගික) | |
| 34. | ජලනල සවි කිරීම (න්‍යාය) | |
| 35. | එම (ප්‍රයෝගික) | |

2. බාහිර උපදේශක වරුනට ගෙවන ගාස්තු ඔවුන්ගේ සුදුසුකම්, පළපුරුද්ද හා උගන්වන පන්තිය අනුව පැයකට රු. 5 සිට රු. 15 දක්වා වෙනස් වෙනවා ඇත.

3. මෙම තනතුර වර්ෂයේ ඔක්තෝබර් මාසයේ පටන් ගෙන ඊලඟ අගෝස්තු මාසයේදී අවසන් වේ.

4. පන්ති පැවැත්වෙනුයේ පෙරවරු 8.30 සිට පස්වරු 4.30 දක්වා සහ පස්වරු 5 සිට 7.15 දක්වා හෙයින් මේ කාලය ඇතුළත උගැන්වීමට හැකි අයගෙන් ලැබෙන අයදුම්පත් පමණක් සලකා බලනු ලැබේ. තමන්ට සුදුසු කාල වේලා ඉල්ලුම් පත්‍රයේ නිසි ආකාර සඳහන් කළ යුතුය.

5. බාහිර උපදේශකවරුන් විසින් මධ්‍ය වාර්ෂික පරීක්ෂණයන්හි සහ අභ්‍යන්තර නොවූ පරීක්ෂණයන් නොයොදවන වර්ෂ අවසාන පරීක්ෂණයන්හිදී අමතර ගාස්තුවක් නොමැතිව තමන්ගේ පන්තිවල ශිෂ්‍යයන් පරීක්ෂා කළ යුතුය.

6. රාජ්‍ය සේවාවෙහි යෙදී සිටින අයදුම් කරුවන් තම අයදුම් පත් ඉදිරිපත් කළ යුත්තේ තම තමන්ගේ දෙපාර්තමේන්තු වල ප්‍රධානීන් මගිනි. එවැනි ඉල්ලුම් පත්‍ර නියම කරන ලද දිනට ප්‍රථම මහනුවර කණිෂ්ඨ කාර්මික ආයතනාධිපති වෙත නොලැබුනොත්, ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ ප්‍රතික්ෂේප කරනු නොලබන්නේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ඒවා කලට වේලාවට ලැබී පිළිගත හැකි හේතුවක් නිසා ප්‍රමාද වූවොත් පමණි.

7. අයදුම් පත්‍රයේ තමා අපේක්ෂා කරන තනතුරට අදල විෂයය පැහැදිලිව දක්වීම ඉතා වැදගත් අවශ්‍යතාවයක් බව සැලකුව මැනවි.

පී. බී. රත්නායක,
මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 අගෝස්තු මස 19 වැනිද,
මහනුවර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

8–1315—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

## කාර්මික සංවර්ධන මණ්ඩලය

### මණ්ඩලික ඇබෑර්තු

කාර්මික සංවර්ධන මණ්ඩලයේ පහත සඳහන් විවිධ අංශ හා නියෝජ්‍යායතනයන්හි ඇබෑර්තු පිළිබඳවය—ආර්ථික පර්යේෂණ අංශය, ලේඛන හා ප්‍රකාශන අංශය, ආයෝජන තොරතුරු කාර්යාංශය, අලෙවි හා අපනයන සංවර්ධන මධ්‍යස්ථානය, කාර්මික සැපයුම් නියෝජ්‍යායතනය, කළමනා සංවර්ධන හා නිෂ්පාදකතා මධ්‍යස්ථානය, කාර්මික ජනපද නියෝජ්‍යායතනය සහ කාර්මික මුදල් සහ ණය පහසුකම් නියෝජ්‍යායතනය.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී.—**

කාර්මික සංවර්ධන මණ්ඩලයේ විවිධ අංශ හා නියෝජ්‍යායතනයන්හි පරිපාලනමය කටයුතු සම්බන්ධයෙන් සහායවීම සඳහා ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ හෝ III වැනි පන්තියේ නිලධාරියකු වන්නේ නම් මැනවි. නොඑසේ නම් සමාන්තර පුහුණුවක් හා පළපුරුද්දක් ඇති රජයේ හෝ පෞද්ගලික අංශයේ සේවයේ නියුතු උපාධිධරයකු විය යුතුය.

වැටුප් පරිමාණය.—සියළු දීමනා අඩංගුව මසකට රු. 1,750 — 50 — 2,250.

**අලෙවි හා අපනයන සංවර්ධන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ.—**

වානිජමය හෝ අදාල ක්ෂෙත්‍රයක හෝ ජ්‍යෙෂ්ඨ විධායක තත්ත්වයක අවුරුදු 12 කට නොඅඩු පළපුරුද්දක් ඇති උපාධිධරයකු විය යුතුය.

වැටුප් පරිමාණය : සියළු දීමනා අඩංගුව මසකට රු. 1,750 — 50 — 2,250.

**සහකාර අධ්‍යක්ෂවරු.—**

කාර්මික සංවර්ධන මණ්ඩලයේ විවිධ අංශ හා නියෝජ්‍යායතනයන්හි කටයුතු සඳහා කළමනාකාරී තත්ත්වයේ අවුරුදු 10 කට නොඅඩු පළපුරුද්දක් ඇති උපාධිධාරීන් අවශ්‍ය කෙරේ. ආර්ථික පර්යේෂණ, වානිජය, හෝ කාර්මික පරිපාලනය පිළිබඳ පළපුරුද්දක් ඇති අය වඩාත් යෝග්‍යය.

වැටුප් පරිමාණය : කාර්මික සංවර්ධන මණ්ඩලයේ V, IV හා III වැනි ශ්‍රෙණිවල මාණ්ඩලික තනතුරු සඳහා වන රු. 720 සිට රු. 1,750 දක්වා (සියළු දීමනා ඇතුලත්) වැටුප් ක්‍රම අදළ වේ.

**කළමනා සංවර්ධන හා නිෂ්පාදකතා මධ්‍යස්ථානය.—**

කළමනා සංවර්ධන හා නිෂපාදකතා මධ්‍යස්ථානයේ විවිධ අංශයන්හි පහත සඳහන් තනතුරුවල ඇබෑර්තු ඇත.

**සාමාන්‍ය කළමනාකාරිත්ව—අන්තර් මධ්‍යම තනතුර.**—ජ්‍යෙෂ්ඨ විධායක තනතුරක යටත් පිරිසෙයින් වර්ෂ අටක පළපුරුද්දක් ඇති උපාධිධාරීන්.

වැටුප් පරිමාණය : මසකට සියළු දීමනා අඩංගුව රු. 1,250 — 50 — 1,750.

**කාර්මික ඉංජිනේරු—ජ්‍යෙෂ්ඨ තනතුරු.**—වරලත් ඉංජිනේරු වෘත්තිය සුදුසුකම් සමඟ පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු උපාධියක් සහිත විධායක තත්ත්වයේ වර්ෂ අටක පශ්චාත් උපාධි පළපුරුද්දක් ඇති අය.

වැටුප් පරිමාණය : මසකට සියළු දීමනා අඩංගුව රු. 1,500 — 50 — 2,000.

**අන්තර් මධ්‍යම තනතුරු.**—පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු උපාධියක් සහ පස් අවුරුදු පශ්චාත් උපාධි පළපුරුද්දක් ලැබ සිටිය යුතුය.

වැටුප් පරිමාණය : මසකට සියළු දීමනා අඩංගුව රු. 1,250 — 50 — 1,750.

**කණිෂ්ඨ තනතුරු.**—පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු උපාධියක් හා අවුරුදු දෙකක පශ්චාත් උපාධි පළපුරුද්ද ලැබ සිටිය යුතුය.

වැටුප් පරිමාණය : මසකට සියළු දීමනා අඩංගුව රු. 720 — 40 — 50 — 1,250.

**කළමනාකාර ගිණුම්—ජ්‍යෙෂ්ඨ තනතුර.**—ගණකාධිකරණය පිළිබඳ සම්පූර්ණ වෘත්තිය සුදුසුකම් හා වර්ෂ පහක විධායක තත්ත්වයේ පශ්චාත් වෘත්තිය පළපුරුද්ද ඇති අයකු.

වැටුප් පරිමාණය : මසකට සියළු දීමනා අඩංගුව රු. 1,500 — 50 — 2,000.

**අලෙවි හා විකුණුම්—ජ්‍යෙෂ්ඨ තනතුර.**—ජ්‍යෙෂ්ඨ විධායක තත්ත්වයේ යටත් පිරිසෙයින් වර්ෂ 10ක පළපුරුද්ද ඇති උපාධිධරයකු.

වැටුප් පරිමාණය.—මසකට සියළු දීමනා අඩංගුව රු. 1,500—50—2,000/-

**පිරිස් කළමනාකාර—අන්තර් මධ්‍යම තනතුර.**—විධායක මට්ටමේ යටත් පිරිසෙයින් අවුරුදු අටක පශ්චාත් උපාධි පළපුරුද්ද ඇති උපාධිධරයකු.

වැටුප් පරිමාණය.—මසකට සියළු දීමනා අඩංගුව රු. 1,250—50—1,750.

**පරිපාලන පුහුණුව—ජ්‍යෙෂ්ඨ තනතුර.**—කර්මාන්තය ඇතුලත පුහුණු කිරීම පිළිබඳ අවුරුදු 3ක් සහිතව විධායක මට්ටමේ යටත් පිරිසෙයින් අවුරුදු 10ක පශ්චාත් උපාධි පළපුරුද්ද ඇති උපාධිධරයකු **හෝ පරිපාලක නිලධාරීන් කෙලින්ම පාලනය කිරීම සම්බන්ධ කටයුතු ඇතුලත් වන පාලක තනතුරක වර්ෂ 5ක පළපුරුද්ද ඇති උපාධිධරයෙකු හෝ විය යුතුය. අයදුම්කරුවන් සිංහල භාෂාවෙන් සහ/හෝ දෙමළ භාෂාවෙන් පන්ති පැවැත්වීමේ හැකියාව ඇති අය විය යුතුය.**

වැටුප් පරිමාණය.—මසකට සියළු දීමනා අඩංගුව රු. 1,500—50—2,000.

**කණිෂ්ඨ තනතුර.—කාර්මිකයින් පුහුණු කිරීමේ** කටයුතු ගැන අවම වශයෙන් අවුරුදු 3ක පළපුරුද්දක් ඇති උපාධිධරයකු හෝ පරිපාලක නිලධාරීන් කෙලින්ම පාලනය කිරීම සම්බන්ධ කටයුතු ඇතුළත් වන පාලක තනතුරක අවුරුදු 5ක පළපුරුද්දක් සහිත උපාධිධරයකු හෝ විය යුතුය. අයදුම්කරුවන් සිංහල සහ/හෝ දෙමළ භාෂාවලින් පන්ති පැවැත්වීමේ හැකියාව ඇති අය විය යුතුය.

වැටුප් පරිමාණය.—මසකට සියළු දීමනා අඩංගුව රු. 720—40—50—1,250.

**ලියකියවිලි හා ප්‍රකාශන අංශයේ ප්‍රධාන නිලධාරී.**

පුස්තකාල විද්‍යාව/ලිය කියවිලි හා ප්‍රචාර කටයුතු පිළිබඳ පශ්චාත් උපාධි වෘත්තිය සුදුසුකම් සමඟ එම ක්ෂෙත්‍රයෙහි වර්ෂ අටක පමණ පශ්චාත් උපාධි පළපුරුද්ද ඇති උපාධිධරයකු විය යුතුය. මුද්‍රණ ශිල්පය සහ සංස්කරන වැඩ පිළිබඳ දැනුම අතිරේක සුදුසුකමක් වනු ඇත.

වැටුප් පරිමාණය.—සුදුසුකම් හා පළපුරුද්ද මත සියළු දීමනා අඩංගුව මසකට රු. 1,250—50—1,750 හෝ රු. 1,500—50—2,000 හෝ යන වැටුප් ක්‍රම දෙකින් එකක තබනු ඇත.

**ප්‍රකාශන අංශයේ ප්‍රධාන සංස්කාරක.**

සංස්කාරක කටයුතුවලට අදල සංස්කරන ප්‍රති රචනය හා විශේෂාංග රචනය. මෙම ක්ෂෙත්‍රයේ වර්ෂ අටක පළපුරුද්දක් ඇති උපාධිධරයකු විය යුතු අතර පර්යේෂණ හා කළමනාකාරිත්වයේ පළපුරුද්ද අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

වැටුප් පරිමාණය.—සුදුසුකම් හා පළපුරුද්ද මත සියළු දීමනා අඩංගුව මසකට රු. 1,250—50—1,750 හෝ රු. 1,500—50—2,000 හෝ යන වැටුප් ක්‍රම දෙකින් එකක තබනු ඇත.

**උපාධිධාරී ආධුනිකයින්.**

(1) විද්‍යාව, අර්ථ ශාස්ත්‍රය, සමාජ විද්‍යාව, වානිජ විද්‍යාව, ඉන්ජිනේරු විද්‍යාව හෝ නීතිය පිළිබඳ ''පන්තියක්'' සහිත උපාධිධාරීන් හෝ

(2) කාර්මික කළමනාකාරිත්වය, ආර්ථික පර්යේෂණ, වානිජ විද්‍යාව, හෝ සංවර්ධන පරිපාලනය පිළිබඳ පස් අවුරුදු පශ්චාත් උපාධි පළපුරුද්දක් ඇති උපාධිධාරීන් විය යුතුය.

වැටුප් පරිමාණය.—උපාධිධාරී ආධුනිකයින්ට පළමුවන වර්ෂ දෙක තුල මසකට සියළු දීමනා ඇතුළුව රු. 500 බැගින් ගෙවනු ලබන අතර ඉන්පසු මසකට සියළු දීමනා ඇතුළුව රු. 600—40—1,000 වැටුප් ක්‍රමයේ තබා වැටුප් ගෙවීම අරඹනු ලැබේ.

විශේෂ අධ්‍යයන විශිෂ්ඨතා හෝ විශේෂ පළපුරුදුකම් ඇති උපාධිධාරීන් අදල වැටුප් ක්‍රමයේ යෝග්‍ය වැටුප් තලයක එක එල්ලේම තබනු ලැබේ.

**සංස්කාරක සහායක හා භාෂා පරිවර්තකක.**

සිංහල හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ප්‍රකාශන, සංස්කාරක හා විශේෂාංග රචනා කටයුතු පිළිබඳ වර්ෂ පහකට නොඅඩු පළපුරුද්දක් ඇති උපාධිධාරීන්ද කාර්මික අර්ථ ශාස්ත්‍රය සහ වානිජ විද්‍යාවට අදල සිංහල/ඉංග්‍රීසි පරිවර්තන කටයුතු පිළිබඳ වර්ෂ පහක පළපුරුද්දක් ඇති උපාධිධාරීන්ද විය යුතුය.

වැටුප් පරිමාණය.—අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව මසකට සියළු දීමනා අඩංගුව රු. 600—40—1,000 හෝ රු. 720—40—50—1,250 හෝ යන වැටුප් ක්‍රමයන්ගෙන් එකක තබනු ඇත.

පිළියෙල කළ අයදුම්පත් පෝර්ම නොමැත. එහෙත් අයදුම් කිරීමේදී පහත දැක්වෙන ආදර්ශ ආකෘතිය අනුව අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස සියළුම අයදුම්කරුවන්ගෙන් කරුණාවෙන් ඉල්ලනු ලැබේ. රජයේ දෙපාර්තමේන්තු හෝ රජයේ සංස්ථාවල සේවකයින්ගේ අයදුම්පත් සලකා බලනු ලබන්නේ, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි බව සිය දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් විසින් නිසි පරිදි සඳහන් කර ඇතොත් පමණි.

අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනය 1969 සැප්තැම්බර් මස 15 වෙනි දින වේ. සියළුම අයදුම්පත් කොළඹ 7, ග්‍රෙගරි පාරේ අංක 16හි පිහිටි කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන ආයතන නිලධාරී වෙත සැප්තැම්බර් මස 15 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුය.

පාලන අධ්‍යක්ෂ,
කාර්මික සංවර්ධන මණ්ඩලය.

### ආදර්ශ අයදුම්පත් ආකෘතිය

.................................... තනතුර

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. වයස :————.
4. අධ්‍යාපනික/වෘත්තිය සුදුසුකම් :————.
5. පශ්චාත් උපාධි අධ්‍යයනය/පර්යේෂණ පළපුරුද්ද :————.
6. සේවා පළපුරුද්ද (කරුණාකර සේවාව පිළිබඳ විස්තර දිනයන්ද සමඟ අනු පිළිවෙලින් දක්වන්න) :————.
7. වර්තමාන වැටුප (මූලික වැටුප හා දීමනා වෙන වෙනම දක්වන්න :————,
8. අපේක්ෂිත වැටුප :————.
9. මෙම අයදුම්පත සම්බන්ධයෙන් අදල විය හැකි වෙනත් සුදුසුකම් ඇත්නම් :————.

........................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :.......................

8-1427—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### ඇබෑර්තු

මෙම සංස්ථාවේ මෙහි පහත සඳහන් තනතුරු සඳහා ලාංකික පුරවැසියන් ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

2. මෙහි අවසානයෙහි දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 1969 සැප්තැම්බර් මස 12 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන සේ,

සේවක මණ්ඩල කළමනාකාරතැන,<br>
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,<br>
අංක 113, ගාලු පාර,<br>
කොළඹ 3.

යන ලිපිනයට ලියාපදිංචි කළ තැපැල් මගින් එවිය යුතුයි.

3. තෝරාගනු ලබන අයදුම්කරුවන්, ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව සුදුසු වැටුප් ලක්ෂායන් මත පත් කිරීමට ඉඩ ඇත.

4. මෙහි දක්වා ඇති වැටුප් පරිමාණය ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් වේ.

5. රජයේ දෙපාර්තමේන්තුවල හෝ රජයේ අනෙක් සංස්ථාවන්හි හෝ සේවකයින් විසින් එවනු ලබන අයදුම් පත් සලකා බලනුයේ, ඔවුන් විසින් ඒවා අදල දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළහොත් පමණි. භාණ්ඩාගාරයේ අංක 666 හා 1965.8.20 වෙනි දින දරණ චක්‍ර ලේඛයෙහි දක්වෙන වගන්තිවලට අනුව අදල නිලධාරියා සිය සේවයෙන් නිදහස් කළහැකි දැයි යන්න දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ ප්‍රධානියා විසින් සඳහන් කළයුතු ය.

6. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු නොලැබේ. මෙම දන්වීමෙහි සඳහන් අවශ්‍යතාවයනට අනුව පිළියෙල නොවුනු ඉල්ලුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

7. සේවා කොන්දේසි :—

(I) **තෝරාගනු ලබන අයදුම්කරුවන් :**

(අ) පත්වීමට පෙර ශාරීරික යෝග්‍යතාව දක්වීම සඳහා වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුය.

(ආ) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම වස් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරනු ලබන ප්‍රමාණයක සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් ලබාගත යුතුය.

(ඉ) සේවක අර්ථසාධක අරමුදලට තම වැටුපෙන් සියයට අට (8%) ක් දයක විය යුතුය. ඊට සංස්ථාවෙන් සියයට දෙළහ (12%) ක් දයක වනු ඇත.

(ඊ) සංස්ථාවේ ඕනෑම කාර්යාංශයක් යටතේ දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීම අවශ්‍යය.

(II) මෙම තනතුරු සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් තුන් අවුරුදු ආධුනික කාල සීමාවකට යටත්ව පත්කරනු ලැබේ.

**තනතුර සහ වැටුප් ක්‍රමය.— (1) ෆෝර්මන් (ප්‍රවාහන) බී–1 ශ්‍රෙණිය—** රු. $\frac{530—750}{6 \times 20 : 4 \times 25.}$

**අවශ්‍ය සුදුසුකම් :**

(අ) අඩුම වශයෙන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඒ හා සමාන වෙනත් විභාගයකින් සමත්වී සිටිය යුතු අතර, සිංහල භාෂාව පිළිබඳ හොඳ දැනීමක් තිබිය යුතුය.

(ආ) පිළිගත් ප්‍රවාහන ආයතනයක අවුරුදු 10 ක කාලයක්වත් සේවය කර තිබිය යුතු අතර, ඉන් අඩු වශයෙන් තුන් අවුරුද්දක කාලයක් පරිපාලන තත්වයෙහි සේවය කර තිබිය යුතු ය.

(ඉ) විශේෂයෙන්ම ලොරිවල සේවය කරන කම්කරුවන් පාලනය කිරීම හා එයට අදල කටයුතු පිළිබඳව මනා පළපුරුද්දක් තිබිය යුතු ය.

(ඊ) අයදුම් පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 ටත් 45 ටත් අතර අය විය යුතුය.

(2) **ෆෝර්මන් (විදුලිය) බී–1 ශ්‍රෙණිය**—රු. $\frac{530—750}{6 \times 20:4 \times 25.}$

(අ) අඩුම වශයෙන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඒ හා සමාන වෙනත් විභාගයකින් සමත් වී සිටිය යුතුය. ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් සමත්වීම වැඩි සුදුසුකමක් වේ.

(ආ) පරිපාලනමය තත්වයේ අවුරුදු 3 ක් සහිතව පිළිගත් ඉංජිනේරු වැඩ පළක හෝ විදුලිය කටයුතු පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු 10 ක පළපුරුද්දක් තිබිය යුතු ය.

(ඉ) කණිෂ්ඨ කාර්මික නිළධාරි සහතිකය ලබා ඇති අය, අවුරුදු 5 ක විදුලිය කටයුතු පිළිබඳව පළපුරුද්දක් ද, ආමෙචර් නැවත එතීම, මෝටර් කොයිල්, ස්විච් ජීයරය යනාදිය ඇතුළුව සියලුම වර්ගයේ විදුලිය වැඩ පිළිබඳව පුළුල් පළපුරුද්දක් ද, ස්විච් ජීයරය, මෝටර් සහ ඩයිනමෝවල වරදවල් සොයා ගැනීම හා ඒවා අළුත්වැඩියා කිරීමට හැකියාවක්ද ඇත්නම් සලකා බලනු ලැබේ.

(ඊ) විදුලිය වැඩපලවල ඇති විශේෂ උපකරණ පාවිච්චිය ගැන මනා පළපුරුද්දක් තිබිය යුතු ය.

(උ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 45 නොඉක්ම වූ අය විය යුතු ය.

(3) සැලසුම්කරු බී–1 ශ්‍රෙණිය—රු. $\frac{530—750}{6 \times 20 : 4 \times 25.}$

(අ) දෙවරකට වැඩි නොවූ වාර ගණනකදී අනිවාර්‍ය විෂයයන් සහිතව විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගය හෝ ඒ හා සමාන වෙනත් විභාගයකින් සමත්වී සිටිය යුතු ය.

(ආ) ලංකා කාර්මික විද්‍යාලයේ සැලසුම්කරු, පාඨමාලාව හදරා තිබීම සහ පිළිගත් ආයතනයක, රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක සැලසුම් කරුවෙකු වශයෙන් අවුරුදු 10 ක පළපුරුද්දක්

හෝ

පිළිගත් ඉංජිනේරු ආයතනයක, ගෘහ නිර්මාණ ශිල්පී ආයතනයක, රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක පූර්ණකාලීන සැලසුම්කරුවෙකු වශයෙන් අවුරුදු 15 ක පළපුරුද්දක් හෝ ලබා තිබිය යුතුය. අයදුම්කරුවන්ට යාන්ත්‍රික සැලසුම් ගැනද පළ පුරුද්දක් තිබිය යුතු ය.

(ඉ) අයදුම් පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 45 නොඉක්ම වූ අය වියයුතු ය.

සේවක මණ්ඩල කළමනාකාරතැන.

1969 අගෝස්තු මස 18 දින,<br>
113, ගාලු පාර,<br>
කොළඹ 3.

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|
| |

1. ඉල්ලුම් කරන ලද තනතුර :————.
2. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙලපත් නාමය ප්‍රථමයෙන්) :————.
3. මුල් අකුරු සමග නම :————.
4. ලිපිනය :————.
5. උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) : ————.
6. ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :————, මාස :————, දින :————.
7. පුරවැසි භාවය (උත්පත්තියෙන්ද, ලියාපදිංචිවීමෙන්ද යන වග) : ————.
8. විවාහක/අවිවාහක බව : අවිවාහක බව :————, විවාහක බව : ————, දික්කසාද බව :————.
9. අධ්‍යාපනික පසුබිම :—

| ඉගෙනීම ලැබූ පාඨශාලාවල් | සාමාර්ථය ලැබූ උසස්ම විභාගයන් සහ වර්ෂයන් | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

10. වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් තිබෙනම් :————.
11. මීට ප්‍රථම කරනලද රැකියාවන් පිළිබඳ විස්තර :—

| ආයතනයේ නම | තත්වය | සිට | දක්වා | අස්වීමට/හේතු |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

12. දැනට ලබන වැටුප :————.
13. විශේෂ සුදුසුකම් ඇත්නම් (ඔබ විසින් හදරා ඇති ඉගෙනීම/පුහුණුව පිළිබඳ විස්තර සඳහන් කරන්න) :————.
14. වෙනත් කරුණු :————.
15. මෙම දන්වීමේ තනතුරු සඳහා "අවශ්‍ය සුදුසුකම්" යටතේ සඳහන් සුදුසුකම්/පළපුරුදුකම් එකිනෙක ඔබට ඇති බව දක්වෙන සටහනක් හා එය ඔප්පු කිරීම සඳහා අදල සහතිකවල පිටපත් ද අමුණා එවිය යුතුයි.

ඉහත සඳහන් විස්තර සියල්ල නිවැරදි බවත්, සත්‍ය බවත්, සඳහන් කළයුතු කිසිවක් වසන් නොකළ බවත් මෙයින් සහතික කරමි. ඉහත සඳහන් විස්තර අසත්‍ය බව හෝ සැපයිය යුතුව තිබූ විස්තර වසන් කර ඇති බව හෝ තෝරා පත්කර ගැනීමට පෙර ඔප්පු වුනිනම් මගේ ඉල්ලුම් පත්‍රය අවලංගු වන බවද තෝරා ගැනීමෙන් පසුව ඔප්පු වුනිනම් කිසිම වන්දියක් නොමැතිව රැකියාවෙන් පහකරනු ලබන බවද මම දනිමි.

————,<br>
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

8–1417—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### ගාල්ලේ කණිෂ්ඨ කාර්මික ආයතනයෙහි බාහිර උපදේශක තනතුරු 1969–70

ගාල්ලේ කණිෂ්ඨ කාර්මික ආයතනයෙහි බාහිර උපදේශක තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර ගාල්ලේ කණිෂ්ඨ කාර්මික ආයතනයේ ආයතනාධිපති වෙත 1969 සැප්තැම්බර් මස 15 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ යැවිය යුතුය. අපේක්ෂකයින් තම තමන්ගේ අධ්‍යාපනික, වෘත්තීය, කාර්මික සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සියලුම විස්තර ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතුය.

2. බාහිර උපදේශක ඇබෑර්තුවලට අදාළ විෂයයන් මෙහි පහත සඳහන් කර තිබේ. පන්ති පැවැත්වෙන මාධ්‍යය විෂයය ඉදිරියෙන් පෙන්නුම් කෙරෙයි.

| | |
|---|---|
| (1) වාණිජ අංක ගණිතය<br>(2) ගණන් තැබීම<br>(3) ගණකාධිකරණය<br>(4) ලෝහ වැඩ<br>(5) ඉංග්‍රීසි භාෂාව<br>(6) බිම් මැනීම සහ මට්ටම් කිරීම න්‍යාය | සිංහල මාධ්‍යය |
| (7) ගණිතය<br>(8) වාණිජ භූගෝල විද්‍යාව<br>(9) ගෘහ නිර්මාන ශිල්පය<br>(10) ව්‍යවහාරික යාන්ත්‍රික ගණිතය<br>(11) තාප යන්ත්‍ර<br>(12) යාන්ත්‍රික ඇඳීම<br>(13) ද්‍රව්‍ය සහ ව්‍යුහ<br>(14) විද්‍යුත් විද්‍යාව<br>(15) වැඩ ගණකාධිකරණය<br>(16) සෞඛ්‍ය ඉංජිනේරු විද්‍යාව<br>(17) ගොඩනැගිලි පරිමාණ | ඉංග්‍රීසි මාධ්‍යය |

3. බාහිර උපදේශකවරුන්ට ගෙවන ගාස්තු ඔවුන්ගේ සුදුසුකම්, පළපුරුද්ද හා උගන්වන පංතිය අනුව පැයකට රු. 5 සිට රු. 15 දක්වා වෙනස් වනවා ඇත.

4. මෙම තනතුරු අවුරුද්දේ ඔක්තෝබර් මස පටන්ගෙන ඊළඟ අවුරුද්දේ අගෝස්තු මස අවසන් වේ. අවශ්‍යතාවයේ හැටියට ඊට කලින් වුව ද අවසන් කෙරෙනු ඇත.

5. පංති පැවැත්වෙනුයේ උදේ 8.30 සිට සවස 4.30 දක්වා සහ සවස 4.45 සිට රාත්‍රි 7.00 දක්වා ද හෙයින් මේ කාලය ඇතුළත උගැන්වීමට හැකි අයගෙන් පමණක් ලැබෙන ඉල්ලුම් පත්‍ර සළකා බලනු ලැබේ. තමන්ට සුදුසු කාල වේලා ඉල්ලුම් පත්‍රයේ නිසියාකාරව සඳහන් කළ යුතුය.

6. බාහිර උපදේශකවරුන් විසින් මධ්‍ය වාර්ෂික පරීක්ෂණයන්හි සහ අභ්‍යන්තර නොවූ පරීක්ෂකයන් නොයොදවන වර්ෂ අවසාන පරීක්ෂණයන් හිදී අමතර ගාස්තුවක් නොමැතිව තමන්ගේ පන්තිවල ශිෂ්‍යයින් පරීක්ෂා කළ යුතුය.

7. රාජ්‍ය සේවාවෙහි යෙදී සිටින ඉල්ලුම් කරුවන් තම ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ තම තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මගිනි. එවැනි ඉල්ලුම් පත්‍ර නියම කරන ලද දිනට පෙර ගාල්ලේ කණිෂ්ඨ කාර්මික ආයතනයේ ආයතනාධිපති වෙත නොලැබුනහොත්, ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ ප්‍රතික්ෂේප කරනු නොලබන්නේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ඒවා කලට වේලාවට ලැබී පිළිගත හැකි හේතුවක් නිසා ප්‍රමාද වුවොත් පමණි.

8. අයදුම් පත්‍රයේ තමා අපේක්ෂා කරන තනතුරට අදල විෂයය පැහැදිලිව දැක්වීම ඉතා වැදගත් අවශ්‍යතාවයක් බව සැළකුව මැනවි.

ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ,
ගාල්ල.

1969 අගෝස්තු මස 15 දින,
ගාල්ලේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

8–1236—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

අංකය : 1/23/2/19 (ජී).

### සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකාර පංතියේ II වැනි ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය—1969 නොවැම්බර්

**විභාගය පවත්වන දිනය.**—සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකාර පංතියේ II වැනි ශ්‍රේණියට උසස් කිරීමේ තරඟ විභාගයක් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය වලින් 1969 නොවැම්බර් මස 22 වැනි දින කච්චේරි පිහිටි සියලුම නගරවල දී විභාග කොමසාරිස් විසින් පවත්වනු ලැබේ.

කිසියම් කච්චේරි පිහිටි මධ්‍යස්ථානයකට විභාගාපේක්ෂකයන් සෑහෙන සංඛ්‍යාවක් ඇතුළත් නොවුවහොත් ඒ මධ්‍යස්ථානය අවලංගු කළ හැකිය.

2. **ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීම සහ ඇබෑර්තු සංඛ්‍යාව.**—සමත් වූ අපේක්ෂකයන්ගේ නම් ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබේ. මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පුරවනු ලබන ඇබෑර්තු සංඛ්‍යාව පසුව නිවේදනය කරනු ලැබේ. සෑහෙන තරම් අපේක්ෂකයින් සංඛ්‍යාවක්, අවශ්‍ය අඩුම ලකුණු ප්‍රමාණය ලබා නොගතහොත්, ඇබෑර්තු වලින් සමහරක් නොපුරවා හැරීමට ඉඩ තිබේ.

3. **වැටුප් සහ සේවා කොන්දේසි.**—සාමාන්‍ය ලිපිකාර සේවය පිළිබඳව 1955 ඔක්තෝබර් මස 1 වැනි දින අංක 10,844 දරන ආණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ව්‍යවස්ථා සංග්‍රහය බලනු මැනවි.

4. **සුදුසුකම්.**—මෙම විභාගය, සාමාන්‍ය ලිපිකාර සේවයේ සාමාන්‍ය ලිපිකාර පන්තියේ පත්වීම් ස්ථිර කර ඇත්තා වූ 1969 ඔක්තෝබර් 1 වැනි දිනට හෝ ඊට පෙර හෝ අවුරුදු 4 ක සතුටුදයක සේවයක් සම්පූර්ණ කර ඇති සාමාන්‍ය ලිපිකාර පන්තියේ ලිපිකරුවන්ට සීමා වේ. එහෙත්, සාමාන්‍ය ලිපිකාර සේවයේ සාමාන්‍ය ලිපිකාර පන්තියට අන්තර් ග්‍රහණය කර ඇති, එසේ අන්තර් ග්‍රහණය නොවී තාවකාලික ලිපිකරුවන් හෝ දිස්ත්‍රික් ලිපිකාර සේවයේ හෝ අර්ධ ලිපිකාර සේවයේ ලිපිකරුවන් ලෙස දිගටම සිටියා නම්, 1969 ඔක්තෝබර් 1 වැනි දිනට හෝ ඊට පෙර හෝ තාවකාලික ලිපිකරුවන් හෝ දිස්ත්‍රික් ලිපිකාර සේවයේ හෝ අර්ධ ලිපිකාර සේවයේ ලිපිකරුවන් ලෙස අවුරුදු 8 ක සතුටුදයක සේවයක් සම්පූර්ණ කළ හැකි, පත්වීම් ස්ථිර කර ඇත්තාවූ ලිපිකරුවන් ද සුදුසුකම් පිළිබඳ අනිකුත් කොන්දේසි සපුරාලන්නේ නම් මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සෝ වෙති.

5. **අයදුම්පත්.**—(i) මේ විභාගයට ඇතුල්වීමේ ආදර්ශ අයදුම්පත් පෝර්මයක් මේ නිවේදනයට යා කොට ඇත. අයදුම්කරුවන් විසින් බාග ප්‍රමාණයේ පුල්ස්කැප් කඩදාසියක තම අයදුම්පත් පිළියෙල කරගත යුතු ය. (මේ සඳහා වෙන ප්‍රමාණයක කඩදාසි පාවිච්චි නොකළ යුතු ය.) මේ සඳහා පාවිච්චි කළ යුත්තේ එක් කඩදාසියක් පමණි. ආකෘති පත්‍රයෙහි 1 සිට 7 දක්වා කොටු පළමුවන පිටුවෙහි ද, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය සහ අත්සන පිළිබඳ සහතිකය දෙවන පිටුවෙහි ද විය යුතුය. යතුරු ලියනයන් මගින් අයදුම්පත පිළියෙල කරගත හැකි මුත් එය නිවැරදිවද පැහැදිළිව ද, අපේක්ෂකයාගේම අත් අකුරින් පිරවිය යුතුය.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පර්මාරථයන් සඳහා නව ප්‍රවේශක නිලධාරීන් ඔවුන්ගේ අයදුම්පත්‍ර පෝර්ම, රාජ්‍ය භාෂාවෙන් පිළියෙල කර ගත යුතු අතර එම අයදුම් පත්‍ර එම භාෂාවෙන් ම සම්පූර්ණ කළ යුතුය. එසේ වුවද, ආදි ප්‍රවේශක නිලධාරීන්ට අයදුම්පත්‍ර පෝර්ම පිළියෙල කර ගැනීම සහ ඒවා සම්පූර්ණ කිරීම තම තමන්ගේ කැමැත්ත පරිදි රාජ්‍ය භාෂාවෙන් හෝ ඉංග්‍රීසියෙන් හෝ කළ හැකිය.

(ii) අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් යැවිය යුතුය. එසේ අයදුම් පත් යවන විට සතුටුදයක සේවය පිළිබඳ සහතිකය ද ඊට ඇතුළත් කළ යුතු ය. සෑම අයදුම්පතක් ම සර්වප්‍රකාරයෙන්ම නිවැරදි ලෙස සම්පූර්ණ කර ඇති බවට හා සේවා සහතිකය තමන් විසින් අත්සන් කොට ඇති බවට දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් වග බලාගත යුතුය. සුදුසුකම් ඇති අයදුම්කරුවන් ගේ අයදුම්පත්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් කොළඹ 2, විභාග කොමසාරිස් වෙත 1969 ඔක්තෝබර් 15 වැනි දිනට හෝ ඊට පෙර හෝ ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් යැවිය යුතුයි. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

6. **විභාගයට ඇතුලත් කර ගැණිම.**—(i) අයදුම්පත් අනුමත කර ඇති සියලු ම අපේක්ෂකයන්ට විභාග කොමසාරිස් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබේ. විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් විසින්, විභාග පරිපාලක වෙත ඔවුන්ගේ ප්‍රවේශපත්‍ර ඉදිරිපත් කළ යුතු ය. එවැනි පත්‍රිකා නොමැති ව ඔවුන්ට විභාගයට ඇතුල්වීමට ඉඩ දෙනු නොලැබේ.

(ii) එක් එක් අපේක්ෂකයා වෙත වෙන වෙනම කාලසටහන් නිකුත් කරනු නොලැබේ. මෙම නිවේදනයේ 9 වැනි ඡේදයේ දැක්වෙන කාල සටහන අපේක්ෂකයන් විසින් සටහන් කරගත යුතු ය.

(iii) විභාග පැවැත්වීම පිළිබඳව විභාග කොමසාරිස් විසින් පනවා ඇති නීතිවලට අපේක්ෂකයෝ බැඳී සිටිය යුතු වෙති. තවද මේ නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් විසින් පනවනු ලබන ඕනෑ ම දඬුවමකට යටත් වීමට ඔවුන්ට සිදුවෙනවා ඇත.

(iv) අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති මේ නිවේදනය අග වෙන ම මුද්‍රණය කර ඇත.

7. **විභාගයට පෙනී සිටීම සඳහා ආණ්ඩුවේ නිලධාරීන් හට නිවාඩු.**—විභාග කොමසාරිස් විසින් අනුමත කරන ලද අයදුම්පත්‍ර ඇති අපේක්ෂකයන්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් රාජකාරි නිවාඩු දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

8. **විභාග පරිපාටිය.**—විභාගයේ විෂයයන් සහ එක් එක් විෂයයට අයිති ලකුණු ගණන පහත දක්වා ඇත. සියලු ම උත්තර පත්‍රිකාවල

අශෝභන අත්අකුරුවලට සහ අක්ෂර වින්‍යාස දෝෂවලට ලකුණු අඩු කරනු ලැබේ. කියවිය නොහැකි ලෙස අකුරු ලියා ඇති අපේක්ෂකයන් නුසුදුස්සන් කරනු ලැබීමට ඉඩ ඇත.

| | | ලකුණු |
|---|---|---|
| (1) | ගිණුම් (පැය එකහමාරක පත්‍රයකි.) මෙම පත්‍රය ගිණුම් සහ එකතු කිරීම් අභ්‍යාස හා සම්බන්ධ ප්‍රශ්නවලින් සමන්විත වනු ඇත. එය ඉලක්කම් හා සම්බන්ධ වැඩ කිරීමේ දී ඇති නිරවද්‍යතාව සහ ගිණුම් පිළිබඳ සරල මූලික න්‍යායන් ගැන දැනීම විභාග කිරීම පිණිස පිළියෙල වූවකි ... | 100 |
| (2) | ව්‍යවස්ථා, කාර්‍ය පරිපාටිය හා කාර්‍යාලයීය ක්‍රම (පැය දෙකක පත්‍රයකි.) ලිපිකරුවකු වශයෙන් නිලධාරියකුගේ ප්‍රයෝජනය සහ ප්‍රවීණතාව විභාග කර බැලීම පිණිස මෙම ප්‍රශ්නපත්‍රය පිළියෙල කරනු ලැබේ. සැබෑ කාර්‍යාලයීය ලියුම් මාලාවක සාරාංශයක් ලිවීමට, නියෝගයක් අනුව කෙටුම්පත් ලිපියක් ඉදිරිපත් කිරීමට, සූචි ක්‍රමය හා ලිපිගොනු කිරීමාදිය හා සම්බන්ධ දැනුමක් විදහා පෑමට ඔහුට සිදුවෙනවා ඇත. තවද ලිවීමේ දී පැහැදිලිව අදහස් ප්‍රකාශ කිරීමේ දැනුම ද පෙන්විය යුතුය ... | 200 |

සංලක්ෂ්‍යය.—(i) අපේක්ෂකයින් ලිපිකාර සේවයට බැඳීමේ තරඟ විභාගයට පෙනී සිටි මාධ්‍යයෙන්ම මෙම ප්‍රශ්නපත්‍ර දෙකට පිළිතුරු සැපයිය යුතුය. තරඟ විභාගයක් නොමැතිව මුලින්ම සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් වූ විට, විභාගයට පෙනී සිටිය යුතු මාධ්‍යය වනුයේ නිලධාරියා සේවයට බැඳීම සඳහා සුදුසුකම් ලත් භාෂාව ය. මේ දෙවර්ගයටම අයත් නිලධාරීන්ට තම අභිමතය පරිදි ප්‍රශ්නපත්‍ර දෙකටම රාජ්‍ය භාෂාව වූ සිංහලෙන් පිළිතුරු සැපයීමට පුළුවන. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා ආදි ප්‍රවේශකයින් වශයෙන් සලකනු ලබන ඉංග්‍රීසි මාධ්‍යයෙන් සේවයට බඳවා ගනුලැබූ නිලධාරීන්ට මෙම එක් එක් ප්‍රශ්න පත්‍රයට සම්පූර්ණ වශයෙන් සිංහලෙන් හෝ ඉංග්‍රීසියෙන් හෝ පිළිතුරු සැපයීමට පුළුවන.

(ii) මෙය තරඟ විභාගයක් වුව ද, අපේක්ෂකයින් විසින් මෙම එක් එක් විෂයයෙන් අඩුම ගණනේ ලකුණු සියයට තිස්පහක් ද, විෂයයන් දෙකේ ම මුළු ලකුණු ගණනින් සියයට හතළිහක් ද ලබා ගැනීම අවශ්‍ය ය.

| | | | ලකුණු |
|---|---|---|---|
| (3) | සිංහල හෝ දෙමළ | | |
| | (අ) | පැය එකහමාරක ලිවීමේ ප්‍රශ්න පත්‍රයක් ... | 100 |
| | (ආ) | සම්මුඛ පරීක්ෂණයක් ... ... | 100 |

ලිඛිත ප්‍රශ්නපත්‍රයට පහත සඳහන් අභ්‍යාස ඇතුළත් වෙයි :—

(i) සරළ ගද්‍ය කොටස් අවබෝධය ;

(ii) පහත සඳහන් රචනා විධි එකක් හෝ වැඩි ගණනක් : විස්තරාත්මක රචනා දෙබස් හා ලියුම් ලිවීම ;

(iii) (අ) වාක්‍යයන් සිංහලට/දෙමළට ද

(ආ) සරල ගද්‍ය කොටසක් ඉංග්‍රීසියට ද පරිවර්තනය කිරීම ;

(iv) වචන වල අර්ථය, ක්‍රියාකාරිත්වය සහ එකිනෙකට සම්බන්ධකම, පාඨ සහ වාක්‍ය, වැරදි ආදිය.

සංලක්ෂ්‍යය.—(i) මේ විෂය හා සම්බන්ධ විභාගය, අපේක්ෂකයන්ට වැඩ කිරීමට හැකි තරමේ භාෂා ඥානයක් ඇති දැයි පරීක්ෂා කිරීම් වස් පිළියෙල වූවකි.

(ii) (1) වැනි සහ (2) වැනි විෂයයන් දෙකේ ම මුළු ගණනින් එක්තරා අඩුම ප්‍රමාණයකට වඩා වැඩි ලකුණු ගණනක් ගෙන ඇති අපේක්ෂකයන් මෙම විෂයය පිළිබඳ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එවැනි අපේක්ෂකයන් තෝරා ගැනීමට සුදුසුවීම පිණිස ඔවුන් විසින් ලිඛිත ප්‍රශ්න පත්‍රයේ සහ සම්මුඛ පරීක්ෂණයේ මුළු ලකුණුවලින් සියයට තිස්පහක් ගත යුතු ය. එහෙත් මෙම විෂයයෙන් ලැබූ ලකුණු ගණන යෝග්‍යතා පිළිවෙල නිශ්චය කිරීමේ දී සැලකිල්ලට භාජනය කරනු නොලැබේ.

(iii) (1) ගිණුම් සහ (2) ව්‍යවස්ථා, කාර්‍ය පරිපාටිය හා කාර්යාල ක්‍රම යන ප්‍රශ්නපත්‍ර දෙකට ම සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් පිළිතුරු සපයන අපේක්ෂකයින් (3) වැනි විෂයය වන සිංහල හෝ දෙමළ විෂයයෙන් නිදහස් කරනු ලැබේ.

(iv) පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් හෝ ලබා ඇති අපේක්ෂකයින් ද සිංහල හෝ දෙමළ විෂයයෙන් නිදහස් කිරීමට සුදුස්සන් වනු ඇත.

**සිංහල විෂයයෙන් නිදහස් කිරීම :**

(අ) මහා භාණ්ඩාගාරයේ සිංහල ප්‍රවීණතා විභාගයේ උසස් පෙළින් ලත් සාමාර්ථය,

(ආ) සිංහල භාෂාමය ලංකා පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය,

(ඇ) සිංහල භාෂාව හෝ නවීන සිංහල හෝ සම්භාව්‍ය සිංහල හෝ විෂයයක් වශයෙන් ඇතිව ඉංග්‍රීසි භාෂාමය ලංකා පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය,

(ඈ) ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙහි සිංහල භාෂාව (අ) හෝ (ආ) නිර්දේශය,

(ඉ) 1964.3.23 වැනි දින අංක 640 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ සඳහන් සිංහල ප්‍රවීණතා පරීක්ෂණයේ 4 වැනි ශ්‍රෙණියෙන් ලත් සාමාර්ථය.

**දෙමළ විෂයයෙන් නිදහස් කිරීම :**

(අ) මහා භාණ්ඩාගාරයේ දෙමළ ප්‍රවීණතා විභාගයේ උසස් පෙළින් ලත් සාමාර්ථය,

(ආ) දෙමළ භාෂාමය ලංකා පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය,

(ඇ) දෙමළ භාෂාව විෂයයක් වශයෙන් ඇතිව ඉංග්‍රීසි භාෂාමය ලංකා පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය,

(ඈ) ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙහි දෙමළ භාෂාව (අ) හෝ (ආ) නිර්දේශය.

9. විභාගය පිළිබඳ කාල සටහන පහත සඳහන් පරිදිය :—

පෙ.ව. 9 සිට පෙ.ව. 11 දක්වා=ව්‍යවස්ථා, කාර්‍ය පරිපාටිය සහ කාර්‍යාලයීය ක්‍රම

ප.ව. 1 සිට ප.ව. 2.30 දක්වා=ගිණුම්

ප.ව. 2.45 සිට ප.ව. 4.15 දක්වා=සිංහල/දෙමළ

සිංහල/දෙමළ පිළිබඳ සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනයත්, වේලාවත්, ස්ථානයත් ඊට සුදුස්සන් වන සෑම අපේක්ෂකයෙකු වෙත ම විභාග කොමසාරිස් විසින් වෙන ම දන්වා යවනු ලැබේ.

ප. ධ. උඩුවෙල,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1969 අගෝස්තු 21 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍ර ආකෘතිය**

**(කාර්‍යාලීය ප්‍රයෝජනය සඳහායි)**

## සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකාර පන්තියේ II වැනි ශ්‍රෙණියට උසස් කිරීමේ විභාගය—1969 නොවැම්බර්

1. ඔබේ පුරුදු අත්සන :————.

(අත්සන සහතික කරන නිලධාරියා ඉදිරිපිට දී අත්සන් කළ යුතුයි)

(අ) සියළුම නම් සම්පූර්ණයෙන් :————.

(පැහැදිලි ලොකු අකුරින්)

(ආ) දැනට දරන තනතුර :————.

(ඇ) කාර්‍යාලයීය ලිපිනය :————.

2. උපන් දිනය :————.

3. ඔබ සේවය කරන ස්ථානයට ඉතාම කිට්ටු කච්චේරිය පිහිටි ස්ථානය : ————.

4. ඔබ ලාංකිකයෙක් ද යන වගත් සිංහල ද, ලංකා දෙමළ ද නැතහොත් බර්ගර් ජාතිකයෙක් ද යනාදි වශයෙනුත් සඳහන් කරන්න :————.

5. (i) සාමාන්‍ය ලිපිකාර සේවයට ඇතුළත් වූ දිනය :————. (රජයේ දිස්ත්‍රික් ලිපිකාර සේවයෙන්/අර්ධ ලිපිකාර සේවයෙන්, සාමාන්‍ය ලිපිකාර සේවයට අන්තර් ග්‍රහණය කරන ලද නිලධාරීන් සම්බන්ධයෙන්, සාමාන්‍ය ලිපිකාර සේවයට ඇතුළත් වූ දිනය වනුයේ 1964.10.1 වැනි දිනය වේ. සාමාන්‍ය ලිපිකරු සේවයට අන්තර් ග්‍රහණය කරන ලද තාවකාලික ලිපිකරුවන් විසින් සාමාන්‍ය ලිපිකරු සේවයට අන්තර ග්‍රහණය වීමේ දිනය සඳහන් කළ යුතු ය.)

(ii) 1969 ඔක්තෝබර් 1 වැනි දිනට රජයේ දිස්ත්‍රික් ලිපිකාර සේවයේ/අර්ධ ලිපිකාර සේවයේ සේවා කාලය—(එක් සේවයකට වැඩි නම් සේවා කාලයන් වෙන වෙනම සඳහන් කරන්න.) සාමාන්‍ය ලිපිකාර සේවයට අන්තර් ග්‍රහණය කරනලද තාවකාලික ලිපිකරුවන් සම්බන්ධයෙන් තාවකාලික ලිපිකරු ලෙස පත්වීමේ දිනය සඳහන් කළ යුතු යි :————.

(iii) ඔබේ පත්වීම ස්ථිර කර තිබේ ද :————.

(iv) (අ) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා ඔබ ආදි ප්‍රවේශකයෙක් ද නැතහොත් නව ප්‍රවේශකයෙක් ද :————

(ආ) ඔබ සාමාන්‍ය ලිපිකාර සේවයට/රජයේ දිස්ත්‍රික් ලිපිකාර සේවයට/අර්ධ ලිපිකාර සේවයට හෝ තාවකාලික ලිපිකරුවකු වශයෙන් බඳවා ගනු ලැබුයේ කුමන භාෂා මාධ්‍යයකින් ද :————.

6. නිවේදනයෙහි 8(3) වැනි ඡේදය යටතේ ඔබ ගන්නේ කුමන විෂයය ද යන්න සඳහන් කරන්න :—

සිංහල හෝ දෙමළ :————.

7. සිංහල/දෙමළ විෂයයෙන් නිදහස් කිරීමට සුදුසුකම් ලබා ඇත්නම් එසේ නිදහස් කිරීම සඳහා හිමිකම් ඇත්තේ ගැසට් නිවේදනයේ 8 වැනි ඡේදයේ (iii) වැනි සංලක්ෂ්‍යය යටතේ ද නැතහොත් (iv) වැනි සංලක්ෂ්‍යය යටතේ දැයි යන්න සඳහන් කරන්න. (iv) වැනි සංලක්ෂ්‍යය යටතේ නම් පහත සඳහන් විස්තර සපයන්න :—

(අ) විභාගයේ නම :————.

(ආ) අවුරුද්ද හා මාසය :————.

(ඇ) විභාග අංකය :————.

(ඈ) සිංහල/දෙමළ සම්බන්ධයෙන් සමත් වී ඇති විෂයය :————.

(ඉ) ප්‍රවීණතා විභාගයේ උසස් පෙළින් ද, නැතහොත් ශ්‍රේණිය කුමක් ද යන වග :————.

### දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

මෙම නිලධාරියා :—

(i) සාමාන්‍ය ලිපිකාර සේවයේ සාමාන්‍ය ලිපිකාර පංතියේ ලිපිකරුවකු බව ද, 1969 ................ වැනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නිවේදනය අනුව විභාගයට පෙනී සිටීමට සුදුස්සකු බව ද, ඔහුගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බව ද සහතික කරමි.

(ii) 5 වැනි සහ 7 වැනි කොටුවල සඳහන් කර ඇති විස්තර නිවැරදි දැයි පරීක්ෂා කර බැලූ බව ද ඒවා නිවැරදි බවද සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
පදවි නාමය :————.

දිනය :————.

### අත්සන සහතික කිරීම

අපේක්ෂකයාගේ අත්සන සහ දිනය :————.

**සංලක්ෂ්‍යය.**—අපේක්ෂකයා අත්සන් කළයුත්තේ සිය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හෝ එම ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු හෝ ඔහුගේ ප්‍රාදේශීය ප්‍රධානියා හෝ ඉදිරිපිට දී ය.

මගේ කාර්යාලයේ නිලධාරියකු සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ............. 1969 ............. මස ......... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව මෙයින් සහතික කරමි.

සහතික කරන්නාගේ අත්සන :————.

නම, පදවි නාමය හා තරාතිරම :————.

ලිපිනය :————.

## ලංකා විභාග දෙපාර්තමේන්තුව

### විභාගාපේක්ෂකයන් සඳහා නීති

සියලුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි හෝ පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයට ම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම ;

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයට ම හෝ නුසුදුස්සකු කිරීම ;

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම ;

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම ;

(v) සහතිකපත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම ;

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට බාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත්, රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

### නීති

1. සියලුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාගශාලාධිපතීන්ට ද ඔහුගේ සහකාරයන්ට ද අනික් විභාගාපේක්ෂකයන්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්ත දාන්ත ව හැසිරිය යුතුයි. විභාග ශාලාවට ඇතුළුවන විටත් ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීමට පටන් ගෙන පැය බාගයක් ගත වූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන්ගෙන පැය බාගයක් ගතවනතුරු ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටින අපෙක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටවී යාම ද තහනම් ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචක පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපෙක්ෂකයෙකු ම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුයි. විභාගශාලාධිපතින්ගේ විශෙෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නො කළ යුතුයි. තමන්ට නියම නො කරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්යමණ්ඩලයේ කෙනකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පනිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් ය. යම්කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවකු සමග කතා බස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය අඳුනා ගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපෙක්ෂකයකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනා ගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තරපත්‍ර ප්‍රතික්ෂෙප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසියෙහි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසිතැනක හෝ කිසිවක් නො ලිය යුතුයි. මේ නීතිය නො සැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකා මකා දැමීම හෝ නොකළ යුතුය. කටු වැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද කඩදාසි ඇතුළු පාවිච්චි කරනලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුයි. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුයි. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි.) විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙන යෑම තහනම් ය. එකම ප්‍රශ්නයට පිළිතුරු දෙ තැනක ලියවී තිබෙනම් අනවශ්‍ය පිළිතුර පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැලකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාද හෝ ගණන් කොහෙත් ම නොසාද හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත්, චිත්‍ර කර්මයෙහිදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයකුගේ චිත්‍රයකට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්ව රූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමාන ව එසේ නැතිනම් බොහෝ සෙයින් කිට්ටුව තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතුවිය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටත ගෙන යාම තහනම් ය. මේ සියලු ම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩ කිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතුවෙනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාටපෙට්ටි හෝ ජ්‍යාමිති උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී, ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි, පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාර්ඩ්බෝඩ්, පෑඩ්, නැමූ ප්‍රවෘත්තිපත්‍ර, බ්‍රවුන් පේපර් යනාදියද විභාග ශාලාව තුළ සිටින කිසිවිටක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩකිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියනලද කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් ම තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මෙ මේ යුයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපෙක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීමද හොර උත්තර ලිවීමට යත්න දැරීම ද තහනම් ය. තවත් අපෙක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීමද නොකළ යුතුය. වෙන අයදුම්කරුවකුට උදවු දීමෙන් ද වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ උදව් ලබාගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සසම්පූර්ණ වූ සෑම කඩදාසියක් ම ලියමින් සිටින කඩදාසිය යට තබාගත යුතුයි. ලියන ලද කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත්, ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසි විභාගාපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ. එහෙත් යම්කිසි සහදිසි කරුණක් නිසා විභාගාපෙක්ෂකයකුට ඉන් පිටත යන්නට වුවමනා වූවොත් විභාග ශාලාධිපතීන්ගේ සහකාර නිලධාරියකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත්, නැවත විභාග ශාලාවට ඇතුළුවන විටත් ඔහු සෝදිසියකට භාජන විය යුතුයි.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියනවිට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපෙක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපෙක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපෙක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුයි.

16. විභාගාපේක්ෂකයකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදවු දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

**විභාගාපේක්ෂකයන් සඳහා උපදෙස් :**

විභාගාපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි :—

(i) විභාගය පටන්ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට වත් කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරි හැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත් වීම ගැන හෝ යම් විෂයකට පෙනී සිටීමට ඇති සුදුසුකම ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැලකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නො කිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතුවිය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අනන්‍යතා පත්‍ර (හැඳින්වීමේ පත්‍ර) ඉදිරිපත් කළ යුතු අපෙක්ෂකයන් සෑම විෂයයකට ම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවේදී ඉදිරිපත් නො කළහොත් ඔබේ විභාගාපෙක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්ට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් :—ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ප්‍රස්තාර කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒ බව නොපමාව ම විභාගශාලාධිපතීන්ට දැන්විය යුතුය. විභාග ශාලාවේදී ඔබට ම දෙනු ලබන කඩදසි හැර වෙන මොනම කඩදසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි හො කළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගතහැකිවනසේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක වක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුයි.

(v) විභාගාපෙක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියක ම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසිය දෙපැත්තේ ම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නො හැකි ලෙස නොලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන් කරල ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්න වලට අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයකට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධ ව ප්‍රශ්න පත්‍රයේ මුලින් සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්ස මෙන් කියවා බැලිය යුතුයි. මෙය නො සලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගණ බැලීම් සහ කටුවැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත්, සිත් යොමුකර විය යුතු අවස්ථාවලදී ඒ රූප සටහන නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්න වලට උත්තර ලියූ පිළිවෙළ අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ සියතින් ම බාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේ ම වාඩි වී සිටිය යුතුය. මෙසේ නො කිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය, විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවක යකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද, කඩදසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නො නැගිට අත පමණක් එසවිය යුතුය.

කේ. ඊ. ඩබ්ලිව්. සුමනසූරිය,
වැඩබලන විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

8–1349—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### 1969–70 වර්ෂය තුළ පාන් සැපයීම

1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන බන්ධනාගාරවලට පාන් සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් (ලාංකික යනුවෙන් හැඳින්වෙන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් පුරවැසිකම් ලද්දෝයි) 1969.9.20 දින පෙරවරු 11 දක්වා බන්ධනාගාර අධිකාරීන් විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් පියවා මිනිත්තු පහකට පසු, එනම් පෙරවරු 11.05 ටෙන්ඩර් විවෘත කරනු ලබනවා ඇත. ඒ වෙලාවේදී එහි පෙනී සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන්, ද්‍රව්‍ය සැපයීම සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමේ දී ඉලක්කමින් මෙන්ම වචනයෙන් ද ඒවා සඳහන් කළ යුතුව ඇත. ඉලක්කමින් සඳහන් කොට ඇති මිළ ගණන් වචනයෙන් සඳහන් කිරීමේ දී අසමානත්වයක් ඇතිවී තිබුණහොත් හෝ මිළ ගණන් වචනයෙන් සඳහන් වී නොමැති නම් හෝ එබඳු ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත්තේ ය.

3. සැපයීම පිළිබඳ විස්තර පහත සඳහන් ප්‍රකාරය :—

සපයනු ලබන පාන් වඩා පරණ නොවිය යුතුයි. එමෙන් ම හරි හැටියට නොතැම්බුණ ඒවා ද නො විය යුතුයි. අවුන්ස 6 ප්‍රමාණයක හෝ ඉල්ලුම් කරනු ලබන අන්‍ය පහසු ප්‍රමාණයක හෝ පාන් ගෙඩි වශයෙන් සැපැයිය යුත්තේය.

4. සියලුම ටෙන්ඩර්පත්‍ර අනුපිටපතක් සහිතව ලියුම් කවරයක බහා සීල් තබා නියමිත බන්ධනාගාර අධිකාරීන් වෙත ලියාපදිංචි කරන ලද තැපැලෙන් එවිය යුතුයි. එසේ තැපැලෙන් නො යවනු ලබන ටෙන්ඩර් පත්‍ර නියමිත අධිකාරි තැනට හෝ ඔහු විසින් පත්කරනු ලබන බලය ලත් න්‍යෝජිතයෙකු වෙත් නම් ඔහුට භාර දී ඒ භාරගත් බවට ලියවිල්ලක් ලබාගත යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර බහා ලූ කවරයේ වම් පැත්තේ, උඩ කෙළවරේ, "1969–70 වර්ෂය තුළ..............................................ට පාන් සැපැයීම සඳහා ටෙන්ඩරය " යැයි ලියා මෙහි 1 වැනි ඡෙදයේ සඳහන් වේලාවට ප්‍රථම නියමිත අධිකාරි තැනට ලැබිය යුතු සේ එවිය යුතුයි.

6. ටෙන්ඩර් සඳහා නියමිත පෝර්ම ඒ ඒ ආයතන භාර අධිකාරීන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. නියමිත පෝර්මයේ ලියා නැති ටෙන්ඩරය භාරගනු නොලැබේ.

7. ටෙන්ඩර් පියවා මාස තුන (3) ක් යනතුරු, ටෙන්ඩර්කරුවන් විසින් තමන්ගේ ටෙන්ඩර් පත්‍ර සැළකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

8. ටෙන්ඩර්වල සියලුම වෙනස් කිරීම් හා මැකීම්වලට ටෙන්ඩර් කරුවන් විසින් තම කෙටි අත්සන යෙදිය යුතුයි.

9. මෙහි පහත සඳහන් පරිදි ටෙන්ඩර්පත්‍ර සඳහා තැන්පත් කළ යුතු මුදල් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ (කොළඹ කච්චේරියේ හැර) වෙන ඕනෑම කච්චේරියක තැන්පත් කොට, ඒ බවට කුවිතාන්සිය ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක.

යමෙකුට ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බව ලියමනකින් දන්වනු ලැබී මෙන් දින 10ක් ඇතුළත දී අවශ්‍ය ඇප මුදල් ඉදිරිපත් කිරීමට නුපුළුවන් වීනි නම්, හෝ එසේ කිරීමෙන් වැළැකී සිටී නම්, හෝ තැන්පත් කරන ලද මුදල් රාජසන්තක වෙනවා ඇත. ඉන්පසු රජය සම්බන්ධ කවර කොන්ත්‍රාත්තුවකට හෝ බැඳීමට නො හැකි වන සේ ඔහුගේ නම කොන් ත්‍රාත්තු කඩ කරන්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනවා ඇත. තවද, කොන්ත්‍රාත්තුව කඩ කිරීමේ අලාභ වශයෙන් ලංකාවේ වලංගු මුදලෙන්, ඒ ඒ කොන්ත්‍රාත්තුවට තබා ඇති ඇප මුදලට සමාන මුදලක් රජය වෙනු වෙන්, බන්ධනාගාර කොමසාරිස්වරයාට ගෙවීමට එම ටෙන්ඩර්කරුවනට සිදුවෙනවා ඇත. මෙම මුදල අලාභ වශයෙන් නීති මාර්ගයෙන් අයකර ගැනීමේ බලය බන්ධනාගාර කොමසාරිස්වරයා වෙත පැවරී ඇත.

ටෙන්ඩර් පිළිගත් බව දන්වන නිවේදනය ටෙන්ඩර්කරු විසින් දෙනු ලබන ලිපිනයට තැපැලෙන් යවනු ලැබුවහොත් හෝ නො එසේව එහි ගෙන ගොස් භාරදුනහොත් හෝ එම නිවේදනය ටෙන්ඩර්කරුවා වෙත ලැබුණු ලෙස සලකනු ලැබේ. අන්‍ය සියලු තැන්පත් මුදල් කොන්ත්‍රාත් තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු ගෙවනු ලැබේ.

උපලේඛනයේ සඳහන් පරිදි ඒ ඒ කොන්ත්‍රාත්තුව සඳහා වෙන් වෙන් වශයෙන් ඇප මුදල් තැන්පත් කිරීමේ අවශ්‍යතාවය කෙරෙහි සියලු ටෙන්ඩර් කරුවන්ගේ සැළකිල්ල යොමු කරවනු ලැබේ.

10. සාර්ථක වූ ටෙන්ඩර්කරුවන්, තම කොන්ත්‍රාත්තුව මනා අන්දමින් ඉටු කරන බවට ඇපකරුවන් වශයෙන් ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට කැමැති වගකිව යුතු පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් ඉදිරිපත් කළ යුතුයි. මෙම කොන්ත්‍රාත්තුව ගෙන යෑමේදී කොන්ත්‍රාත්කරුවන් විසින් වැඩෙහි යෙදවිය යුත්තේ ලාංකිකයන් පමණකි.

11. සේවාව නිසියාකාර ඉටු කිරීමේදී දතයුතු සියලුම අවශ්‍ය කරුණු උපලේඛනයෙහි සඳහන් අධිකාරීන්ගෙන් දැනගත හැක.

12. ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින බන්ධනාගාර කොමසාරිස් වරයා සමඟ කොන්ත්‍රාත්තුවට අත්සන් තැබිය යුතුයි. එබඳු නිලධාරි යෙකුගේ පදවි නාමයෙන් අදහස් කළ යුත්තේ ද, ගිණිය යුත්තේ ද, ලංකාණ් ඩුව යටතේ දැනට එම පදවිය දරන්නාවූ නිලධාරියා ද ඔහුට පසුව එම පදවිය දරන්නා වූ නිලධාරියා ද වේ.

ඇෆ්. ඩී. ඇල්. රත්නායක,
බන්ධනාගාර කොමසාරිස්.

1969.8.19 දින,
කොළඹ 9,
බන්ධනාගාර මූලස්ථානයේ දී ය.

## උපලේඛනය

| බන්ධනාගාරය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | ටෙන්ඩර් සඳහා ඇප මුදල රු. | ටෙන්ඩර් භාරගන්නා නිලධාරි තැන |
|---|---|---|---|
| යාපනය | ... 25 | ... 200 | ... යාපනයේ බන්ධනාගාර අධිකාරි |
| අනුරාධපුරය | ... 25 | ... 200 | ... අනුරාධපුරයේ බන්ධනාගාර උප අධිකාරි |
| බදුල්ල | ... 25 | ... 200 | ... බදුල්ල බන්ධනාගාර උප අධිකාරි |
| මඩකලපුව | ... 25 | ... 200 | ... මඩකලපුව බන්ධනාගාර උප අධිකාරි |
| මාතර | ... 25 | ... 200 | ... මාතර බන්ධනාගාර උප අධිකාරි |
| තංගල්ල | ... 25 | ... 200 | ... එම |
| මීගමුව ත.ව.අ.වි. | 25 | ... 200 | ... මීගමුවේ ත.ව.අ.වි. අධිකාරි |
| කෝපායි එ.සි.ක. | 10 | ... 100 | ... අධිකාරි, යාපනය බන්ධනාගාරය |
| තල්දෙන එ.සි.ක. | 10 | ... 100 | ... බදුල්ල බන්ධනාගාර උප අධිකාරි |

8–1334—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—පොළොන්නරුව උප කොට්ඨාශය

1969–70 යන මුදල් වර්ෂය සඳහා පොලොන්නරුව උප කොට්ඨාශයේබඩු බාහිරාදිය ප්‍රවාහනය කිරීම සඳහා ඊශාන කොට්ඨාශයේ ප්‍රාදේශීයවාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1969 සැප්තැම්බර් මස 23 වෙනි අඟහරුවාද පෙ.ව. 10 වන තෙක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 10,000 හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් සහ සමුපකාර සහ ග්‍රාම සංවර්ධන සමිතිවලින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. ටෙන්ඩර් කිරීමට සුදුසුකම් ඇත්තේ අඩු වශයෙන් ලොරි රථ දෙකක් වත් තමා නමින් ඇති කොන්ත්‍රාත්කරුවන්ට වන අතර ටෙන්ඩර් පත ඉල්ලුම් කරන විට තමා නමින් ඇති වාහන ලියාපදිංචි කිරීමේ සහතිකද ඉදිරිපත් කළ යුතුය.

3. පොලොන්නරුව, හිඟුරක්ගොඩ සහ කවුඩුල්ල වාරිමාර්ග කාර්යාල යන්හි ඉංජිනේරු තැනගේ කාර්යාලවලින් 1969 සැප්තැම්බර් 4 දින සිට 1969 සැප්තැම්බර් 20 දින දක්වා කාර්යාල වේලාවන් තුළ ලබාගත හැකි ටෙන්ඩර් පෝර්ම පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන විට තමා කොන්ත්‍රාත්කරුවකු වශයෙන් ලියාපදිංචි වී ඇති රෙජිස්ටර් පොත සහ දැනට රජය යටතේ කරනු ලබන කොන්ත්‍රාත් වැඩ පිළිබඳ සහතිකයක්ද ඉදිරිපත් කළ යුතුය. කොළඹ හැර දිවයිනේ ඕනෑම කච්චේරියක රු. 25 මුදලක් තැන්පත් කොට ලබාගත් රිසිට් පතක් ඉදිරිපත් කළ පසු පමණක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ඇත.

4. වැඩි විස්තර අවශ්‍ය වෙතොත් වාරිමාර්ග ඉංජිනේරු තැන පොලොන් නරුව වෙතින් ලබාගත හැක.

වාරිමාර්ග ඉංජිනේරු, පොලොන්නරුව.

1969 අගෝස්තු මස 18 වැනි දින.

8–1327—69.8.29 දින දරන අංක 14,869 ගැසට් පත්‍රය

---

## ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව

### සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දන්වීමයි

මෙම කාර්යාලයේ, පලාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන් ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

### වැඩ ලැයිස්තුව

| | | | |
|---|---|---|---|
| 1. | වීරකොඩියාන මහවැව | ... ඇල අවසානයේ බැම්මක් බැඳීම | ක.හ.ප. |
| 2. | වීරකොඩියාන මහවැව | ... වැව් බැම්ම බැඳීම | ... ක.හ.ප. |
| 3. | ගුරුවැව | ... දියුණු කිරීම | ... ක.හ.ප. |
| 4. | බෝහන්දිය වැව | ... දියුණු කිරීම | ... ක.හ.ප. |
| 5. | අමුණුපිටිය වැව | ... දියුණු කිරීම | ... ක.හ.ප. |
| 6. | පොතානෙගම වැව | ... දියුණු කිරීම | ... ව.හ.ප. |
| 7. | හෙට්ටිගම වැව | ... හොරොව්ව සෑදීම | ... ව.හ.ප. |
| 8. | මාපිටිගම වැව | ... හොරොව්ව සෑදීම | ... ව.හ.ප. |
| 9. | ඉකිරියවත්තේගම වැව | ... ප්‍රතිසංස්කරණය කිරීම... | ව.හ.ප. |
| 10. | නිකවැව | ... ප්‍රතිසංස්කරණය කිරීම... | හි.හ.ප. |
| 11. | රඹෑගම් වැව | ... ප්‍රතිසංස්කරණය කිරීම... | හි.හ.ප. |
| 12. | කුඹුක්ගහමුල අමුණ | ... රෙගුලේටරයක් සෑදීම | හි.හ.ප. |
| 13. | ගල්අමුණ | ... ප්‍රතිසංස්කරණය කිරීම | හි.හ.ප. |
| 14. | ගල්කඩවල වැව | ... ප්‍රතිසංස්කරණය කිරීම | ව.හ.ප. |
| 15. | ඔටවුකුලම වැව | ... ප්‍රතිසංස්කරණය කිරීම... | ව.හ.ප. |
| 16. | මීගහ බැම්ම | ... බැම්මක් බැඳීම | ... ක.හ.ප. |
| 17. | කීනගස්පිටිය බැම්ම | ... බැම්මක් බැඳීම | ... ක.හ.ප. |

| | | | |
|---|---|---|---|
| 18. | බයව අමුණ ... | ආදණියායට අමුණු සෑදීම | දෙ.මැ.හ.ප. |
| 19. | තලාකොල වැව ... | බැම්මක් බැඳීම ... | හි.හ.ප. |
| 20. | ඔලින්දුවාවෙ ඇල ... | ඇල බැඳීම ... | වැ.වි.හ.ප. |
| 21. | ගල්කඩුල්ලෙ වැව ... | අළුත්වැඩියාව ... | ද.දෙ.හ.ප. |
| 22. | ගලකුඹුරෙ අමුණ ... | අමුණ බැඳීම ... | වැ.වි.හ.ප. |
| 23. | බලගොල්ල මහවැව ... | දියුණු කිරීම ... | හි.හ.ප. |

2. සෑම ටෙන්ඩර් පත්‍රයක් ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ ඒ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969.9.13 වන දින දවල් 12 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිල ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම් වලින් මෙන්ම වචනවලින්ද දක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි වියයුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සෑමෙකක් ම, ටෙන්ඩර් කරුගේ කෙටි අත්සන යොද සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොද, සීල් තබන ලද ලියුම් කවරවල බහා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ උඩ වම් කෙළවරේ ''..............සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය'' යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර 1969.9.14 වන දින පෙ.ව. 9.30 ට පෙර කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. නොඑසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති ''ටෙන්ඩර් පෙට්ටියට'' දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාර ගන්නාවූ නිලධාරි තැන විසින් හෝ ලියවිල්ලකින් දනුම් දෙනු ඇත. මේ දනුම්දීම නිකුත් කළ දින සිට, දශ දිනක් ඇතුළත දීඑම ටෙන්ඩර්කරු විසින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමඟ ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුළත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5% ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුළත්වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දන්වීමෙන් පසුවද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම් රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාමලේඛනයට ඇතුලත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරය නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමග නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතූන් උඩ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂාකර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුළදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන්ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. ''ලාංකික'' යනුවෙන් අදහස් වන්නේ පරම්පරා වෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12. තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. ''ගොවිජන සේවා සහකාර කොමසාරිස්'' යනුවෙන් හැඳින්වෙන්නේ දනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරිතැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියාකරන වෙනත් නිලධාරියෙකු විසින් 1969 සැප්තැම්බර් මස 14 වෙනි දින පෙ.ව. 10 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දන ගැනීම සඳහා ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඩී. එෆ්. බාලචන්ද්‍ර,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
කුරුණෑගල දිස්ත්‍රික්කය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ,
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලය,
1969 අගෝස්තු මස 19 වෙනි දින.

8—1371—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—නිකවැරටිය උප කොට්ඨාශය

නිකවැරටිය උප කොටසට අයත් පහත සඳහන් සේවාවන් සඳහා 1969 සැප්තැම්බර් මස 23 වැනි අඟහරුවාදා පෙරවරු 10. දක්වා කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම සිදුකෙරේ:—

| | සේවා විස්තර | අවශ්‍ය ලියාපදිංචි මුදල රු. | ටෙන්ඩර් තැන්පත් මුදල රු. |
|---|---|---|---|
| 1. | වැලියාව අන්දර වැව වැඩි දියුණු කිරීම ... | 30,000 ... | 50 |
| 2. | උස්ගල සියඹලන්ගමුව ප්‍රවේශ පාරට ගල් සහ තාර දැමීම ... | 20,000 ... | 25 |

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහත දක්වෙන ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්, සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති වලට මෙම වැඩ සඳහා ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ හැකිය.

1969 සැප්තැම්බර් 20 වැනි දින දක්වා කාර්යාල වේලාවලදී නිකවැරටිය/ කුරුණෑගල/පුහුණු කිරීමේ මධ්‍යස්ථානය, ගල්ගමුව යන වාරිමාර්ග කාර්යාල වලින් ලබා ගත හැකි පෝරම වල ටෙන්ඩර් අයදුම්පත් සකස්කළ යුතුයි. ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දනට ඔවුන් කරණ වාරිමාර්ග වැඩවල වටිනාකම දක්වෙන ප්‍රකාශනයක් වාරිමාර්ග ඉංජිනේරු වෙත ඔවුන්ට ටෙන්ඩර් පෝරම නිකුත් කිරීම සුදුසුද නැද්ද සලකා බැලීම සඳහා ඉදිරිපත් කල යුතුයි. ටෙන්ඩර් පෝරම නිකුත් කිරීමට පෙර ඉහත දක්වෙන පරිදි ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

මේ සම්බන්ධයෙන් අවශ්‍ය විස්තර කාර්යාල වේලාවන් තුළ දී නිකවැරටිය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

කේ. එස්. සිතම්පරපිල්ලෙයි,
වාරිමාර්ග ඉංජිනේරු,
නිකවැරටිය උප කොටස.

1969.8.17,
වාරිමාර්ග කාර්යාලය,
නිකවැරටිය.

8—1293—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—කන්තලේ උප කොට්ඨාශය

කන්තලේ උප කොට්ඨාශයේ බඩු ප්‍රවාහණය 1969–70 වර්ෂය සඳහා ටෙන්ඩර් පත් 1969 සැප්තැම්බර් 20 වැනි සෙනසුරාද පෙ.ව. 10 දක්වා ත්‍රිකුණාමල කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම එහිදී සිදු කෙරේ.

2. ප්‍රවාහන වාහන හිමි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 15,000 කට වැඩි ගණනකට පුහුණු වැඩ සඳහා ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිතිවලට සහ ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

3. 1969 සැප්තැම්බර් 15 වෙනි සඳුද ප.ව. 3 වන තෙක් (එදිනද ඇතුළුව) කායසීාල වේලාවන් තුළදී කන්තලේ, ත්‍රිකුණාමලය, අල්ලේ යන වාරිමාර්ග ඉංජිනේරු කායසීාල වලින් ලබාගත හැකි පෝර්මවල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශනයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝරම නිකුත් කිරීමට ප්‍රථම රුපියල් 25ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායසීාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන් සතුව ඇති ලොරිවල විස්තර, එවායේ ලියාපදිංචි අංකය, ප්‍රමාණය යනාදී විස්තර සැපයිය යුතුය.

4. මෙම ටෙන්ඩරය ගැන සියලුම විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලසුම, විශේෂ විස්තර යනාදිය කායසීාලීය වේලාවන් තුළදී කන්තලේ උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

සී. සූපාලසිංහම්,
වාරිමාර්ග ඉංජිනේරු,
කන්තලේ උප කොට්ඨාශය.

1969 අගෝස්තු මස 16 වැනි දින,
කන්තලේ වාරිමාර්ග කායසීාලයේ දී.

8-1326—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (ව්‍යාප්ති අංශය)

### කෘෂි-රසායනික ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම—1969/70 මහ කන්නය සඳහා

1969/70 මුදල් වර්ෂය තුළ මීට යා කොට ඇති උපලේඛනයේ සඳහන් කෘෂි-රසායනික ද්‍රව්‍ය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට සැපයීම උදෙසා ඉදිරිපත් කරන ටෙන්ඩර් පත් කොළඹ 2, යූනියන් පෙදෙසේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969 සැප්තැම්බර් මස 20 වැනි දින ප.ව. 2.30 දක්වා භාර ගනු ලැබේ. මෙම කෘෂි-රසායනික ද්‍රව්‍ය තමන් ළඟ දැනටමත් ගබඩාකර ඇති තොග වලින් සැපයිය යුතු අතර, එම ද්‍රව්‍ය අසුරා ඇති බෝතල හෝ වෙනත් භාජන හිස් වූ පසු ආපසු භාර නොදෙන බව සැළකිය යුතු ය.

2. රේගු ගාස්තු, ඇසිරීම්, ප්‍රවාහන, එහාමෙහා ගෙන යාම් ආදී සියළු වියදම් ඇතුළුව, පහත දක්වා ඇති ප්‍රමාණයේ පිප්ප, බෝතල් හෝ දවටන වලින් ඇනැවුම් කරණු ලබන අවස්ථාවල දී එසේ ඇනැවුම් කරණ ප්‍රමාණවලින් කොළඹ 5, නාරාහේන්පිට, මධ්‍යම කෘෂිකර්ම ගබඩාව වෙත ගෙනැවිත් භාරදීම සඳහා පහත දක්වා ඇති ප්‍රමාණයේ පිප්පයකට, බෝතලයකට හෝ පැකැට්ටුවකට අය කරන මිළ ගණන් දක්වන ලෙස ටෙන්ඩර් කරුවන් ගෙන් ඉල්වනු ලැබේ. තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කෘෂි-රසායනික ද්‍රව්‍ය යථෝක්ත සංයෝගවලට අනුකූල බවට නිෂ්පාදිකයින්ගේ සහතිකයක් ටෙන්ඩර් සමග ටෙන්ඩර්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතු ය.

3. කොළඹ 7, අංක 9, හෝටන් පෙදෙස් පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාප්ති) ගෙන් ලබා ගත් ආකෘති පත්‍රවල අනු පිටපතක්ද සහිතව ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ යුතු ය. සියළුම ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, යූනියන් පෙදෙස් කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති නමට 1969 සැප්තැම්බර් මස 20 වැනි දින ප.ව. 2.30 ට පෙර ඔහුට ලැබෙන සේ එවිය යුතු අතර, ටෙන්ඩර් බහාලන කවරයේ වම් පස මුදුන් කෙළවර '' කෘෂි රසායනික ද්‍රව්‍ය සඳහා ටෙන්ඩර්—මහ 1969/70, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, (ව්‍යාප්ති අංශය) '' යනුවෙන් සඳහන් කර තිබිය යුතු ය.

4. ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, යූනියන් පෙදෙසේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතු ය. නැතහොත් ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය. ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ නියෝජිතයෙකු මගින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර '' කෘෂි-රසායනික ද්‍රව්‍ය සඳහා ටෙන්ඩර් (මහ) 1969/70, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, (ව්‍යාප්ති අංශය) '' යනුවෙන් ද ටෙන්ඩර් කරු ගේ නම සහ ලිපිනය ද කවරයේ සටහන් කර ටෙන්ඩර් භාර ගැනීමට බලය ලත් නිලධාරියා වූ කොළඹ 2, යූනියන් පෙදෙසේ, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ සහකාර ලේකම්තැන වෙත අතින් භාර දී ඒ සඳහා රිසිට් පතක් ලබාගත යුතු ය. අත්සන් කිරීම සඳහා සපයා ඇති ස්ථානයෙහි නියමිත ලෙස අත්සන් තබන ලද ටෙන්ඩර් කොන්දේසි මාලාවේ පිටපතක් ද ටෙන්ඩර් පත්‍රය සමඟ එවිය යුතු ය.

5. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දින වශයෙන් ඉහත සඳහන් දින එකී වේලාවට කොළඹ 2, යූනියන් පෙදෙසේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ දී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන් ගේ බලය ලත් නිලධාරීන්ට ටෙන්ඩර් විවෘත කරන වේලාවේ දී පැමිණ ටෙන්ඩර් පිටපත් පරීක්ෂා කර බැලීමට අවසර දෙනු ලැබේ.

6. ටෙන්ඩරයකට ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 100 බැගින් තැන්පත් කරන ලද කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969.9.19 වැනි දින දවල් 12 වනතුරු නිකුත් කරනු ලැබේ. පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ තමන් කැමැති කච්චේරියක මෙම මුදල් තැන්පත් කළ හැක. ටෙන්ඩරය පිළිගත් බව දන්වා දින 10 ක් තුළ අවශ්‍ය ඇප මුදල තැන්පත් කිරීමටත්, ගිවිසුමකට ඇතුළත් වීමටත්, පිළිගත් ටෙන්ඩර්කරුට නොහැකි වුවහොත්, ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කිරීමටත්, ඔහුගෙන් රජයට අය විය යුතු වෙනත් මුදලක් අය කර ගැනීමට බාධාවක් නොවන පරිදි ඔහුගේ නම රජයේ වැඩ පැහැර හරින ලද කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයෙහි ඇතුළත් කිරීමටත් ඉඩ තිබේ.

7. නියමිත පෝර්මයේ ඉදිරිපත් කර නො මැති, ටෙන්ඩර් කොන්දේසි මුළුමනින් ම අනුගමනය කර නොමැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් පිළිගනු නො ලැබේ. ටෙන්ඩර් ගාස්තු ප්‍රමාණ හා මුළු ගණන් පැහැදිළි ලෙස තීන්තෙන් සඳහන් කර තිබිය යුතු අතර, සියළුම වෙනස් කිරීම් හා මැකීම් ටෙන්ඩර්කරු විසින් සහතික කර තිබිය යුතු ය. ටෙන්ඩර් කරන ලද මුදල ඉලක්කමෙන් මෙන් ම අකුරින් ද දක්වා තිබිය යුතු ය. අකුරින් දක්වා ඇති මුදල ඉලක්කමෙන් දක්වා ඇති මුදල හා නො සැසඳේ නම් ටෙන්ඩර් පත්‍රය ප්‍රතික්ෂේප වීමට ඉඩ තිබේ.

8. ටෙන්ඩර්කරුවන් විසින් සිය ලිපිනයන් ටෙන්ඩර් පත්‍රිකාවල පැහැදිළි අකුරින් දක්වා තිබිය යුතු ය.

9. ඉහත 1 වැනි ඡෙදයෙහි දක්වා ඇති සැපයීම් සියල්ලම වෙනුවෙන් හෝ ඉන් කොටසක් පමණක් වෙනුවෙන් ටෙන්ඩර් කිරීමේ නිදහස ටෙන්ඩර් කරුවන් සතු ය.

10. ටෙන්ඩර්කරුවන් විසින් දක්වනු ලබන සියළුම මිල ගණන් ටෙන්ඩර් භාරගන්නා අවසාන දින සිට යටත්පිරිසෙයින් දින 60 ක් ගතවනතුරු පිළිගත යුතු ස්ථිර මිළ ගණන් විය යුතු ය.

11. ඉල්ලා සිටිනු ලැබූ විට ඒ ඒ අවස්ථාවන්හි දී අවශ්‍ය ප්‍රමාණයේ තොග වලින් කෘෂි-රසායනික ද්‍රව්‍ය සැපයීමට පිළිගත් ටෙන්ඩර්කරුට හැකි විය යුතු ය. මෙම අවශ්‍ය ප්‍රමාණ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා හෝ ඔහුගේ නියෝජිතයා විසින් කලින් කලට ටෙන්ඩර්කරුට දන්වනු ලැබේ. ටෙන්ඩර්කරු වෙත දන්වනු ලැබූ විට, එසේ ඉල්වනු ලැබූ ප්‍රමාණයේ පිප්ප, බෝතල් හෝ පැකට් වලින් ඉල්වනු ලැබූ දින සිට දින 7 ක් ඇතුළත සැපයීම් කිරීමට ටෙන්ඩර් කරුට සිදු වේ.

12. අවුන්ස 16 බෝතල්වල සැපයියයුතු ද්‍රව්‍ය අවුන්ස 16 ඇම්බර් පාට බෝතල්වල අසුරා එම බෝතල් සුළු සොරකම් වැලැක්වන කාන්දුවීම වලක්වන වැසුමකින් යුතුව අනුමත කරන ලද සැලැස්මකින් මුද්‍රා තබා සැපයිය යුතුය. අනිකුත් ප්‍රමාණයන්ට සැපයිය යුතු ද්‍රව්‍යයන් එම ප්‍රමාණ බෝතල්වල දමා කාන්දුවීම් සහ සුළු සොරකම් වලක්වන වැසුමකින් යුතුව අනුමත කරන ලද සැලැස්මකින් සැපයිය යුතු ය.

13. සියළුම අසුරනයන් සුදුසු ලෙස ලේබල් ගසා තිබිය යුතු අතර, සෑම ලේබලයකම පහත සඳහන් විස්තර ඇතුළත් විය යුතු ය.

(1) වර්ගයේ නම :—

(2) නිෂ්පාදනයේ රසායනික නම හෝ සාමාන්‍ය නම :—

(3) අඩංගුවී ඇති ශක්‍රිය කොටස් සියයට ප්‍රමාණය :—
(උදා : ඩී.ඩී.ටී. 20%)

(4) කෘෂි–රසායනික ද්‍රව්‍ය පාවිච්චි කළ යුතු අවස්ථාව සහ එය පරිහරනය කිරීම ගැන සරල උපදෙස්. (සිංහලෙන් හා දෙමළෙන්)

(5) " ..........................................................විසින් ගිවිසුමක් යටතේ (තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුගේ නම) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අනුරූ සපයන ලදී."

14. අවුන්ස 16 යේ බෝතල්, පොටවල් 5 ක් ඊට වැඩි ගණනකින් යුතු රැළි දමූ කඩදසි බෝඩ් වලින් සාද එක් එක් බෝතලය අනෙකට නො ගැටෙන සේ ඇතුළත බෙද වෙන් කළ පෙට්ටිවල අසුරා සැපයිය යුතුය. එක් පෙට්ටියක් බෝතල් 18 සිට 24 දක්වා ගණනකින් සමංවිතව තිබිය යුතු අතර, සෑම පෙට්ටියකම බෝතල සම ගණනක් ඇසිරිය යුතුය. බෝතල පරීක්ෂා කිරීමට හැකි වන සේ සපයන අවස්ථාවේ දී සෑම පෙට්ටියකම උඩ පියන නො අලවා තිබිය යුතු අතර, පරීක්ෂණයෙන් පසු ඇලවීම සඳහා අවශ්‍ය මැලියම් ගෑ පටි සැපයිය යුතු ය.

15. 11 වැනි ඡෙදයෙහි සඳහන් කාලසීමාව තුළ අවශ්‍ය සැපයීම් කිරීමට නොහැකි වුවහොත් එම කාලසීමාව ඉක්මවා සැපයීම ප්‍රමාදවන සෑම දිනක් වෙනුවෙන් ම, රුපියල් 50 බැගින් ප්‍රමාණ කළ අලාභ ගෙවීමට කොන්ත්‍රාත්කරුට සිදු වේ. එවැනි අවස්ථාවක දී කොන්ත්‍රාත්කරුට සැපයිය නො හැකි වන සැපයීම්, කොන්ත්‍රාත්කරුගේ වියදමෙන් වෙනත් මාර්ග වලින් ලබා ගැනීමේ අයිතිය කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතු වේ.

16. සියළුම ටෙන්ඩර් පත්‍ර හෝ සමහර ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේ අයිතියත්, ටෙන්ඩර් පත්‍රයකින් කොටසක් පිළි ගැනීමේ අයිතියත්, අවශ්‍ය ප්‍රමාණ වලින් ඇනැවුම් කිරීමේ අයිතියක් රජය සතු වේ. කොන්ත්‍රාත්තුවේ දක්වා ඇති මුළු ප්‍රමාණයම මිළ දී නො ගැනීමේ හේතුවෙන් රජයෙන් අලාභ ඉල්ලා සිටීමේ අයිතිය කොන්ත්‍රාත්කරුට හිමි නො වේ.

17. ටෙන්ඩර් කරන ලදුව පිළිගනු ලැබුවා වූ සැපයීම්වල මුළු වටිනාකමෙන් 5%ක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා ගේ නමින් තැන්පත් කිරීමටත්, ගිවිසුමකට ඇතුළත් වීමටත්, තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරුට සිදු වේ. මෙම ඇප මුදල කැමැති කච්චෙරියක හෝ පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ හැකි ය. මෙම ඇප මුදල ආවරණය කිරීම සඳහා පිළිගත් බැංකුවකින් ඉදිරිපත් කරන බැංකු සහතිකයක් යක් වුව ද පිළිගනු ලැබේ. මෙම මුදල ආපසු ගෙවනු ලබන්නේ කොන්ත්‍රාත්තුව සතුටුදායක ලෙස නිම කිරීමෙන් පසු ය. තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරුට කොන්ත්‍රාත්තුව සතුටුදායක ලෙස නිම කිරීමට නො හැකි වුවහොත් මෙම ඇප මුදල රාජසන්තක වනවාත් හැර ඔහුගේ නම රජයේ වැඩ පැහැර හරින ලද කොන්ත්‍රාත් කරුවන් ගේ නාම ලේඛණයට ඇතුළත් කිරීමට ද ඉඩ තිබේ.

18. ගිවිසුමට හා/හෝ බැඳුම්කරයකට ඇලවිය යුතු මුද්දර ගාස්තු තෝරා ගත් ටෙන්ඩර්කරු විසින් දැරිය යුතු ය.

19. ටෙන්ඩර් කරන ලද කාර්යය ඉටු කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරුට සිදු වේ.

කොන්ත්‍රාත්තුවේ මෙම කොන්දේසිය කඩ කිරීම කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට හේතු වේ. එසේ වතුදු විශේෂ අවස්ථාවන්හි දී කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ ද එකහතාවය ඇතිව තමා විසින් ලියවිල්ලකින් විශේෂයෙන් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් යෙදවීමට කොන්ත්‍රාත් කරුට බලය දීමට කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාට හැකි ය.

එවැනි එකහත්වයකින් හා ලියවිල්ලකින් බලය දීමකින් තොරව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර, කොන්ත්‍රාත්තුව කොන්දේසි කඩකිරීමක් වශයෙන් ද සළකනු ලැබේ

පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලාංකික පුරවැසියෙකු වීම වශයෙන් මෙම කොන්ත්‍රාත්තුවේ කාර්යයන් සඳහා " ලාංකික " යන්නෙහි අර්ථ විග්‍රහ කරනු ලැබේ.

20. කොන්ත්‍රාත්කරුගේ සේවකයෙකු විසින් හෝ සේවකයෙකු වෙනුවෙන් 1934 අංක 19 (117 වැනි අධිකාරය) දරණ සේවක වන්දි ආඥපනත යටතේ වන්දි ඉල්ලීම් වලින් රජය නිදහස් කිරීමට කොන්ත්‍රාත්කරුට සිදු වේ.

21. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු වූ දන්වීම් ඔහුට හෝ ඔහු ගේ නියෝජිතයාට පෞද්ගලිකව භාර දුනහොත් (සමාගමක් නම් එහි නියෝජිතයා හා ලේකම් ද ඇතුළුව) හෝ ටෙන්ඩරයෙහි දක්වා ඇති ලිපිනයට තැපෑලෙන් යැවුව හොත්, ඔහු අතටම පත් කළා සේ සළකනු ලැබේ. කොන්ත්‍රාත්කරු විසින් සිය පදිංචිය හෝ කාර්යාලය වෙනත් ස්ථානයකට ගෙන යනු ලැබුව හොත් එම වෙනස සම්බන්ධයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත නොපමාව ලිපියකින් දන්විය යුතු අතර, එවැනි දන්වීමේ ලිපියක් ලැබෙන තුරු කොන්ත්‍රාත්කරු වෙත යැවිය යුතු ලිපි, දන්වීම් හෝ වෙනත් ලියකියවිලි ඔහු අතටම භාර දුන්නා සේ සියළුම කටයුතු සඳහා සැළකීමට හේතු වේ.

22. සේවයේ යෙදවීම, අහිතකරය යි සළකනු ලබන ඕනෑම කම්කරුවෙකු කොන්ත්‍රාත්කරු විසින් සේවයේ යෙදවීම සම්බන්ධයෙන් විරුද්ධ වීමේ අයිතිය රජය සතු ය.

23. රජයේ වැඩ පැහැර හරින ලද කොන්ත්‍රාත්කරුවන් ගේ නාම ලේඛණයෙහි තනි වශයෙන් හෝ වෙනත් අයෙකු ගේ නමුත් සමඟ දක්වා ඇති කිසිම පුද්ගලයෙකු සමඟ හෝ තමාට සෑහේ ය යි ඒත්තු යන කරුණු උඩ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විරුද්ධවන කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවට බැඳෙනු නො ලැබේ.

24. අවශ්‍ය වුවහොත් කොන්ත්‍රාත්කරු ගේ වියදමෙන් බැඳුම්කරයකට අත්සන් තැබීම අවශ්‍ය වන ඇපකරුවන් දෙදෙනෙකු සපයා ගැනීමට තෝරා ගනු ලබන ටෙන්ඩර්කරුට සිදු වේ. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් මෙසේ නම් කරනු ලබන ඇපකරුවන් දෙදෙනා කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විසින් අනුමත කරන අයවළුන් විය යුතු ය.

25. සපයනු ලබන කෘෂි-රසායනික ද්‍රව්‍ය සම්බන්ධ රාජ්‍ය භාග හා/හෝ පේටන්ට් හිමිකම් වලින් රජය නිදහස් කිරීමට ටෙන්ඩර්කරුවන් බැඳී සිටී

26. කෘෂි–රසායනික ද්‍රව්‍ය සැපයීම අසතුටුදායක වීම හෝ කොන්ත්‍රාත්තුවේ කොන්දේසි නොපිරිහෙලා ඉටු නො කිරීමේ හේතුවෙන් කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමේ අයිතිය කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතු ය.

27. කොළඹ 7, හෝටන් පෙදෙසේ අංක 9 දරණ ස්ථානයේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාප්ති) වෙත ඉල්ලුම් කිරීමෙන් මේ පිළිබඳ වැඩි විස්තර ලබා ගත හැක.

ඊ. අබේරත්න,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාප්ති).

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, තැ. පෙ. අංක 536,
අංක 9, හෝටන් පෙදෙස, කොළඹ 7,
1969 අගෝස්තු මස 18 වැනිදා.

## උපලේඛනය

### පලිබෝධක

| අංකය | කෘෂි-රසායනික ද්‍රව්‍ය | ප්‍රමාණය | පැකැට්ටුවේ ප්‍රමාණය |
|---|---|---|---|
| 1/1 ... | සියයට 25 ඉමල්සිපයබල් සාන්ද්‍රයක් වශයෙන් ඩයික්ලෝරෝ ඩිපිනිල් ට්‍රයික්ලෝරෝඊතේන් (ඩී.ඩී.ටී.) සහිත කෘමි නාශකය | 5,000 (ගැ. 500) | ... දියර අවුන්ස 16, ලේබල් සහ සුළු සොරකම් වලක්වන වැස්ම සහිත බෝතල් |
| 1/2 ... | 50% ජලයෙහි දිය කළහැකි කුඩු වශයෙන් ඩයික්ලෝරෝ ඩිපිනිල් ට්‍රයික්ලෝරෝඊතේන් (ඩී.ඩී.ටී.) | 1,000 (රා. 5,000) | ... ලේබල් සහිත සීල් තබන ලද රා. 5 පැකට් |
| 1/3 ... | 50% එස් (අයි.සී. (ඊතොක්සිකාබොනිල්) ඊතයිල්) ඩයිමිතයිල් පොස්පො රෝතියෝ ලොතියෝනේට් (මැලිනියොන්) සහිත කෘමි නාශකය, ඩියෝඩරයිස්ට් ඉමල්සිපයබල් සාන්ද්‍රයක් | 5,000 (ගැ. 500) | ... දියර අවුන්ස 16, ලේබල් සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල් |
| 1/4 ... | 5% කුඩ වශයෙන් මැලතියොන් කෘමිනාශක ... | 200 (රා. 200) | ... ලේබල් සහ සීල් සහිත රා. 1 පැකට් |

| අංකය | කෘෂි-රසායනික ද්‍රව්‍ය | ප්‍රමාණය | පැකැට්වුවේ ප්‍රමාණය |
|---|---|---|---|
| 1/5 ... | 1.3% ගම්මා බෙන්සීන්හෙක්ස්අක්ලෝරයිඩ් සහත කෘමිනාශක කුඩු වලින් | 10,000 (රු. 50,000) | ... ලේබල් සහ සීල් සහිත රු. 5 පැකට් |
| 1/6 ... | 3% ගම්මා බෙන්සීන් හෙක්ස්ස ක්ලෝරයිඩ් සහිත කෘමිනාශක කුඩු ... | 500 (රු. 250) | ලේබල් සහ සීල් සහිත රු. 5 පැකට් |
| 1/7 ... | 6% ගම්මා බෙන්සීන්හෙක්ස්සක්ලෝයෙඩ් සහිත කෘමිනාශකය කැට සහිත මිශ්‍රණයක් | (1) 6,000<br>(2) 1,000 | ... සීල්, ලේබල් සහිත රු. 5 පැකට්<br>... සීල්, ලේබල් සහිත රු. 55 පැකට් |
| 1/8 ... | 26% ගම්මා බෙන්සීන්හෙක්ස්සක්ලෝරයිඩ් සහිත කෘමිනාශක, ජලයෙහි විසුරුවාලිය හැකි කුඩු වශයෙන් | 500 (රු. 500) | ... සීල්, ලේබල් සහිත රු. 1 පැකට් |
| 1/9 ... | 20% ගම්මා බෙන්සීන්හෙක්සාක්ලෝරයිඩ් සහිත කෘමිනාශක ඉමල්සි පයබල් සාන්ද්‍රයක් | 1,000 (ගැ. 100) | ... දියර අවුන්ස 16, ලේබල් සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල් |
| 1/10 ... | 80% 1–නැප්තිල් එන් මිතයිල් කාබනේට් (කාබරිල්) කෘමිනාශක දියේ විසිරිය හැකි කුඩක් වශයෙන් | (1) 400 (රු. 100)<br>(2) 200 (රු. 200) | ... (1) ලේබල් සහ සීල් සහිත අවු· 4 පැකට්<br>... (2) ලේබල් සහ සීල් සහිත රු. 1 පැකට් |
| 1/11 ... | 80% 0–0–ඩයිමිතයිල් 1–1 හයිඩ්‍රොක්සි 2.2.2. ට්‍රයික්ලෝරෝ ඊතල් පොස්පනේට් සහිත කෘමිනාශකය ජලයෙහි ඉසිය හැකි කුඩක් වශයෙන් (ඩිප්තරෙක්ස් දි.ඉ.හැ.කු.) | 640 (රු. 200) | ... සීල්, ලේබල් සහිත අවුන්ස 5 පැකට් |
| 1/12 ... | 50% 0–0–ඩයිමිතයිල් 1–1 හයිඩ්‍රොක්සි–2–2–ට්‍රයික්ලෝරෝ ඉතයිල් පොස්පොනේට් සහිත කෘමිනාශක ඉමල්සිපයබල් සාන්ද්‍රයක් වශයෙන් | 200 (ගැ. 20) | ... දියර අවුන්ස 16, ලේබල් සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල් |
| 1/13 ... | 60% 0–0–ඩයිඊතයිල් 0–(2–අයිසොප්‍රොයිල්–4 මිතයිල්–6–පයරිමිඩිනිහ්) පොස්පොරෝතියෝඒට් කෘමිනාශකය, ඉමල්සිපයබල් සාන්ද්‍රයක් වශයෙන් (ඩයසිනොනන් තෙ.හැ.කු.) | 500 (ගැ. 500) | ... දියර අවුන්ස 2 ලේබල් සහ සුළු සොරකම් වැලැක්වන වැසුම් සහිත බෝතල් |
| 1/14 ... | 40% 0.0–ඩයිඊතයිල් 0–(2–අයිසොප්‍රොයිල්–4 මිතයිල්–6 පයිරිමිඩනිල්) පොස්පොරෝතියෝ (ඩයිසිනොන් තෙ.හැ.කු.) | 200 (රු. 200) | ... ලේබල් සහ සීල් සහිත රු. 1 පැක |
| 1/15 ... | 75% 3–මිතයිල්–4 ඩයිමිතයිල් ඇමිනොපිනිල්–එන්–මොනොතිල් කාබමේට් සහිත කෘමිනාශකය, ජලයෙහි දියකළ හැකි කුඩක් වශයෙන් (මැටසිල් තෙ.හැ.කු.) | 400 (රු. 200) | ... ලේබල් සහ සීල් සහිත රාත්තල් භාගයේ පැකට් |
| 1/16 ... | 25% 0.0. ඩයිතියිල්–ස්–2 (එතිල්සල්පිනිල්) එතිල්තියොන්පොස්පේට් සහිත කෘමිනාශකය (මෙටාසිස්ටොක්ස් ආර්. 25) | 1,000 | ... ලේබල් සහ සීල් සහිත 10 සී.සී. ඇළුමිනියම් භාජන |
| 1/17 ... | 20% 1, 2, 3, 4, 10, 10–හෙක්සිසාක්ලෝරෝ 1, 4, 4අ, 5, 8, 8අ, හෙක්ස්සා හයිඩ්‍රොඑක්සෝ–1, 4–එන්ඩෙ–5.8 ඩයිමිතනො නැප්තලීන් (ඇල්ඩ්‍රින්) සහිත කෘමිනාශක ඉමලිසිපයබල් සාන්ද්‍රයක් වශයෙන් | 3,000 (ගැ. 300) | ... දියර අවුන්ස 16, ලේබල් සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල් |
| 1/18 ... | 1, 2, 3, 4, 10, 10–හෙක්ස්ක්ලෝරෝ 1, 4, 4ඒ, 5, 8, 8ඒ, 2 හේසහයිඩ්‍රෝ එක්සෝ–1, 4–එන්ඩෝ–5, 8–ඩයිමිතානෝ නැප්තැලීන් (ඇල්ඩ්‍රින්) 2.5% සහිත කෘමිනාශක කුඩක් වශයෙන් | (1) 1,000 (රු. 1,000)<br>(2) 1,000 (රු. 5,000) | ... ලේබල් සහ සීල් සහිත රු. 1 පැකට්<br>... ලේබල් සහ සීල් සහිත රු. 5 පැකට් |
| 1/19 ... | 20% 1, 2, 3, 4, 10, 10–හෙක්සක්ලෝරෝ 6–7 ඊපොක්සි 1, 4, 4අ, 5, 6, 7, 8, 8අ, ඔක්ටසයිඩ්‍රෝ–ක්සො 14 එන්ඩෝ 5, 8, ඩයිමිතනොනැප්තලීන් සහිත කෘමිනාශකය. ඉමල්සන් සාන්ද්‍රයක් වශයෙන් (ඩියල්ඩ්‍රින්) | 500 (ගැ. 50) | ... දියර අවුන්ස 16 ලේබල් සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල් |
| 1/20 ... | 2% 1, 2, 3, 4, 10, 10–හෙක්සාන්ලෝරෝ 6–7–ඊපොක්සි–1, 4, 4අ, 5, 6, 7, 8, 8අ, ඔක්ටහයිඩ්‍රෝ–ක්ස්ය–1, 4 එන්ඩෝ 5, 8 ඩයිමිතනෝ, නැප්තලීන් සහිත කෘමිනාශකය. කුඩක් වශයෙන් (ඩියල්ඩ්‍රිල්) | 200 (රු. 200) | ... ලේබල් සහ සීල් සහිත රු. 1 පැකට් |
| 1/21 ... | 80% නො අඩු, සල්පර් ජලයෙහි දියකළ හැකි කුඩු, සහිත කෘමිනාශකය | 1,000 | ... ලේබල්, සීල් සහිත රු. 1 පැකට් |
| 1/22 ... | 50%ක හෝ අධික සාන්ද්‍රණයක 0.0–ඩයිමිතයිල් 1–0 (3 මිතයිල්–4 හයිට්‍රොපිනිල්) කියොනොපොස්පේට් සහිත කෘමිනාශකය. ඉමල්සි පයබල් සාන්ද්‍ර වශයෙන් (පෙනිට්‍රොතියොන්) | 10,000 (ගැ. 1,000) | ... දියර අවුන්ස 16, ලේබල් සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල් |
| 1/23 ... | 6.5/89.0 අනුපාතයෙන් අල්පා සහ බීටා අයිසෙමරස් සහිත 25% 2–ක්ලෝරෝ 1–(24–ඩයික්ලෝරෝපිනිල්) විනිල්ඩයිතිල් හෙස්පේට් සහිත කෘමිනාශකය. ජලයෙහි දියකළ හැකි කුඩක් වශයෙන්. (බර්ලේන්) | 200 (රු. 100) | ... ලේබල් සහ සීල් සහිත රු. ½ පැකට් |
| 1/24 ... | 20% එස්–(එන්–පොමිල්–න් මිතයිල් කාබමොයිල්–මිතයිල්) ඩයිමිතයිල් පොස්පොරෝ තියෝලොතියොනේට් සහිත කෘමිනාශක ඉමල්ෂන් සාන්ද්‍රයක් වශයෙන් (පොමොතියොන් උද්. අන්තියෝ) | (1) 1,600 (ගැ. 20)<br>(2) 1,000 (ගැ. 100) | ... (1) දියර අවුන්ස 2, ලේබල් සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල්<br>... (2) දියර අවුන්ස 16, ලේබල් සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල් |
| | **දිලීර නාශක—** | | |
| එප්/1 ... | 3.5% මීතොපිඊතයිල්මර්කරි ක්ලෝරයිඩ් සහිත දිලීර නාශක ජලයෙහි දියකළ හැකි කුඩු වශයෙන් (සෙරසාන් වෙට්) | 16,000 (රු. 1,000) | ... සීල් සහ ලේබල් සහිත අවුන්ස 1 පැකට් |
| එප්/2 ... | 3.5% මර්කරි, මිකොන්සි ඊතයිල් මර්කරි ක්ලෝරෝයිඩ් වශයෙන් අඩංගු දිලීරනාශකයක් වියලි බීජ ආලේපනයක් වශයෙන් ප්‍රයෝජනයට ගැනීමට | 1,600 (රු. 100) | ... ලේබල් සහ සීල් සහිත රු. 1 පැකට් |
| එප්/3 ... | 50% මෙටැල්ලික්කොපර්, කොපර් ඔක්සික්ලෝරයිඩ් සහිත දිලීරනාශකයක් ජලයෙහි දියකළ හැකි කුඩක් වශයෙන් (කුප්‍රවිට්) | 1,500 (රු. 100) | ... ලේබල් සහ සීල් සහිත රු. 1 පැකට් |
| එප්/4 ... | 76% පෙරික්ඩයිමිතයිල්ඩිතියෝ කාබමේට් සහිත දිලීරනාශකය ජලයෙහි දියකළ හැකි කුඩු වශයෙන් (පර්බම්, පර්මේට්) | 1,000 (රු. 500) | ... සීල් සහ ලේබල් සහිත රු. ½ පැකට් |
| එප්/5 ... | 70% සින්ක්පොපිලින්–බිස්ඩිතියෝ කාබමේට් සහිත දිලීර නාශකය ජලයෙහි දියකළ හැකි කුඩු වශයෙන් (අන්ත්‍රකෝල්) | 11,200 (ටොන් 5) | ... ලේබල් සහ සීල් සහිත රු. 1 පැකට් |
| එප්/6 ... | 50% එන් (ට්‍රයික්ලෝරෝමෙතිල්කියෝ) සයික්ලොහෙක්ස්–4–ඊන්–1, 2–ඩයිකාබොක්සිමයිඩ් සහිත දිලීර නාශකය. ජලයෙහි දියකළ හැකි කුඩු වශයෙන් (කප්ටන්) | 200 (රු. 200) | ... සීල් සහ ලේබල් සහිත රු. 1 පැකට් |

දිළීර නාශක—(සම්බන්ධයි)

| අංකය | කෘෂි—රසායනික ද්‍රව්‍ය | ප්‍රමාණය | පැකැට්ටුවේ ප්‍රමාණය |
|---|---|---|---|
| එෆ්/7... | පහත සඳහන් සක්‍රිය මිශ්‍රණ ද්‍රව්‍ය 80%ක් අඩංගු දිළීර නාශක මෙතිල් ආසනො-එස්-(ඩයිමෙතිල්ඩයිතියෝ කාබමේට්) සින්ක්-ඩයිමෙතිල් ඩයිතියෝ-කාබමේට්, ටෙට්‍රා මෙතිල්-තියුරම් ඩයිසල්පයිට් (ටුසැට්) | 5,000 (රා. 2,500) | ... ලේබල් සහ සීල් සහිත රා. ½ පැකට් |
| එෆ්/8... | 2% කසුගමයිසින් සහිත දිළීර නාශකය. දියරයක් වශයෙන් ... | 2,000 | ... දියර අවුන්ස 10 ලේබල් සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල් |
| | පැලෑටි නාශක— | | |
| එච්/1 ... | 40% හෝ ඊට වැඩි සාන්ද්‍රත්වයකින් යුත් 4–ක්ලෝරෝ–2 මෙතිල්පි නොක්සි ඇසිටික් අම්ලය සහිත පැලෑටි නාශකය (එම්සීපීඒ) | 40,000 (ගැ. 4,000) | ... දියර අවුන්ස 16 ලේබල් සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල් |
| එච්/2 ... | 35% හෝ ඊට වැඩි සාන්ද්‍රත්වයකින් යුත් එන්-(3, 4–ඩයික්ලෝරෝපිනිල්) ප්‍රොපියොනා-මයිඩ් සහිත පැලෑටි නාශකය (3, 4 ඩීපීඒ) | 15,000 (ගැ. 1,500) | ... දියර අවුන්ස 16, ලේබල් සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල් |
| එච්/3 ... | 20% 1, 1–ඩයිමිතයිල් 4–4 බයිපිරිඩිලියම් ඔක්යික්ලෝරෝයිඩ් සහිත පැලෑටි නාශකය (පැරකට්) | 1,000 (ගැ. 100) | ... දියර අවුන්ස 16, ලේබල් සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල් |
| එච්/4 ... | 75% ඩයිමිතයිල්එස්ටර් ටෙට්‍රක්ලෝරෝ තෙරිප්ටලික් ආම්ලය සහිත පැලෑටි නාශකය. ජලයෙහි දියකළ හැකි කුඩු වශයෙන් (ඩැක්තල්) | 500 (රා. 500) | ... ලේබල් සහ සීල් සහිත රා. 1 පැකට් වලින් |
| එච්/5 ... | 65% 2 ක්ලෝරෝ එන්-අයිසොප්‍රොපිල් ඇසිට්ලිනයිඩ් සහිත පැලෑටි නාශකය. ජලයෙහි දියකළ හැකි කුඩු වශයෙන් (රැම්රොඩ්) | (1) 500 (රා. 5,000)<br>(2) 2,000 (රා. 2,000) | ... (1) ලේබල් සහ සීල් සහිත රා. 10 පැකට්වලින්<br>... (2) සීල් සහ ලේබල් සහිත රා. 1 පැකට්වලින් |
| එච්/6 ... | 80% 2 ක්ලෝරෝ 4–6 බිසිස්ප්‍රොපො ලමිනෝ 1, 3, 5 ට්‍රයසින් පැලෑටි නාශකය. ජලයෙහි දියකළ හැකි කුඩු වශයෙන්. ප්‍රොපසීන් | 100 (රා. 100) | ... සීල් සහ ලේබල් සහිත රා. 1 පැකට් වලින් |
| එච්/7 ... | 50% 3–(3–4–ඩයික්ලෝරෝපිනිල්)–1 මිතොක්සි–1 මෙතිල් යූරියා සහිත පැලෑටි නාශකය. ජලයෙහි දියකළ හැකි කුඩු වශයෙන් (ලොරොක්ස්) | 100 (රා. 100) | ... ලේබල් සහ සීල් සහිත රා. 1 පැකට් |
| එච්/8 ... | සෝඩියම් ලවන කැට මිශ්‍රණයක් වශයෙන් පෙන්ටක්ලෝරෝපිනොල් 25% අඩංගු පැලෑටි නාශකය | 1,000 (රා. 16,000) | ... ලේබල් සහ සීල් සහිත රා. 16 පැකට් |
| එච්/9 ... | තෙමිය හැකි කුඩක් වශයෙන් සකස් කරන ලද 2, 4–බිසියොප්‍රොපිලමිනො–6–මෙතිල්තියෝ–1, 3, 5–ට්‍රයසීන් (ප්‍රොමිට්‍රයින්) අඩංගු පැලෑටි නාශක (උදා. ගෙසාගාඩ්)–ටෙන්ඩර්කරු විසින් ඉදිරිපත් කරනු ලබන මිශ්‍රණයේ සාන්ද්‍රනය දන් වියයුතු අතර, ඉදිරිපත් කරනු ලබන නිෂ්පාදනයේ සාන්ද්‍රනය පෙන්නුම් කරන, නිෂ්පාදකයින්ගේ මුද්‍රිත මුල් පත්‍රිකා ද ඉදිරිපත් කළයුතු වේ | 56 (රා. 56) | ... නිෂ්පාදකයින්ගේ සීල් තබන ලද මුල්. රා. 1 පැකට් |
| එච්/10 | 2–කලෝරෝ–2, 6–ඩයතයිල්-එන්-(මෙතොක්සිමෙතිල්) අසටනිලයිඩ් 40% වඩා අඩංගු පැලෑටි නාශක සාන්ද්‍ර තෙලෝදයක් වශයෙන් (උදා. ලැසෝ) | 500 (ගැ. 50) | ... දියර අවුන්ස 16, ලේබල් සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල් |
| | වෙනත් දේ— | | |
| එම්/1 ... | බොස්සිලිඩොනියමිනෝ–4–පොනිල්තියාසොලිනෝ–2–තියෝන් (පොන් වියායොන්) 50% අඩංගු ශාකානු නාශක තෙමිය හැකි කුඩක් වශයෙන් (උදා. සෙල්ඩියොන්) | 1,000 පැකට් | ... නිෂ්පාදකයින්ගේ සීල් තබන ලද මුල්. ග්‍රෑම් 100 පැකට් |

8–1218—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර්

මෙම කාර්යාලයේ, පළාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

| | | |
|---|---|---|
| 1. | උඩබුලත්ගම ... | අඹතලාව නුගේමුල අස්වැද්දුම අමුණ සෑදීම |
| 2. | එම | රඹුක්පිටිය ලිංකුඹුර ඇල අමුණ සෑදීම |
| 3. | එම | කරහඳුන්ගල් පන්සල දෙනිය අමුණ සෑදීම |
| 4. | එම | මැඩිල්ල කොස්බේරිය අමුණ සෑදීම |
| 5. | එම | රම්පාදෙනිය ඇතාබැන්ද කොටුව කුඹුරේ ඇල වැඩිදියුණු කිරීම |
| 6. | පාතහේවාහැට ... | හිප්පොල දරාඩ කුඹුර ඇල සෑදීම |
| 7. | එම | බෝපිටිය අතුරු ඇල අලුත්වැඩියා කිරීම |
| 8. | උඩපළාත ... | දෙඹගහවත්ත අමුණ ඇල සෑදීම |
| 9. | එම | තැලිහුන්න මහකුඹුරු යායේ අමුණ සහ ඇල අලුත්වැඩියා කිරීම |
| 10. | එම | ගිරාමුල්ල අලුපොතවත්ත ඇල අලුත්වැඩියා කිරීම |
| 11. | එම | පල්ලෙ දෙල්තොට හිඹටුවැල්හේන ඇල සෑදීම |
| 12. | එම | ඇරැගොඩ පහල වෙල්යාය ඇල සෑදීම |
| 13. | උඩදුම්බර ... | කෙවුල්ගම පල්ලෙ රජ්ජුපිටියේ ඇල ප්‍රතිසංස්කරණය කිරීම |
| 14. | එම | කෙවුල්ගම හැවැනිවෙල අමුණ බැඳීම |
| 15. | එම | කෙවුල්ගම පොල්කොටුවේ අමුණ සෑදීම |
| 16. | එම | පිටවල මහකුඹුරේ අමුණ ප්‍රතිසංස්කරණය කිරීම |
| 17. | උඩදුම්බර | පිටවෙල අමුණවෙලේ අමුණ ප්‍රතිසංස්කරණය කිරීම |
| 18. | එම | හුන්නස්ගිරිය පිහිල්ලගාව කඩේ ඇල ප්‍රතිසංස්කරණය කිරීම |
| 19. | එම | රඹුක්වැල්ල මීගොල්ල ඇල පෝටාව බැඳීම |
| 20. | හාරිස්පත්තුව ... | අලවත්ත වේවැල්කැටියේ ඇල ප්‍රතිසංස්කරණය කිරීම |
| 21. | කුම්පනේ ... | පැලැන දිවිලයාය අමුණ ප්‍රතිසංස්කරණය කිරීම |
| 22. | උඩුනුවර ... | වතුපොල කලුගල ඇල අමුණ අලුත්වැඩියා කිරීම |
| 23. | එම | අඹන්වල උග්ගහපිටිය ඇල අමුණ අලුත්වැඩියා කිරීම |
| 24. | එම | වේරවල එලබැද්ද අමුණ තැනීම |
| 25. | එම | කොටකේදෙනිය කිරිබතේ අමුණ තැනීම |
| 26. | එම | කුරුකුත්තල වැලිලියද්දේ අමුණ තැනීම |
| 27. | මැදදුම්බර ... | බෝමුරේ මැද ඇල තැනීම |
| 28. | එම | මීරිස්හේන ඇල වැඩිදියුණු කිරීම |
| 29. | එම | වේඩරුව මීමනේ ඇල ප්‍රතිසංස්කරණය කිරීම |
| 30. | එම | රේටියගම කන්දෙමුරේ එක්කස්ස ඇල ප්‍රතිසංස්කරණය කිරීම |
| 31. | එම | දුනුවිල මහඇල ප්‍රතිසංස්කරණය කිරීම |
| 32. | එම | නමදගල පල්ලේඇල අලුත්වැඩියා කිරීම |
| 33. | යටිනුවර ... | මල්ගම්මන දෙඩම්වත්තේ ඇල පලල් කිරීම |
| 34. | එම | පිලපිටියේ සියඹලාවේ අමුණ තැනීම |
| 35. | එම | මාමුඩාවල වැලිකුඹුරේ ඇල හැරවීම |
| 36. | එම | දෙහිඅංග අස්වැද්දුමේ අමුණ ඇල ප්‍රතිසංස්කරණය කිරීම |

| | | | |
|---|---|---|---|
| 37. | යටිනුවර | ... | පොත්තෙපිටිය කන්දෙවල ඇල අලුත්වැඩියා කිරීම |
| 38. | එම | ... | බලනකුමාරගලවත්තේ අමුණක් බැඳීම |
| 39. | එම | ... | වල්ගොව්වාගොඩ කන්තොට අමුණ සහ ඇල ප්‍රතිසංස්කරණය කිරීම |
| 40. | එම | ... | පිලපිටියේ සියඹලාවේ අමුණ තැනීම |

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසිවලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969 සැප්තැම්බර් මස 15 දින දවල් 12 දක්වා මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළයුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචනවලින් ද දක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි විය යුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සැමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොද සහතික කළයුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොද, සීල් තබන ලද ලියුම් කවර වල බහා, මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙලවරේ " ............................................. සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය " යනුවෙන් සඳහන් කළයුතුය. ටෙන්ඩර් පත්‍ර 1969 සැප්තැම්බර් මස 19 දින පෙරවරු 9.30 පෙර මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම් ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති " ටෙන්ඩර් පෙට්ටියට " දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නාවූ නිලධාරිතැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට දස දිනක් ඇතුලතදී එම ටෙන්ඩර් කරු විසින් මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදයක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන් ඩරයේ සඳහන් මුදලින් 5%ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතු ය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමඟ නම ඇතුළත් වී ඇති කිසිවකු සමඟ හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතූන් උඩ මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන විරුද්ධ වන කවරෙකු සමඟ හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලිය වේලාවන් තුළදී සැලසුම් පරීක්ෂා කර බැලීමට මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන විසින් ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇති වන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථාන යත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කර්යාලීය වේලාවන් තුළදී මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනගෙන් විමසීමෙන්ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගතයුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. " ලාංකික " යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන්වූ අය යි.

12. තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. " ගොවිජන සේවා සහකාර කොමසාරිස් " යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුර දරන නිලධාරිතැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු වියයුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 සැප්තැම්බර් මස 19 දින පෙ.ව. 9.30ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරිතැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඩී. පී. ඇම්. විජයදෝරු,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
මහනුවර දිස්ත්‍රික්කය.

මහනුවර දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනගේ කාර්යාලය,
1969 අගෝස්තු මස 17 දින දීය.

8–1296—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර්

මෙම කායභාලයේ, පළාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, අධ්‍යාපන අධ්‍යක්ෂක කායභාලයේ රු. 35,000 (තිස්පන්දහක) හෝ ඊට වැඩි මුදලක කොන්ත්‍රාත්තු කිරීම සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

| | වැවේ නම | | වැඩයේ භාවය | | පිහිටි ස්ථානය |
|---|---|---|---|---|---|
| 1. | පඩිකාර මඩුව වැව | ... | දියුණු කිරීම | ... | හබරණ |
| 2. | මැදවැව | ... | එම | ... | කැකිරාව |
| 3. | කොම්බිගල | ... | එම | ... | මරදන්කඩවල |
| 4. | ඉලුක්බොඩගම | ... | එම | ... | කැකිරාව |
| 5. | රදම්ගස්සෑව | ... | එම | ... | මරදන්කඩවල |

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසිවලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969 සැප්තැම්බර් මස 8 වැනි දින දවල් 12 දක්වා අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනගේ කායභාලයෙන් ලබාගත හැක. කච්චේරියේ රු. 50ක් (රුපියල් පණහක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචනවලින්ද දක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි විය යුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සැමෙකක්ම, ටෙන්ඩරකරුගේ කෙටි අත්සන යොද සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොද, සීල් තබන ලද ලියුම් කවරවල බහා, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ " අනුරාධපුර දිස්ත්‍රික්කයේ සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය " යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර, 1969 සැප්තැම්බර් මස 12 වැනි දින දවල් 12ට පෙර අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නොඑසේ නම් ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති " ටෙන්ඩර් පෙට්ටියට " දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නාවූ නිලධාරිතැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට දස දිනක් ඇතුළත දී එම ටෙන්ඩර්කරු විසින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුළත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදයක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 10%ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුළත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දන්වීමෙන් පසුවද, එසේ කිරීමට ඔහු අසමත් වූවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුව නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමග නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතූන් උඩ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාරගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්‍යාලීය වේලාවන් තුළදී සැලසුම් පරීක්ෂා කර බැලීමට අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන විසින් ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළ යුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන්ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්‍යාලීය වේලාවන් තුළදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනගෙන් විමසීමෙන්ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහාගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. " ලාංකික " යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

12. තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. " ගොවිජන සේවා සහකාර කොමසාරිස් " යනුවෙන් හැඳින්වෙන්නේ දනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරිතැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරද ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 සැප්තැම්බර් මස 12 වැනි දින ප.ව. 3 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැනගැනීම සඳහා ටෙන්ඩර් විවෘත කරන නිලධාරිතැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

එච්. ඇල්. පී. පෙරේරා,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
අනුරාධපුර දිස්ත්‍රික්කය.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනගේ කාර්‍යාලය,
1969 අගෝස්තු මස 15 දින දීය.

8–1306—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### 1969–70 මුදල් වර්ෂය තුල අනුරාධපුර කොටසේ ගොවිපල වල තිබෙන හිස් ගෝනි මලු, කඩදසි මලු හා සිමෙන්ති මලු විකිණීම

1969–70 මුදල් වර්ෂය තුළදී පහත සඳහන් ගොවිපලවල තිබෙන ඉහත සඳහන් මලු විකිණීම සඳහා අනුරාධපුර නව නගරයේ ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් 1969.9.16 වෙනි දින පෙරවරු 10.30 දක්වා භාරගනු ලැබේ :—

| ගොවිපල | | හිස් ගෝනි | හිස් කඩදසි මලු | හිස් සිමෙන්ති මලු |
|---|---|---|---|---|
| අනුරාධපුර ගොවිපල ... | ... | 550... | 750... | — |
| පොලොන්නරුව ගොවිපල | ... | 4,000... | — ... | — |
| පැල්වෙහෙර ගොවිපල | ... | 2,000... | — ... | 300 |
| හිඟුරක්ගොඩ ගොවිපල | ... | 3,500... | — ... | — |
| පාසැල් ගොවිපල, මහඉළුප්පල්ලම | ... | 2,000... | — ... | 25 |

2. මිළ ගණන් සඳහන් කළ යුත්තේ එක මල්ලකට ය. තෝරාගනු ලබන ටෙන්ඩර්කරුට එක් එක් ගොවිපලෙහි විකිණීමට ඇති හිස් ගෝනි මලු, හිස් කඩදසි සිමෙන්ති මලු හා හිස් කඩදසි සත්ව ආහාර මලු ගණන දන්වන අතර ඔහු විසින් වහාම ටෙන්ඩර් කරන ලද මිළ ගණන් අනුව මුදල් ගෙවා ඒවා රැගෙන යායුතුයි. ටෙන්ඩර් මිළ ගණන් මුදල් වර්ෂය අවසාන වන තෙක් එනම් 1969.9.30 වෙනි ද තෙක් බලපානු ඇත.

3. ටෙන්ඩර් පත්‍රය එවිය යුත්තේ අනුරාධපුර ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරිතැනගෙන් ලබාගන්නා ලද ආකෘති පත්‍රවලය. සියළුම ටෙන්ඩර් පත්‍ර අනු පිටපතකින් යුතුව අත්සන් කර කවරයක බහා මුද්‍රා තබා, අනුරාධපුර ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන එවිය යුතු අතර, ටෙන්ඩර් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ ''ගෝනි මලු හා කඩදසි මලු සඳහා ටෙන්ඩර්'' යන්න සඳහන් කළ යුතුය.

4. 1969.9.15 වැනි දින පස්වරු 4.30 දක්වා අනුරාධපුර ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරි විසින් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. එසේ නිකුත් කරනු ලබන්නේ ටෙන්රඩය සඳහා රු. 25 ක මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මෙම තැන්පත් කිරීම ඕනෑම කච්චේරියක හෝ පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කළ හැක. තෝරාගනු ලබන ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10 ක් ඇතුළත දී රුපියල් 100 ක ඇප මුදලක් තැන්පත් කරන ලෙස දන්වනු ලැබේ. එම ඇප මුදල තැන්පත් කිරීමට නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වීමට ද ඉඩ තිබේ. මෙයට අතිරේක කොන්ත්‍රාත්කරුවන්ගෙන් වෙනත් අයකිරීම් ඉල්ලා සිටීමට ද ආණ්ඩුවට බලය ඇත.

5. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපැලෙන් නොඑවතොත් ටෙන්ඩරකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් අනුරාධපුර ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරිට ඒවා අතින්ම භාරදිය යුතුයි. එම ටෙන්ඩර් පත්‍ර බහාලන කවර ද මුද්‍රා තබා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ලියා ''ගෝනි මලු හා කඩදසි මලු සඳහා ටෙන්ඩර්'' යන්න සඳහන් කර තිබිය යුතුයි. ලියාපදිංචි කළ තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුනු බව ඒවා විවෘත කරන දිනයේම එම ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින 4 ක් ඇතුලත යම් ටෙන්ඩර් කරුවෙකුට එවැනි දන්වීමක් නොලැබුණහොත් ඔහු අනුරාධපුර ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරිතැනගෙන් ඒ ගැන විමසිය යුතුයි.

6. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාරගැනීම නැවැත්වීමට නියමිත ඉහත කී වේලාවේ දී අනුරාධපුර ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

7. නියමිත පෝර්මයේ ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස පිළිගනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් හා ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළයුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන තැබිය යුතු වේ.

8. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

9. ටෙන්ඩර්කරු විසින් තැන්පත් කරනු ලබන ඇප මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකර නිම වූ විට පමණි. පත්කරනු ලැබූ ටෙන්ඩර්කරු මේ කොන්ත්‍රාත්තුව නිසි ලෙස ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ද ඇතුළත් වීමට ඉඩ තිබේ.

10. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වන මිළ ගණන් 1969.9.30 වෙනි දින දක්වා වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත් ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය ටෙන්ඩර් මණ්ඩලය වෙත තබාගනු ලැබේ.

12. කොන්ත්‍රාත්කරුවෙකු වෙත භාරදිය යුතු සියළුම දන්වීම් ඔහුගේ අතටම දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපැලෙන් යැව්වොත් හෝ ඔහුගේ අතටම භාරදුන්නා සේ සලකනු ලැබේ.

13. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩකරවා ගැනීමට පුහුණු හා නොපුහුණු දෙවර්ගයේම ''ලාංකික'' කම්කරුවන් පමණක් තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් නියුක්ත කළ යුතුයි. ඒ කම්කරුවන් හැකිතරම් දුරට බඳවා ගතයුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

මේ කොන්දේසිය සපුරාලීමට ටෙන්ඩර්කරුවා යම්කිසි විදියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩුදෙනවා ඇත. එහෙත් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වයක් ඇතිව නිශ්චිත ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට ටෙන්ඩර්කරුට බලය දිය හැක. එවැනි ලිඛිත බලයක් හෝ එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සලකනු ලැබේ. ''ලාංකික'' යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු අදහස් කෙරෙන අතර එවැන්නෙක් එකී පාඨයට ඇතුලත් වේ. කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූද කම්කරුවනාට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියලුම රෙගුලාසිවලට අනුකූලවූ ද වේතනයක් ගෙවීමට තෝරාගත් ටෙන්ඩර්කරු එකඟ විය යුතුයි. කොන්ත්‍රාත්තුවේ වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, වැක්රෝල් පොත් පෙරෙට්ටු පොත් හා අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩදීමට තෝරාගත් ටෙන්ඩර්කරු බැඳීසිටිය යුතුයි.

14. වර්ෂ 1934 රේ අංක 19 දරන කම්කරු වන්දි ආඥපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු විසින් හෝ සේවකයෙකු සම්බන්ධයෙන් හෝ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම් සඳහන් වන කෙනෙකුගේ නම සමඟ ඇතුලත් වූ හෝ තමන්ට සැහේයයි පෙනී යන හේතු පිට ටෙන්ඩර් මණ්ඩලය විරුද්ධ වන හෝ කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

16. වැඩි විස්තර ඒ ඒ ගොවිපොලවල කළමනාකරුවන්ට ලිවීමෙන් දැනගත හැක.

පී. ටී. ජිනේන්ද්‍රදස,
නියෝජ්‍ය අධ්‍යක්ෂ,
(කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල්).

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී,
1969 අගෝස්තු මස 17 වැනි දින.

8–1290—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### තේක්ක පැල තවාන්වලට වතුර පොම්ප දෙකක් සැපයීම

කොළඹ 2, තැ.පෙ. 509 වන සංරක්ෂක විසින් 69.9.12 වැනි දින පෙ.ව. 10 තෙක් ඉහත සඳහන් කාර්යය සඳහා ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

2. කොළඹ 2, කිව්පාරේ, වන සංරක්ෂකගේ කාර්යාලයෙන් ලබාගත යුතු නියමිත ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් සමන්විත වනසේ ටෙන්ඩර් පත් පිළියෙල කළ යුතුය.

3. මේ සඳහා සෑම ටෙන්ඩර්කරුවෙක් විසින් වන සංරක්ෂක නමින් රු. 100 ක මුද්ලක් කොටුවේ, යෝක් වීදියේ (ගිණුම් අංක 34), ලංකා බැංකු ශාඛාවේ තැන්පත් කළ යුතුය. ඒ සඳහා නිකුත් කරනු ලබන නිල කුවිතාන්සිය ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය 69.9.11 වැනි දින ප.ව. 4.00 තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

4. අවශ්‍ය දේවල් අඩංගු උපලේඛනය ඇතුළු වැඩි විස්තර කොළඹ 2, කිව්පාරේ, පිහිටි වන සංරක්ෂකගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ඇම්. ඇස්. රණතුංග,
වැඩබලන වන සංරක්ෂක වෙනුවට.

8–1292—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### එළු කූඩා සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම

කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරන ස්ථානයෙහි පිහිටි ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් කිට්ටුවෙන් ම පිහිටි නි.මී.යෝ.ක්‍ර. ගබඩාවට එළු කූඩා සැපයීම සහ ගෙනැවිත් භාරදීම සඳහා මෙරට සැපයුම්කරුවන්ගෙන්, නිපදවන්නන්ගෙන් හා සමුපකාර සමිති වලින් 1969 සැප්තැම්බර් 12 වන සිකුරාදා ප.ව. 2.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

(අ) දළවශයෙන් සෑම කූඩයකම දිග අඟල් 18ක්ද, වටප්‍රමාණය අඟල් 13ක්ද සිටින සේ තල්කොල හා තල් ඉරටුවලින් වියා තිබියයුතු අතර, දිග අතට සිදුරු 20 ක්ද, වටරවුමක සිදුරු 13 ක්ද තිබිය යුතුයි.

(ආ) සෑම සිදුරකම විෂ්කම්භය උපරිම වශයෙන් අඟල් ¼ ක් විය යුතුයි.

(ඇ) සෑම කූඩයක් ම අඩුම වශයෙන් එළු රාත්තල් 3½ ක් අල්ලන ප්‍රමානයේ තිබිය යුතුයි.

(ඈ) එක් මිටියක කූඩා 600ක් අඩංගුවන පරිදි කූඩා මිටි සුරක්ෂිතව බැඳ තිබිය යුතුයි.

2. දිවයිනේ ඕනෑම කච්චේරියක හෝ කොළඹ 7, හෝර්ටන් පෙදෙස අංක 60 දරන ස්ථානයෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තු වේ ගණකාධිකාරි තැනට රු. 50 ක තැන්පත් මුදලක් ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරන ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නි.මී.යෝ.ක්‍ර. හා වී.කෙ. අංශයෙන් 1969 සැප්තැම්බර් 12 වන දින දවල් 12 වනතෙක් නිකුත් කරනු ලබන ටෙන්ඩර් පත් ලබාගෙන අනුපිටපතක් ද සහිතව පුරවා එවිය යුතුයි.

3. මේ පිළිබඳ වැඩි විස්තර කොළඹ ගොවිජන සේවා කොමසාරිස් තැනගේ කායඹියාලයෙන් හෝ යාපනයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන්ගෙන් විමසා දැනගත හැක.

වී. තී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

තැ.පෙ. අංක 537,
කොළඹ 7, 1969 අගෝස්තු 22 දින ය.

8–1430—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1969 ඔක්තෝබර් 1 වන ද සිට 1970 සැප්තැම්බර් 30 වන ද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ, මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර්පත්‍ර පුත්තලම සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවැනි තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කොළඹ හැර අනිකුත් කච්චේරියක හෝ කොළඹ යෝක් වීදියේ පිහිටි ලංකා බැංකු ශාඛාවේ හෝ තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුයි.

**සැ.යු.**—කොළඹ, යෝක් වීදියේ ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීම සඳහා වුවමනා පෝර්ම මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයේ දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, වවුනියා සහ රත්නපුරය යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබා ගත හැක. නියමිත පෝර්යයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාර ගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වක්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වක්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවැනි ඡේදයේ (ii) සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැක. වක්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමග ඇති උපලේඛනයේ 5 තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' සෞඛ්‍ය සේවා අධිකාරී තැන, පුත්තලම '' කියා එවිය යුතුය. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයේ වම් පස උඩ කෙලවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයේ බහාලන ලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව ප්‍රාදේශීය ලේකම් තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුන බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුයි.

6. **ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම.**—ටෙන්ඩර්පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මා විසින් බලය පවරනු ලැබූ නියෝජිත යකුගේ අනුමැතිව ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැක.

8. **ටෙන්ඩරයෙහි තීරණ.**—ටෙන්ඩර්පත් තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ '' බී '' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම්වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි '' සී '' උප ලේඛණයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුය. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයේ සඳහන් මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ජෙදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන පොරොන්දු පත්‍රයේ විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍ර සඳහන් මිළ ගණන් මොනාම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයේ සඳහන් වන ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එය පිහිටි ඉඩම තුළ ඉඩ කඩ සලසා දෙනු නො ලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන් ම පිළිපැදිය යුතු ද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුම් කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

13. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුට රෝගීන් සහ සේවකයින් විසින් භාරදී ඇති කූපන් වෙනුවෙන් සහන මිළ යටතේ හෝ නොමිලේ හෝ 1966.12.19 දින සිට පවතින ක්‍රමයට අවශ්‍ය සහල් ආහාර දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට ආයතන භාර ප්‍රධානියා විසින් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

ආර්. එච්. පීරිස්,
සෞඛ්‍ය සේවා අධිකාරී, පුත්තලම.

1969, අගෝස්තු මස 18 වෙනිදින,
පුත්තලම, සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දී ය.

## උපලේඛනය

| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | ආහාර ප්‍රමාණය දළ වශයෙන් | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | සේවකයින්ට | | | | නොගෙවන රෝගීන්ට | | | |
| | රු. ශ. | රු. ශ. | | මාළු | මස් | කරවල | එළවළු | මාළු | මාස් | කරවල | එළවළු |
| ගලමුරුව ග්‍රා.රෝ. හා මාතෘ නිවාසය | 100... | 600 | 69.9.16 පෙරවරු 10 ට | 150... | 150... | 150... | 600... | 1,200... | 1,200... | 1,200... | 4,800 |
| මාදම්පේ ග්‍රා. රෝ. ... | 100... | 800... | | 200... | 200... | 200... | 800... | 900... | 900... | 900... | 3,600 |

8–1294—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—අනුරාධපුර කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1969 ඔක්තෝබර් 1 වනද සිට 1970 සැප්තැම්බර් 30 වනද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ, මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකික යන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර අනුරාධපුර පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයෙහි දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දින ට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වව්නියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරු වන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය මේ ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර් කරුවන් ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සැළකියයුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වූවමනා පෝරම ඉහත පෙනෙන දෙවන ඡේදයේ (II) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන් වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' සෞඛ්‍ය සේවා අධිකාරි, අනුරාධපුරය '' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එම කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරි ලේකම් තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුයි.

6. **ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුව හොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කලින් පිළියෙළ කර ඇති දිනයක මවිසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණ.**—ටෙන්ඩර්පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ '' බී '' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි '' සී '' උපලේඛන යට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් වන කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන් තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

පී. රත්නසබාපති,
වැඩ බලන සෞඛ්‍ය සේවා අධිකාරි, අනුරාධපුරය.

සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
අනුරාධපුරය, 1969.8.6.

උපලේඛනය

| ආයතනය | ටෙන්ඩර් තැන්පත් මුදල | ඇප තැන්පත් | ටෙන්ඩර් වසන වේලාව සහ දිනය | ආහාර වුවමනා ඉතා කිට්ටු ගණන: සේවකයින් සඳහා — අළුත් මාළු | හරක් මස් | කරවල | එළවළු | ලෙඩුන් සඳහා — අළුත් මාළු | හරක් මස් | කරවල | එළවළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | | | | | | | | | |
| 1. ගෝමරන්කඩවල ග්‍රාමීය රෝහල | 100... | 600... | 69.9.19 පෙ.ව. 10 ට | 200... | — ... | 450... | 950... | 350... | — ... | 750... | 1,300 |
| 2. කුච්චිවේලි ග්‍රා. රෝ. ... | 100... | 600... | | 300... | — ... | 600... | 1,400... | 300... | — ... | 500... | 1,000 |
| 3. යක්කල ග්‍රා. රෝ. ... | 100... | 600... | | 200... | 200... | 200... | 900... | 600... | 600... | 650... | 2,600 |
| 4. පෙරියකින්නියා ග්‍රා.රෝ. ම.නි.... | 100... | 800... | | 350... | — ... | 700... | 1,400... | 1,150... | — ... | 2,300... | 4,500 |
| 5. තම්මැන්නාව ග්‍රා. රෝ. ... | 100... | 600... | | 100... | — ... | 200... | 400... | 250... | — ... | 500... | 1,000 |
| | | | 69.10.1සිට 69.12.31 දක්වා | | | | | | | | |
| 6. ගලෙන් බිඳුනුවැව මා. නි. ... | 100... | 400... | | 100... | — ... | 200... | 400... | 250... | — ... | 500 | 1,000 |

8–1249—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය

කොළඹ, තැ.පෙ. අංක 500 යේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ, සභාපති තැන විසින් හම්බන්තොට රෝහලේ ජල සම්පාදනය ඉදි කිරීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් 1969 සැප්තැම්බර් මස 30 වන අඟහරුවාද පෙරවරු 10 වන තෙක් භාර ගනු ලැබේ.

2. කොළඹ 7, පිහිටි මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝර්මවල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍රිකා ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන විසින් 1969 සැප්තැම්බර් මස 12 වන සිකුරාද පස්වරු 4 වන තෙක් නිකුත් කරනු ලබන්නේ ජල සම්පාදන ඉදි කිරීම සඳහා මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ ''බී'' කොටස යටතේ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන්ට පමණි. ටෙන්ඩර් පත්‍රිකා ලබා ගැනීමට පෙර ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගේ නමට අය වන ලෙස කොළඹ, ලංකා බැංකුවේ හෝ කොළඹින් පිටත නම් කච්චේරියක හෝ රුපියල් 100 ක මුදලක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් පත් ලබා ගැනීම වෙනුවෙන් මුදල් තැන්පත් කිරීමෙන් නිදහස් කොට ඇති පහත සඳහන් සංගම් වලට ද ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය,

(ආ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කොට ඇති ග්‍රාම සංවර්ධන සමිති,

(ඇ) සමුපකාර සංගම් රෙජිස්ට්‍රාර් තැන විසින් ලියාපදිංචි කොට ඇති සමුපකාර සංගම්.

4. ටෙන්ඩර් පත් කොළඹ, සිලින්කෝ මන්දිරයේ 5 වෙනි මාලයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩල කාර්යාලයේ තබා ඇති පෙට්ටියේ තැන්පත් කළ යුතු ය. නැතහොත් ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතු ය. ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් හෝ විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් ඉහත සඳහන් ස්ථානයේ ටෙන්ඩර් පත් පිළිගැනීමේ බලය ලබා ඇති නිළධාරියෙකුට භාර දිය හැකි ය. සේවයේ විස්තර ද, ටෙන්ඩර් කරුවන්ගේ නම සහ ලිපිනය ද, කවරයේ සඳහන් කළ යුතු ය. ටෙන්ඩරය භාර ගත් බවට ඉහත සඳහන් නිළධාරි තැන විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

5. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේ දී නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී සෑම ඉල්ලුම් කරුවෙකුට ම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ මිළ ගණන් පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේදී කියවනු ලැබේ. ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන්ගේ අනුමැතිය අනුව කිසියම් ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට ටෙන්ඩර්කරුවකුට අවශ්‍ය වුවහොත් එකී ටෙන්ඩරයේ පිටපත පරීක්ෂා කර බැලීම සඳහා අවසර දෙනු ලැබේ.

6. මෙම වැඩයට උවමනා සිමෙන්ති ප්‍රමාණය මිළ දී ගැනීමට අවශ්‍ය අවසර පත්තරය ලංකා සිමෙන්ති සංස්ථක්ත මණ්ඩලයෙන් හෝ සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් හෝ ලබා ගැනීම සඳහා නියමිත නිර්දේශය සාර්ථක ටෙන්ඩර්කරු වෙත නිකුත් කරනු ලැබේ.

7. මෙම වැඩය සඳහා අවශ්‍ය, මෙ රටින් ලබා ගත නො හැකි බඩු බාහිරාදිය ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබා ගැනීම ද නිර්දේශ කරනු ලැබේ.

8. වැඩය පිළිබඳ තව දුරටත් විස්තර කොළඹ 7, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ඇස්. ඊ. ජේ. මේතර්,
ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරුතැන.

1969 අගෝස්තු මස 21 වන ද,
කොළඹ 7, තැ.පෙ. 1434 දී.

8–1372—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි පාසැල්වලට "ඇදිහැස" කිරි විස්කෝතු ප්‍රවාහනය කිරීම

වර්ෂ 1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කාලය තුළ, අඟල් 19″×11″×9″ ප්‍රමාණයේ කාඩ්බෝඩ් පෙට්ටිවල ආසන්න වශයෙන් රාත්තල් 20 බැගින් අසුරා ඇති කිරි විස්කෝතු පෙට්ටි ප්‍රවාහනය කිරීම සඳහා සීල් තබන ලද පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර 1969 සැප්තැම්බර් මස 20 වැනි දින පස්වරු 4.30 දක්වා රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ.

2. පහත සඳහන් සේවාවන් සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතු යි :—

(1) ආහාර පාලක දෙපාර්තමේන්තුවේ, රත්නපුර බෙද හැරීමේ ගබඩාවේ සිට, කිරිඇල්ල, රත්නපුර, නිවිතිගල සහ කලවාන අධ්‍යාපන මණ්ඩලවලට අයත් පාසැල්වලට

(2) ආහාර පාලක දෙපාර්තමේන්තුවේ, කහවත්ත බෙද හැරීමේ ගබඩාවේ සිට, පැල්මඩුල්ල, රක්වාන සහ කොලොන්න අධ්‍යාපන මණ්ඩලවලට අයත් පාසැල්වලට

(3) ආහාර පාලක දෙපාර්තමේන්තුවේ, ඕපනායක බෙද හැරීමේ ගබඩාවේ සිට, බලන්ගොඩ උතුර සහ බලන්ගොඩ දකුණ අධ්‍යාපන මණ්ඩලවලට අයත් පාසැල්වලට

3. ටෙන්ඩර් පත්‍ර රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබා ගත් නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රවල ඉදිරිපත් කළ යුතු ය. රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ රු. 100 ක් තැන්පත් කර ඊට රිසිට් පතක් ඉදිරිපත් කරන ඉල්ලුම්කරුවන්ට 1969 සැප්තැම්බර් මස 20 වැනි දින පෙරවරු 10 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. එක් එක් සේවාව සඳහා වෙන් වෙන් වශයෙන් මුදල් තැන්පත් කළ යුතු ය. අනුමත කරන ලද සමිති විසින් මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය ය.

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර ටෙන්ඩර් භාර දීමට බලාපොරොත්තු වන අය තමා සතුව රු. 10,000 ට නො අඩු වටිනාකමක් ඇති නිශ්චල දේපල ඇති බවට තම ප්‍රදේශයේ ආදයම් පාලක නිලධාරීන්ගෙන් මෑතකදී ලබා ගත් සහතිකයක්ද, එක් එක් සේවාවන් සඳහා ඉල්ලුම්කරු නමින් ලියා පදිංචි කරන ලද මේ වර්ෂයට වලංගු බලපත්‍රය ඇති එක් ලොරියක් වත් ඇති බවට සාක්ෂි රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු ය.

5. අනුමත කරන ලද සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමුපකාර සමිති විසින් ටෙන්ඩර් පත් ලබා ගැනීමට පෙර එකී සමිතියට මෙම සේවාව ඉටු කිරීමට හැකියාවක් ඇති ලොරි සේවයක් ඇති බවට සමුපකාර සමිති රෙජිස්ත්‍රාර් ගෙන් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ ගෙන් හෝ කම්කරු කොමසාරිස්ගෙන් හෝ (ඒ ඒ සමිතිවලට අදල පරිදි) ලබා ගත් සහතිකයක් රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු ය.

6. ටෙන්ඩර් සම්පූර්ණයෙන් ප්‍රතික්ෂෙප කිරීමට හෝ එහි කොටසක් පමණක් භාර ගැනීමට හෝ බලය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති සතු ය.

7. 1969 සැප්තැම්බර් මස 21 වැනි දින පෙරවරු 9.30 ට රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

8. මේ සම්බන්ධයෙන් තවත් අවශ්‍ය විස්තර වෙතොත් රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන් ලබා ගත හැක.

එස්. පී. ජයසූරිය,
රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969.8.16 ද,
රත්නපුර,
ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ය.

8–1231—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව—බණ්ඩාරවෙල

1969 සැප්තැම්බර් මස 5 දින පෙව. 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ :—

| | පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|---|
| 1. | බ/ඇත්තලපිටිය මහා විද්‍යාලය ... | කර්මාන්ත ශාලාවක් තැනීම |
| 2. | බ/බැද්දේගම මහා විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ලක් තැනීම |
| 3. | බ/හිවල් කැඳුර යෝජිත පාසැල ... | පාසැල් ගොඩනැගිල්ලක් තැනීම |
| 4. | බ/පුහුල්වත්ත යෝජිත පාසැල ... | පාසැල් ගොඩනැගිල්ලක් තැනීම |
| 5. | බ/බදුල්ල කණිෂ්ඨ කාර්මික විද්‍යාලය | අළුත්වැඩියාව |

සංලක්ෂ්‍යය : බ = බදුල්ල දිස්ත්‍රික්කය

අවශ්‍ය ලියාපදිංචිය :—

| | | |
|---|---|---|
| අංක 1 | ... | 35,000 හෝ ඊට වැඩි |
| අංක 2 සහ 3 | ... | 25,000 හෝ ඊට වැඩි |
| අංක 4 | ... | 20,000 හෝ ඊට වැඩි |
| අංක 5 | ... | 10,000 හෝ ඊට වැඩි |

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයයේ හෝ බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත්කර එම කුවිතාන්සිය බණ්ඩාරවෙල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් ඉහත සඳහන් පරිදි හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 සැප්තැම්බර් මස 4 වැනිද දවල් 12.30 දක්වා ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 ට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්). වැක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සිය කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ බණ්ඩාරවෙල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සිය නිකුත් කරණු ලබන්නේ ලියා පදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

3. දෙවැනි ඡෙදයේ සඳහන්කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍යවේ. ඔවුන් දෙවැනි ඡෙදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කල යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි සහ 3 වැනි ඡෙදවල සඳහන් පරිදි බණ්ඩාරවෙල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂයෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කල යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධව සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද ලබාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුයි. තැපෑලෙන් නො එවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේ පාලන නිලධාරී/ප්‍රධාන ලිපිකාර වෙත භාරදිය යුතුය. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 සැප්තැම්බර් මස 5 වැනිදා පෙරවරු 10.30 ට බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් කල දින සිට සති හයක් ගතවනතුරු තමන් සඳහන් කරන ලද මිල ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර් කරුවන් කැමතිවිය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් බණ්ඩාරවෙල ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරික්ෂාකර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

පී. ඊ. ජී. මැන්ඩිස්,
වැඩබලන ඌව ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 අගෝස්තු මස 17 දින,
බණ්ඩාරවෙල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදිය.

8–1328 — 69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 සැප්තැම්බර් මස 12 වෙනි දින ප.ව. 2.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| අ/හල්මිල්ලෑව විද්‍යාලය ... | පාඨශාලා ගොඩනැගිල්ලක් තැනීම |

සංලක්ෂ්‍යයය : අ = අනුරාධපුර දිස්ත්‍රික්කය

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2 මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ හෝ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය අනුරාධපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් රු. 25,000 ක් හෝ ඊට වැඩි ගණනකට, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 සැප්තැම්බර් මස 11 ද පෙ.ව. 12.00 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්) චෙක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සිය කොළඹ 2 මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ අනුරාධපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරණු ලබන්නේ ලියා පදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරණ අයට පමණි.

3. දෙවෙනි ඡෙදයේ සඳහන්කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචි වී ඇති අනුමත සමිති වලටද මේ වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍යය. ඔවුන් දෙවෙනි ඡෙදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වෙනි හා 3 වෙනි ඡෙදවල සඳහන් පරිදි අනුරාධපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළයුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කළ තැපෑලෙන් අනුරාධපුර අධ්‍යාපන කාර් යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර් කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර වෙත භාරදිය යුතුයි. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 සැප්තැම්බර් මස 12 වැනිද ප.ව. 2.30 ට අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරණ නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරණ ලද මිල ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර් කරුවන් කැමැති විය යුතුයි.

7. වෙනත් අවශ්‍ය විස්තරයක් වෙතොත් අනුරාධපුර ප්‍රාදේශිය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 1966.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරණ ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත් කරුවන්ගේ ලියාපදිංචි කිරීම අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරණ ලද ලියාපදිංචි කිරීම හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

එල්. බී. ගුණසේකර,
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අනුරාධපුර.

1969 අගෝස්තු මස 21 වැනිද,
අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේදීය.

8–1369—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ පිහිටි පුරාවිද්‍යා දෙපාර්ත මේන්තුවේ ගබඩා බඩු සහ වෙනත් ද්‍රව්‍ය 1969/70 මුදල් වර්ෂය තුළ දී කොළඹ සහ ඒ අවට ලොරි/කරත්ත මගින් ප්‍රවාහණය කිරීම සඳහා ටෙන්ඩර්පත් වැඩබලන පුරාවිද්‍යා කොමසාරිස් තැන විසින් 1969 සැප්තැම්බර් මස 20 වැනි දින දවල් 12.00 තෙක් භාරගනු ලැබේ.

2. 1969 සැප්තැම්බර් මස 19 වැනි දින පස්වරු 3,00 තෙක් වැඩබලන පුරාවිද්‍යා කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍ර පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුයි. රු. 25 ක මුදලක් මෙම කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසු මෙම ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. වැඩි විස්තර වැඩබලන පුරාවිද්‍යා කොමසාරිස්තැනගෙන් ලබාගත හැකිය.

රාජා ද සිල්වා,
වැඩබලන පුරාවිද්‍යා කොමසාරිස්.

1969 අගෝස්තු මස 15 වැනි දින,
කොළඹ 7, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේදී ය.
ඇ.ස්.ඇස්. 148–69/70.

8–1439—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 සැප්තැම්බර් මස 19 වැනි සිකුරාදා ප.ව. 2.30 වනතෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර, මහනුවර, අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| | පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|---|
| 1. | මහ/උයන්වත්ත ගුරු විද්‍යාලය ... | 86′ × 20′ ගොඩනැගිල්ල නැවත ඉදිකිරීම |
| 2. | මහ/යටවර විද්‍යාලය ... | වහල අලුත්වැඩියාව |
| 3. | මහ/නිග්‍රෝධකෙත විද්‍යාලය ... | ජල සේවය හා විදුලි ආදිය |
| 4. | මහ/පුජාපිටිය මහා විද්‍යාලය ... | අලුත්වැඩියාව |
| 5. | මහ/ඉල්ලගොල්ලවත්ත විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ |
| 6. | මහ/ගම්පල ගුරු විද්‍යාලය ... | අලුත්වැඩියාව හා වැඩිදියුණු කිරීම |
| 7. | මහ/ගැටඹේ මහා විද්‍යාලය ... | 50′ × 20′ පාසැල් ගොඩනැගිලි දෙකක් |
| 8. | මහ/තෙල්දෙනිය මුස්ලිම් විද්‍යාලය ... | 120′ × 20′ පාසැල් ගොඩනැගිල්ල. |

සංලක්ෂ්‍යය : මහ = මහනුවර ප්‍රදේශය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් වැඩ අංක 1 සිට 4 දක්වා රු. 10,000 හා ඊට වැඩි ගණනකට, වැඩ අංක 5 රු. 15,000 හා ඊට වැඩි ගණනකට, වැඩ අංක 6 රු. 25,000 හා ඊට වැඩි ගණනකට, වැඩ අංක 7 රු. 30,000 හා ඊට වැඩි ගණනකට, වැඩ අංක 8 රු. 35,000 හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 සැප්තැම්බර් මස 17 වැනි බදාදා දවල් 12 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්). චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ මහනුවර, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදිය ද බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් මහනුවර, අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව මහනුවර අධ්‍යාපන කාර්යාලයේ පරිපාලන නිලධාරි වෙත භාරදිය යුතුයි. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 සැප්තැම්බර් මස 19 වැනි සිකුරාදා ප.ව. 2.30 ට මහනුවර අධ්‍යාපන කාර්යාලයේ දී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කල දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර් කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

ජී. බී. රත්නායක,
මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 අගෝස්තු මස 21 වැනි දින,
මහනුවර අධ්‍යාපන කාර්යාලයේ දී ය.

8–1415—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය දෙපාර්තමේන්තුවට ඇස්බැස්ටස් තහඩු සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර දුම්රිය මූලස්ථාන ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් (ලිපිනය : දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලය, තැ. පෙ. 355, කොළඹ 10), 1969 සැප්තැම්බර් 29 වෙනි සඳුදා පෙ. ව. 11.00 වන තෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පළමු ටෙන්ඩර්කරුවන් විසින් ඉහත සඳහන් සේවාව භාරගැනීමට සහ හරියාකාර ඉටුකිරීමට තමාගේ මුදල් තත්වය ප්‍රමාණවත් බව, අවශ්‍ය වුවහොත් ඔප්පු කිරීම පිණිස ඒ සම්බන්ධයෙන් ලියකියවිලි ඉදිරිපත් කිරීමට සූදානම් වියයුතුයි.

3. මරදානේ දුම්රිය ගබඩා අධිකාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්ම කොළවල ටෙන්ඩරය ලියා අනුපිටපතක් සහිතව එවිය යුතුය.

4. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 100 ක් මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත්කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1969.9.28 වෙනි ඉරිදා දහවල් 12.00 වනතෙක් ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

5. 1969 සැප්තැම්බර් 29 වෙනි සඳුදා පෙරවරු 11.05 ට දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටීමට අවසර ඇත.

6. වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ඇම්. සරින්,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.

1969 අගෝස්තු 21 වෙනි දින,
කොළඹදීය.

8–1424—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

1970 සැප්තැම්බර් මස 30 දයින් අවසන් වන කාල පරිච්ඡේදය තුළ අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයිති කොළඹ ඩී. ආර්. විජේවර්ධන මාවතේ (මැකලම් පාරේ) පිහිටි ප්‍රවාහන අංශයේ මෝටර් රථවල—

1. සිලින්ඩර් මුදුන්කඩ මට්ටම් කිරීම්,
2. දහරකඳ (ක්‍රෑන්ක්ෂාෆ්ට්) සහ ජර්නලය ලියවීම,
3. මහකොණ බෙයාරින්ග්ස්වල ලෝහ දමා ලියවා සකස් කිරීම,
4. අළුත් ස්ලීව් වද්දා බෝර්කිරීම/ලියවීම

යන කාර්‍යයන් සඳහා ටෙන්ඩර් 1969 සැප්තැම්බර් මස 15 වැනි බදාදා අ.භා. 2.30 වන තෙක් කොළඹ වැතැම් වීදියේ අංක 62 හි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

කොළඹ කොටුවේ වැතැම් වීදියේ අංක 62 හි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්‍යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 50ක් බැඳ කුවිතාන්සියක් ලබාගෙන ඉදිරිපත් කළවිට 1969 සැප්තැම්බර් මස 15 වැනි බදාදා දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම අලෙවි කිරීමේ කොමසාරිස් කාර්‍යාලයෙන් ලබාගත හැක.

වැඩි විස්තර කොළඹ ඩී. ආර්. විජේවර්ධන මාවතේ (මැකලම් පාරේ) පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශයෙන් දැනගැනීමට පුළුවන.

ආර්. එෆ්. සී. ද ලිවේරා,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1969 අගෝස්තු මස 21 වැනි දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේදීය.

8–1375—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ මැකලම් පාරේ පිහිටි ප්‍රවාහන අංශයේ ඇති මෝටර් රථවල කුෂන්, සහ ආවරණ තිර 1970.9.30 න් අවසන් කාලය සඳහා මසා සවි කිරීම පිණිස මිළ ගණන් 1969 සැප්තැම්බර් 15 වැනි සඳුද අ.භා. 2.30 දක්වා කොළඹ කොටුවේ වැනැම් වීදියේ අංක 62 දරණ තැන අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

2. කොළඹ කොටුවේ වැනැම් වීදියේ අංක 62 හි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් 1969 සැප්තැම්බර් මස 15 වැනිද දවල් 12.00 දක්වා මිළ ගණන් පෝර්ම ලබාගත හැක.

3. වැඩි විස්තර කොළඹ මැකලම් පාරේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශයෙන් දැන ගත හැක.

ආර්. ඇෆ්. සී. ද ලිවේරා,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1969 අගෝස්තු මස 21 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව.

8–1376—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## මහජන බැංකුව

තලවාකැලේ මහජන බැංකු ශාඛා ගොඩනැගිලි ඉදි කිරීම සඳහා පිළිගත් කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

පසුගිය වසර දෙක ඇතුළත රු. 1,50,000/- හෝ ඊට වැඩි අගය ඇති තනි ගොඩනැගිල්ලක් සතුටුදායක ලෙස නිම කළ බවට සාක්ෂි, එස්. එච්. පීරිස් සහ ආනන්ද පීරිස් ගෘහ නිර්මාණ ශිල්පීන් වෙත ඉදිරිපත් කිරීමට ටෙන්ඩර් කරුවන්ට හැකි වියයුතුය. ගෘහ නිර්මාණ ශිල්පීන් වෙත සුදුසුකම් පිළිබඳව සාක්ෂි සතුටුදායක ලෙස ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

කොළඹ 7, විජේරාම මාවතේ, අංක. 27 දරණ පරිශ්‍ර දෙපාර්තමේන්තුවේදී, කාර්යාල වේලාවන්හි මෙම ගොඩනැගිලි පිළිබඳ අහල් ¼″ හා ½″ සවිස්තර සැලසුම් පත් ඇතුළත් සියලුම සැලසුම් පත් කොන්ත්‍රාත්කරුවන්ට අවශ්‍ය වේ නම් බලා ගතහැක.

කොළඹ 1, සෙලින්කෝ මන්දිරයේ, පස්වන මහලේ පිහිටි, එස්. එච්. පීරිස් සහ ආනන්ද පීරිස් ගෘහ නිර්මාණ ශිල්පීන් විසින් 1969 සැප්තැම්බර් මස 7 දින සිට 1969 සැප්තැම්බර් මස 14 දින දක්වා කාර්යාලයීය වේලාවලදී ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. අහල් 1/8 පරිමාණ සැලසුම්, ප්‍රමාණාත්මක සැලසුම්, සවිස්තර සැලසුම් සහ සම්භාර බිල්පත් වෙනුවෙන් රු. 50/-ක ටෙන්ඩර් ගාස්තුව ඉල්ලුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළයුතුය. මෙම මුදල ආපසු දෙනු නො ලැබේ. විස්තර සැලසුම් ලබා ගැනීමට කැමැති අය අමතර රු. 100/-ක ගාස්තුවක් ගෙවා ගෘහ නිර්මාණ ශිල්පීන්ගෙන් ඒවා ලබා ගතයුතුය.

කොන්ත්‍රාත්තුව භාර දෙනුයේ මුලු මුදලකටය.

සියලුම ටෙන්ඩර් පත් හෝ ඕනෑම ටෙන්ඩර් පතක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බැංකුව සතුය.

"තලවාකැලේ මහජන බැංකු ගොඩනැගිලි සඳහා ටෙන්ඩර් පත" යනුවෙන් සඳහන් කොට මුද්‍රා තැබූ ටෙන්ඩර් පත්, කොළඹ 7, විජේරාම මාවතේ, අංක. 27 දරණ ස්ථානයේ මහජන බැංකුවේ, සැපයීම් හා පරිශ්‍ර නිලධාරිතුමා වෙත 1969 සැප්තැම්බර් මස 26 දින පස්වරු 4.30ට පෙර ලැබියයුතුය.

සැපයීම් හා පරිශ්‍ර නිලධාරි.

මහජන බැංකුව,
අංක. 27, විජේරාම මාවත,
කොළඹ 7,
1969.8.22.

8—1416—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඉප/60/සී/1.

## ගාලු කච්චේරිය

ගාලු දිස්ත්‍රික්කයේ පහත උප ලේඛනයේ සඳහන් තැනීම් වැඩ සඳහා 1969 සැප්තැම්බර් මස 19 වැනි සිකුරාදා ප.ව. 2.30 වන තෙක් ගාල්ලේ දිසාපති තැන විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ. එදින එකී වේලාවට ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. එම ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර් කරුවන්ට එම කාර්යාලයට පැමිණ සිටිය හැකිය. ටෙන්ඩර් තැන්පත් කරන පෙට්ටිය ගාල්ලේ උප දිසාපතිගේ කායඞාල කාමරයේ තබනු ඇත. එක් එක් වැඩය වෙනුවෙන් වෙන වෙනම ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතු වේ.

2. ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුත්තේ ගාල්ලේ දිසාපති වෙතින් ලබාගත යුතු වන ආකෘති පත්‍ර මගින් පිටපත් දෙකකින් යුක්තවයි. මෙම වැඩ පිළිබඳ සැලසුම් පූර්වෝක්ත දිසාපති කාර්යාලයේ දී බැලිය හැකි වන අතර, ඒ පිළිබඳ සියලු විස්තර ඔහු වෙතින් ලබාගත හැක.

3. පහත සඳහන් ඒ ඒ වැඩවලට ඉදිරියෙන් දක්වා ඇති මුදලට හෝ ඊට වැඩි මුදලකට කොන්ත්‍රාත් වැඩ සඳහා රජයේ ලියාපදිංචි වී ඇති පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ට හා රජයේ වැඩ, වාරිමාර්ග, අධ්‍යාපන හෝ වෙනත් දෙපාර්තමේන්තුවල ඒ ඒ වැඩවලට ඉදිරියෙන් දක්වා ඇති මුදලට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි වී ඇති, මෙවැනි වැඩ හොඳින් කිරීමට හැකියාවක් තිබෙන සමුපකාර හා ග්‍රාම සංවර්ධන සමිතිවලට ද මෙම වැඩ සඳහා ඉල්ලුම් කළ හැකි අතර, ඒ වෙනුවෙන් ඉහත සඳහන් දිසාපති වෙත එසේ ලියාපදිංචි වී තිබීම හා හැකියාව පිළිබඳ සාධකත්, රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා වූ කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතු වන්නේය. ටෙන්ඩර් පත් නිකුත් කරනු ලබන අවසාන දිනය 1969 සැප්තැම්බර් මස 16 වැනි දින ප.ව. 3.00 දක්වා වන්නේය. ලියාපදිංචි සමිති විසින් ටෙන්ඩර් තැන්පත් තැබීම අවශ්‍ය නො වේ. එහෙත් ඒ ඒ සමිතිවලට අදාල දෙපාර්තමේන්තුවල දිස්ත්‍රික්ක ප්‍රධානීන්ගෙන් ලබාගත් තමන්ගේ හැකියාවන් පිළිබඳ සහතික මා වෙත ඉදිරිපත් කළයුතු වන්නේය.

4. මෙම ටෙන්ඩර් තැන්පත් මුදල ගාල්ලේ දිසාපති කාර්යාලයයේ හෝ ගාල්ලෙන් පිටත ඕනෑම දිසාපති කාර්යාලයකදී හෝ කොළඹ මුදල් භාණ්ඩාගාරයේ දී හෝ ගෙවීමට පිළිවන.

5. ටෙන්ඩර් බහාලන ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරේ " ............ සඳහා ටෙන්ඩර් පත්‍රය " යනුවෙන් සඳහන් වියයුතු අතර, සියලුම ටෙන්ඩර් පත්‍ර අත්සන් කර සීල් කර, සුරක්ෂිතව ඉදිරිපත් කළ යුතු යි.

ඩබ්. එල්. ආර්. බී. ද අල්විස්,
උප දිසාපති,
ගාල්ලේ දිසාපති වෙනුවට.

1969 අගෝස්තු මස 13 වෙනි දින,
ගාල්ලේ දිසාපති කාර්යාලයේදී ය.

### උපලේඛනය

| | වැඩ විස්තරය | පිහිටි ප්‍රදේශය | ලියාපදිංචි වී තිබිය යුතු මුදල රු. |
|---|---|---|---|
| 1. | දම්මල-හල්විටිගල පාර 2 වැනි සැතපුම (1 වැනි කොටස) ඉතිරි වැඩ ... ... ... | හිනිදුම් පත්තුව ... | 15,000 |
| 2. | දම්මල-හල්විටිගල පාර 2 වැනි සැතපුම (2 වැනි කොටස) ඉතිරි වැඩ ... ... ... | එම ... | 15,000 |
| 3. | හල්විටිගල ජනපදයේ 2 වන පියවරේ 1 වැනි සැතපුම. ඉතිරි වැඩ ... ... ... | එම ... | 15,000 |

8–1245—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

අංකය : ඉප/60 ඩී

## ගාලු කච්චේරිය

ගාලු දිස්ත්‍රික්කයේ පහත උප ලේඛනයේ සඳහන් තැනීම් වැඩ සඳහා 1969 සැප්තැම්බර් මස 19 වැනි සිකුරාද ප.ව. 2.30 වන තෙක් කොළඹ (තැ.පෙ. 500) ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ටෙන්ඩර් පත් බාරගනු ලැබේ. එම ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට එම කාර්යාලයට පැමිණ සිටිය හැකිය. ටෙන්ඩර් තැන්පත් කරන පෙට්ටිය ගාලු මුවදෙර මහා ලේකම් කාර්යාලයේ තුන්වෙනි කට්ටුවේ පිහිටි ඉඩම් කොමසාරිස් කාර්යාලයේ අංක 357 දරණ කාමරයේ තබනු ඇත.

2. ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුත්තේ ගාල්ලේ දිසාපති වෙතින් ලබාගත යුතු වන ආකෘති පත්‍ර මගින් පිටපත් දෙකකින් යුක්තවයි. මෙම වැඩ පිළිබඳ සැලසුම් පූර්වෝක්ත දිසාපති කාර්යාලයේ දී බැලිය හැකි වන අතර, ඒ පිළිබඳ සියලු විස්තර ඔහු වෙතින් ලබාගත හැක.

3. පහත සඳහන් ඒ ඒ වැඩවලට ඉදිරියෙන් දක්වා ඇති මුදලට හෝ ඊට වැඩි මුදලකට කොන්ත්‍රාත් වැඩ සඳහා රජයේ ලියාපදිංචි වී ඇති පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ට හා රජයේ වැඩ, වාරිමාර්ග, අධ්‍යාපන හෝ වෙනත් දෙපාර්තමේන්තුවල ඒ ඒ වැඩවලට ඉදිරියෙන් දක්වා ඇති මුදලට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි වී ඇති, මෙවැනි වැඩ හොඳින් කිරීමට හැකියාවක් තිබෙන සමුපකාර හා ග්‍රාම සංවර්ධන සමිතිවලට ද මෙම වැඩ සඳහා ඉල්លුම් කළ හැකි අතර, ඒ වෙනුවෙන් ඉහත සඳහන් දිසාපති වෙත එසේ ලියා ලියාපදිංචි වී තිබීම හා හැකියාව පිළිබඳ සාධකත්, රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා වූ කුවිතාන්සියත් ඉදිරිපත් කළ යුතු වන්නේය. ටෙන්ඩර් පත් නිකුත් කරනු ලබන අවසාන දිනය 1969 සැප්තැම්බර් මස 14 වැනිද ප.ව. 3.00 දක්වා වන්නේය. ලියා පදිංචි සමිති විසින් ටෙන්ඩර් තැන්පත් තැබීම අවශ්‍ය නොවේ. එහෙත් ඒ ඒ සමිති වලට අදාල දෙපාර්තමේන්තුවල දිස්ත්‍රික්ක ප්‍රධානීන්ගෙන් ලබාගත් තමන්ගේ හැකියාවන් පිළිබඳ සහතික මා වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

4. මෙම ටෙන්ඩර් තැන්පත් මුදල ගාල්ලේ දිසාපති කාර්යාලයේ හෝ ගාල්ලෙන් පිටත ඕනෑම දිසාපති කාර්යාලයකදී හෝ කොළඹ මුදල් භාණ්ඩාගාරයේ දී හෝ ගෙවීමට පිළිවන.

5. ටෙන්ඩර් බහාලන ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරේ ''දම්මල–හල්විටිගල පාර 1 වැනි සැතපුම තාර දැමීම සඳහා ටෙන්ඩර් පත්‍රය'' යනුවෙන් සඳහන් විය යුතු අතර , සියලුම ටෙන්ඩර් පත්‍ර අත්සන් තබා සීල් කර, සුරක්ෂිතව ඉදිරිපත් කළ යුතුයි.

ඩබ්ලිව්. එල්. ආර්. බී. ද අල්විස්,
උප දිසාපති,
ගාල්ලේ දිසාපති වෙනුවට.

1969.8.13 දින,
ගාල්ලේ, දිසාපති කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | වැඩ විස්තරය | පිහිටි ප්‍රදේශය | ලියාපදිංචි වී තිබියයුතු මුදල |
|---|---|---|---|
| | | | රු. |
| 1. | දම්මල–හල්විටිගල පාර 1 වැනි සැතපුම තාර දැමීම | හිනිදුම්පත්තුව ... | 40,000 |

8—1243—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

එල්. එම්. 1505 (2).

## මහනුවර දිස්ත්‍රික්කයේ තැනීම් වැඩ

මහනුවර දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩය සඳහා 1969 සැප්තැම්බර් මස 19 වැනි දින පස්වරු 2.30 දක්වා කොළඹ, තැ.පෙ. අංක 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ :—

| වැඩයේ ස්වභාවය | ලියාපදිංචි වියයුතු මුදල |
|---|---|
| කුරුඳුවත්ත පාර ගල් අතුරා තාර දැමීම ... | රුපියල් 15,000 |

2. ඉහත සඳහන් වැඩය ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට රජයේ දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියා පදිංචි වී ඇති ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති සහ සමුපකාර සමිතිවලට සහ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ටද 1969 සැප්තැම්බර් මස 15 වැනි දින දවල් 12 තෙක් ටෙන්ඩර් පෝරම මහනුවර කච්චේරියෙන් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් විසින් මහනුවර කච්චේරියේ තමන් විසින් ඉල්ලුම් කරන වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් මහනුවර දිසාපති වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති සහ සමුපකාර සමිති ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට මුදල් තැන්පත් කිරීම අනවශ්‍ය ය. චෙක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් පෝර්ම සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපැලෙන් යැවිය යුතුයි. ටෙන්ඩර් බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර කවරයේ වම් උඩ කෙළවරේ වැඩෙහි නම ලියා තිබිය යුතුයි. ටෙන්ඩර් පෝර්ම තැපැලෙන් නොඑවන්නේ නම් ගාළු මුවදෙර මහා ලේකම් කාර්යාලයේ අංක 357 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුයි.

5. 1969 සැප්තැම්බර් මස 19 වැනි දින ප. ව. 2.30 ට ඉහතකී 357 දරණ කාමරයේ දී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

6. මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ කරවා ගැනීමට පුහුණු සහ නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු අතර එවැනි කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කරන ප්‍රදේශයේ සිටින අය අතුරෙනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරා ලීමට කොන්ත්‍රාත්කරු යම්කිසි විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට අලඹෙන නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ගේ එකඟත්වය ඇති නිශ්චිත ලියවිල්ලකින් එකී නිලධාරියා අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත් කරුට බලය දිය හැකිය.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික කම්කරුවන් යෙදවීම තහනම් වන අතර එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

මෙම කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා 'ලාංකික' යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ලංකාවේ රටවැසියෙකු අදහස් කරන අතර එවැන්නකු එකී පාඨයට ඇතුළත් වේ.

මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ කරවා ගැනීම සඳහා සෑම කොට්ඨාශයකටම සාධාරණ වූද කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බල පවත්වන සහ මින්පසු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසි වලට අනුකූල වූද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුයි. කොන්ත්‍රාත් කරු විසින් එකී වැඩය කෙරෙහි යොදවනු ලබන කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පතපොත, චෙක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ විධිමත් පරිදි බලය දෙනු ලැබූ නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

7. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු ඉල්ලුම් කළවිට මහනුවර දිසාපතිගෙන් ලබාගත හැකිය.

ඇම්. බී. තෙන්නකෝන්,
මහනුවර දිසාපති වෙනුවට.

1969 අගෝස්තු මස 18 වැනි දින,
මහනුවර කච්චේරියේ දීය.

8–1325—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

කොළඹ 5, කිරුළ පාරේ අංක 200 දරණ ස්ථානයේ පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් කසු රෙදි වලට සුදුසු ස්ක්‍රීන් මුද්‍රණ තීන්ත ගැලුම් 6,000ක් සැපයීම සඳහා සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර දේශීය හා විදේශීය සැපයුම්කරුවන්ගෙන් 1969 ඔක්තෝබර් 30 වෙනි දින පෙ.ව. 10.00 වනතෙක් බාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර නියමිත පෝරමවල ලියා අනුපිටපතකින් ද යුක්තකොට එවිය යුතුය. මෙම පෝර්ම පත් කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන සම්පාදක නිලධාරි තැනගේ කාර්‍යාලයෙන් 1969 ඔක්තෝබර් මස 29 දින දවල් 12.00 වනතෙක් ලබාගත හැකිය. මෙම පෝර්ම පත් ලබාගැනීමට කොළඹ 5, කිරුළ පාරේ නො.200 දරණ ස්ථානයෙහි ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන ගිණුම් නිලධාරිතැන වෙත මුදලින් රු. 100ක් තැන්පත් කර ඒ වෙනුවෙන් ලබාගන්නා ලද රිසිට් පත ඉදිරිපත් කළ යුතුය.

වැඩි විස්තර ප්‍රධාන සම්පාදක නිලධාරිතැනගේ කාර්‍යාලයෙන් ලබාගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරිතැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

200, කිරුළ පාර, කොළඹ 5,
1969.8.22.

8–1426—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

## ලංකා ගමනාගමන මණ්ඩලය

කොළඹ 5, කිරුළ පාරේ, 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත දක්වෙන භාණ්ඩ සැපයීම පිණිස එහි සඳහන් දිනයන්හි පෙ.ව. 10.00 වනතෙක් සිල් තැබූ ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

| | අවසාන දිනය |
|---|---|
| (අ) ලංගම සැලසුම් අනුව දැව භාණ්ඩ සාදා සැපයීම ... | 27. 9.69 |
| (ආ) වානේ/ලෝහ කායාීලයීය උපකරණ සැපයීම ... | 4.10.69 |

ටෙන්ඩර් පත්‍ර නියමිත පෝර්මවල ලියා අනු පිටපතකින්ද යුක්තකොට එවිය යුතුයි. මෙම පෝර්ම පත් කොළඹ 5, කිරුළ පාරේ, 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන සම්පාදක නිලධාරි තැනගේ කායාීලයෙන් පිළිවෙලින් 1969.9.26 දින හා 1969.10.1 දින දවල් 12.00 වනතෙක් ලබාගත හැකිය. පෝර්මපත් ලබාගැනීමට කොළඹ 5, කිරුළ පාරේ, නො. 200 දරණ ස්ථානයෙහි ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත මුදලින් රු. 100 ක් තැන්පත් කර ඒ වෙනුවෙන් ලබාගන්නා ලද රිසිට් පත ඉදිරිපත් කළ යුතුයි.

වැඩි විස්තර ප්‍රධාන සම්පාදක නිලධාරි තැනගේ කායාීලයෙන් ලබාගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරි තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

200, කිරුළ පාර,
කොළඹ 5,
1969.8.19.

8–1386—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

කොළඹ 5, කිරුළ පාරේ, අංක 200 වෙනි ස්ථානයේ පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් නිළ ඇඳුම් රෙදි සැපයීම සඳහා සිල් තැබූ ටෙන්ඩර් පත්‍ර 1969 සැප්තැම්බර් මස 29 වෙනි දින පෙ.ව. 10.00 වනතෙක් භාරගනු ලැබේ.

| | | යාර |
|---|---|---|
| 1. | කාකි ඩ්රිල් 28"/29" පළල (සැන්ෆොරයිස්ඩ්) ... | 400,000 |
| 2. | අලුපාට වසෝ ,, ,, ,, ... | 50,000 |
| 3. | නිල්පාට ඩ්රිල් ,, ,, ,, ... | 4,200 |
| 4. | සුදු පොප්ලින් 36" පළල ... | 500 |

ටෙන්ඩර් පත්‍ර නියමිත පෝර්මවල ලියා අනුපිටපතකින්ද යුක්තකොට එවිය යුතුය. මෙම පෝර්මපත් කොළඹ 5, කිරුළ පාරේ, 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන සම්පාදක නිලධාරි තැනගේ කායාීලයෙන් 1969 සැප්තැම්බර් මස 28 දින දවල් 12.00 වන තෙක් ලබාගත හැකිය. මෙම පෝර්ම පත් ලබාගැනීමට කොළඹ 5, කිරුළ පාරේ, නො. 200 දරණ ස්ථානයෙහි ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන ගිණුම් නිලධාරීතැන වෙත මුදලින් රු. 100 ක් තැන්පත් කර ඒ වෙනුවෙන් ලබාගන්නා ලද රිසිට් පත ඉදිරිපත් කළ යුතුය.

වැඩි විස්තර ප්‍රධාන සම්පාදක නිලධාරීතැනගේ කායාීලයෙන් ලබාගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරීතැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

200, කිරුළ පාර,
කොළඹ 5,
1969.8.21.

8–1387—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## ඇලුමිනා සල්ෆේට් සහ වී.සී.ඇල් කුඩු සැපයීම

කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ, 415 දරණ, ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ, මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969.9.27 වෙනි දින දහවල් 12.00 දක්වා ඉහත සඳහන් සැපයීම් සඳහා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

2. සියළු විස්තර හා තොරතුරු කොළඹ 7, ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ කායාීලයෙන් නියමිත දිනට පෙර ලබාගත හැකි ටෙන්ඩර් පත්වල අනුපිටපතකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත් ලබා ගැනීමට පෙර ටෙන්ඩර් කරුවන් විසින් ටෙන්ඩරයකට රු. 200 ක මුදලක් ඉහත සඳහන් කායාීලයෙහි තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

3. කවරය උඩ වම් කෙලවරෙහි "ඇලුමිනා සල්ෆේට් සහ වී.සී.ඇල්. කුඩු සැපයීම" ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය යන්න සඳහන් කළ යුතු අතර, ටෙන්ඩර් පත් ලේඛනගත තැපැලෙන් එවීම හෝ කොළඹ පිහිටි මණ්ඩලීය ප්‍රධාන කායාීලයෙහි ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුයි.

සභාපති,
මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලය,
ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය.

8–1418—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

පහත සඳහන් සැපයීම් සඳහා ඉදිරිපත් කරනු ලබන මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්, 1969 සැප්තැම්බර් මස 15 වන දින පස්වරු 2.30 දක්වා ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි තැන විසින් භාරගනු ලැබේ :—

(1) කිරුවාන ගල් සැපයීම

| | | |
|---|---|---|
| ටෙන්ඩර් පත් නිකුත් කරන අවසන් දිනය | ... | 1969.9.13 |
| ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල | ... | රු. 500 |
| ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව | ... | රු. 10 |

(2) පාච්චි කළ සගෝනි සැපයීම

| | | |
|---|---|---|
| ටෙන්ඩර් පත් නිකුත් කරන අවසන් දිනය | ... | 1969.9.13 |
| ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල | ... | රු. 100 |
| ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව | ... | රු. 10 |

මෙම ටෙන්ඩර් තැන්පත් මුදල් සහ ටෙන්ඩර් ගාස්තු, මුදලින් ගෙවිය යුතු බව සැළකිය යුතුයි.

සැපයීම් කළමණාකරු.

ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය,
සැපයීම් සහ වාප්පු දෙපාර්තමේන්තුව,
55, රොස්මීඩ් පෙදෙස, කොළඹ 7.

8–1419—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

වාලච්චේනයි හි නැගෙනහිර කඩදාසි කම්හලට බ්ලීච්ඩ් (සුඩ කළ) සල්ෆයිට් දිග ටොන් (රු. 2,240 හේ) 1,500 ක් සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

1969 නොවැම්බර් 21 දින ප. ව. 2 ට ටෙන්ඩර් භාරගැනීම අවසන් වේ.

මූලිකයන්ගේ/සැපයුම්කරුවන්ගේ නම් හා ලිපිනයන් අඩංගුකොට අයදුම් කළ විට ටෙන්ඩර් ආකෘති පත්‍ර හා අනෙකුත් විස්තර ලබා ගත හැක.

සාමාන්‍යාධිකාරී,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

1969 අගෝස්තු 10 දින,

කොළඹ 2, යූනියන් පෙදෙස, අංක 135 දිය.

8–1368—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1969 ඔක්තෝබර් මස 7 වෙනි අඟහරුවාද පස්වරු 2.30 දක්වා සමීක්ෂණ මණ්ඩලයක් මඟින් සේවයට නුසුදුසු යයි තීරණය කරන ලද පහත සඳහන් වාහන විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබේ.

| | |
|---|---|
| සීඊ. 2710 (කො.ව.කො.) අංක 15127 | —ටොන් $3\frac{1}{2}$ පෝඩ් රථය |
| සීඇන්. 7345 (කො.ව.කො. අංක 1803) | —ටොන් 3 නේ වැසිසයිඩ් ඩම්පරය |
| සීවී. 542 (කො.ව.කො. අංක 1805) | —ටොන් 3 නේ වැසිසයිඩ් ඩම්පරය |
| සීවී. 540 (කො.ව.කො. අංක 1809) | —ටොන් 3 නේ වැසිසයිඩ් ඩම්පරය |
| සීවී. 1503 (කො.ව.කො. අංක 1810) | —ටොන් 3 නේ වැසිසයිඩ් ඩම්පරය |
| සීවී. 1531 (කො.ව.කො. අංක 1811) | —ටොන් 3 නේ වැසිසයිඩ් ඩම්පරය |
| සීවී. 1532 (කො.ව.කො. අංක 1815) | — ටොන් 3 නේ වැසිසයිඩ් ඩම්පරය |
| අයිසී. 1114 ... | — ටොන් $3\frac{1}{2}$ ඔස්ටින් රථය |
| අයිසී. 1148 ... | —ටොන් $3\frac{1}{2}$ ඔස්ටින් රථය |
| අයිසී. 1953 ... | — තෙම්ස් |
| සීවී. 4712 ... | — ටොන් 3 නේ පෝඩ්සන් |
| සීවී. 1533 (කො.ව.කො. අංක 1816) | — ටොන් 3 නේ වැසිසයිඩ් ඩම්පරය |

2. 1969 ඔක්තෝබර් 7 වෙනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. 1969.8.29 වෙනි දින සිට 69.10.7 වෙනි දින පෙරවරු 9.00 සිට පස්වරු 4.00 දක්වාත් පෙර පෝය දිනයන්හි 9.00 සිට පස්වරු 12.00 දක්වාත් මෙම වාහන වරාය කොමිෂන් සභාවේ මෝටර් ගරාජයේදී පරීක්ෂා කර බැලීමට පුළුවන.

3. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාර ගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය. නැතහොත් ටෙන්ඩර්කරුවන්ට තමන්ගේ ටෙන්ඩර් දෙපාර්තමේන්තු ටෙන්ඩර් පෙට්ටියෙහි පුද්ගලිකව තැන්පත් කළ හැක.

4. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛණ කොළඹ වරාය කොමිෂන් සභා කායඝාලයේදී පරීක්ෂා කළ හැක. රු. 200 ක මුදලක් වරාය කොමිෂන් සභා කායඝාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබා ගත හැක. ටෙන්ඩර් කොන්දේසිවලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

5. ඉහත සඳහන් අන්දමට ලබාගත් පෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1969 ඔක්තෝබර් 5 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

කේ. එච්. ඇස්. ගුණතිලක,
වරාය කොමසාරිස් වෙනුවට.

1969 අගෝස්තු 29 දින
කොළඹ වරාය කොමිෂන් සභා කායඝාලයේදීය.

8–1438—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### වෙන්දේසියේ විකිණීම

ඉතා හොඳ තත්ත්වයේ ඇති, පාවිච්චි කරන ලද වාහන 15ක් පමණ 1969 සැප්තැම්බර් මස 22 වෙනි සඳුද පෙරවරු 10 ට කොළඹ 2, ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වාහන ඉහත සඳහන් ස්ථානයේ දී කාර්යාලයීය වේලාවන්හි දී පරීක්ෂා කර බැලිය හැක.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ ගබඩා අධිකාරිගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ඇස්. ඒ. සී. රූපසිංහ,
ගබඩා අධිකාරි.

1969 අගෝස්තු 29 දින,
කොළඹ දීය.

8–1432—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : ඇල්. ඩබ්ලිව්./2/27.

## පුත්තලම දිස්ත්‍රික්කයේ ගලයාය වත්තේ රජයේ ගොඩනැගිලි වෙන්දේසියේ විකිණීම

වෙන්නප්පුව ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ, ගලයාය වත්තේ තිබෙන රජයේ පැරණි ගොඩනැගිල්ල 1969 සැප්තැම්බර් මස 24 වෙනි දින පෙරවරු 10 ට එම ස්ථානයේදීම, පුත්තලමේ දිසාපති විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් දනුම් දෙමි.

2. මෙම වෙන්දේසිය සඳහා ලංසුවක් ඉදිරිපත් කරන තැනැත්තෙකුගේ නිර්ව්‍යාජත්වය හා වෙන්දේසියේ කොන්දේසිවලට අනුකූලව එම තැනැත්තාට ක්‍රියාකිරීමට ඇති හැකියාව පිළිබඳව, එම ලංසුව පිළිගැනීමට පෙර, දිසාපතිවරයා හෝ ඔහු විසින් පත්කරන බලයලත් නිලධාරියා තෘප්තියට පත්විය යුතුය.

3. මෙම වෙන්දේසියේදී ලංසු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන සෑම අයෙකුම, වෙන්දේසියේදී තමාම හෝ තමා විසින් සුදුසු ලෙස බලය පවරා දුන් නියෝජිතයෙකු ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතුය. නියෝජිතයන් මඟින් ලංසු ඉදිරිපත් කරන තැනැත්තා විසින්, ඒ සඳහා බලය දීමේ ලිපියක්, දිසාපති වරයාගේ හෝ ඔහු විසින් පත්කර ඇති බලය ලත් නිලධාරියාගේ පරීක්ෂණය සඳහා වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ඉදිරිපත් කළ යුතුය.

4. තවද, පිළිගත් ලංසුකරු විසින් තමා විසින් ඉදිරිපත් කරන ලද ලංසුව පිළිගත් වහාම එම ලංසුවේ වටිනාකමින් බාගයක් දිසාපති වරයාට හෝ ඔහුගේ නියෝජිතයාට හෝ ගෙවිය යුතු අතර, ලංසුවේ ඉතිරි මුදල වෙන්දේසි දිනයේ සිට සති දෙකක් ඇතුළත ගෙවිය යුතුය. තමා විසින් ඉදිරිපත් කළ මුළු ලංසු මුදල ගෙවූ පසු, පිළිගත් ලංසුකරුට වෙන්දේසියේ අනුමැතිය දෙනු ලැබේ. ඉදිරිපත් කළ ලංසුව පිළිගත් වහාම, තමාගේ ලංසුවෙන් බාගයක් ගෙවීමට හෝ ඉතිරි මුදල වෙන්දේසි දිනයේ සිට සති දෙකක් ඇතුළත ගෙවීමට යම්කිසි අන්දමකින් අපොහොසත් වුවහොත්, ඔහු විසින් ගෙවන ලද යම්කිසි මුදලක් වෙතොත්, එය රාජසන්තක කර, වෙන්දේසියද අවලංගු කිරීමට දිසාපතිවරයාට සතුව ඇති බලතල අනුව ක්‍රියාකරනු ලැබේ.

5. මෙම වෙන්දේසිය පිළිබඳ වූ සෑම කරුණකදීම දිසාපතිවරයා ගන්නා තීරණය අවසාන තීරණය වේ.

6. පිළිගත් ලංසුකරු, වෙන්දේසියේ අනුමැතිය ලැබී සති දෙකක් ඇතුළත ගොඩනැගිල්ල ඉවත්කර නොගතහොත්, එම ගොඩනැගිල්ල නැවතත් වෙන්දේසියේ විකුණනවා පමණක් නොව, ඔහු විසින් ගෙවන ලද අතිරේක මුදලද රජයට අයත් වන බව මෙයින් දනුම් දෙමි.

ඇම්. ඩබ්ලිව්. ඇස්. ගුනරත්න,
පුත්තලම දිසාපති.

1969 අගෝස්තු මස 7 දින,
කච්චේරිය, පුත්තලම.

8–1230—69.8.29 දින අංක 14,869 දරන ගසට් පත්‍රය

---

## බඩු බාහිරාදිය වෙන්දේසියේ විකිණීම

වර්ෂ 1969 සැප්තැම්බර් මස 12 වැනි දින පෙ.ව. 9.30 ට කොළඹ ඇවිලන් චතුරශ්‍රයෙහි පිහිටි පොලිස් අභ්‍යාස විද්‍යාලයේ බඩු ගබඩාවේදී පාවිච්චියට නුසුදුසු පහත සඳහන් බඩු බාහිරාදිය වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඇල තොප්පි
ඉන පටි හම්
උණ්ඩ උර
ඔතන පටි
කැලෑ කබා
කැන්වස් සපත්තු
කොට කලිසන්
කොහු ගුදිරි
නිල් කොට කලිසම්
බූට් සපත්තු
නිල ඇඳුම් පෙට්ටි
නිල ඇඳුම් පලස්
පරණ පුටු
හට කබා
බැනියම්
බුරුසු
නිල් දිග මේස්
වැහි කබා
සපත්තු ජෝඩු හම්
රෙදි කැලි
ජර්සි
පා පැදි
මදුරු දැල්
අශ්ව බල 10 විදුලි මෝටරය

යනාදිය.

වෙන්දේසිය අවසන් වූ වහාම මුදල් ගෙවා බඩු ගෙන යා යුතුය.

නා. ගු. සි. සෙනෙවිරත්න,
පුහුණු කිරීමේ අධ්‍යක්ෂක.

1969 අගෝස්තු මස 7 වැනි දින,
පොලිස් අභ්‍යාස විද්‍යාලය,
ඇවිලන් චතුරශ්‍රය,
කොළඹ 1.

8–1305—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

## රේගුවේ වෙන්දේසියක්

කොළඹ රේගුවේ ටී 3 විකිණීම් ගුදමේ තැන්පත් පහත සඳහන් බඩු 1969 සැප්තැම්බර් මස 15 වැනි දින පෙ. ව. 10 ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1969 සැප්තැම්බර් මස 14 වැනි දින පෙ.ව. 10 සිට 11.30 දක්වා එම බඩු ගැනුම්කරුවන්ට පරීක්ෂා කර බැලීමට පුළුවන.

මෙම වෙන්දේසියෙන් මිළයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතක් (7) ඇතුළත ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණනු බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැලකිය යුතුය.

1. අත්කොට බැනියම් (vests) බේල් 3 යි
2. ' ජලින්ට් ' කඩදසි කාටූන 1 යි
3. ' රැවට් බිට් බ්‍රෙසස් ' පෙට්ටි 5 යි
4. බැටරිවලින් ක්‍රියා කරවන මේස ලාම්පු කාටූන 15 යි
5. ' පිලිප් එන්ජ් 305 ' වර්ගයේ ටේප් රෙකෝඩර් පෙට්ටි 1 යි
6. යකඩ අඩුන සහිත ගෝලාකාර වැල් සනීපාරක්ෂක උපකරණ පෙට්ටි 6 යි
7. නිකල් ආලේප කළ දෙකට බෙදුන වානේ රිවට්ස් පෙට්ටි 1 යි
8. සෙල්ලම් බඩු (ප්ලාස්ටික් ආයුධ) පෙට්ටි 1 යි
9. රට උඳුන් සඳහාවූ තිර තොග 1 යි
10. බැටරිවලින් ක්‍රියා කරවන මිශ්‍රන යන්ත්‍ර
11. අතින් ක්‍රියා කරවන බුරුම පෙට්ටි 6 යි
12. ආහාර මිශ්‍ර කරන උපකරණ පෙට්ටි 2 යි
13. බැටරිවලින් ක්‍රියා කරවන සිතුරු මේස ලාම්පු පෙට්ටි 2 යි
14. මෘදු වානේ තහඩු පෙට්ටි 22 යි
15. පාට විදුලි බුබුළු පෙට්ටි 40 යි

සී. එස්. මෙන්ඩිස්,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : ඩීවී/69/25
1969 අගෝස්තු 21 වැනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේදීය.

8–1398–69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## රජයේ විදුලි දෙපාර්තමේන්තුව

### අංක 4 ශ්‍රී 7365 දරණ අබලන් වූ මෝටර් වෑන් රථය විකිණීම

කොළඹ, තැ. පෙ. 540, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් අංක 4 ශ්‍රී 7365 දරණ අබලන් වූ මෝටර් වෑන් රථය විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1969 සැප්තැම්බර් මස 19 වැනි දින පූ. භා. 10.00 දක්වා භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ 2, ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ, කොළඹ දිසා කළමනාකාර තැන ගේ කාර්යාලයෙහි දී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රුපියල් 5 ක මුදලක් ටෙන්ඩර් පෝරම සැපැයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා, ගත් කුවිතාන්සිය සමඟ කොළඹ දිසාවේ කළමනාකරුගෙන් ඉල්ලුම් කළ විට ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝරම ගාස්තුව වන රු. 5 හේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් පෝරම වලයි. වර්ෂ 1969 ක් වූ සැප්තැම්බර් මස 15 වැනි ද අ. භා. 2.00 වන තෙක් ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

වර්ෂ 1969 ක් වූ සැප්තැම්බර් මස 19 වැනි ද පූ. භා. 10 ට රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

එම්. අයි. අසීස්,
රජයේ විදිලි දෙපාර්තමේන්තුවේ
ප්‍රධාන කළමනාකරු.

රජයේ විදිලි දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1076,
කොළඹ 2.

8—1304—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## රජයේ දැන්වීමයි

1969 ජූනි මස 2 වන දින ගන්දර වෙරළට ගොඩගැසූ අංක. 7237/2කිව් දරණ '' ඔරිමස් '' නම් මාලදිවයින් සුළුප්පුව 1969 සැප්තැම්බර් මස 15 වැනි දින, පෙරවරු 10.30 ට දික්වැල්ලේ නිල්වැල්ලේ වෙරළේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. එම සුළුප්පුවේ තිබූ පහත සඳහන් භාණ්ඩ ද එදිනම දහවල් 12 ට ගන්දර පොලිස් ස්ථාන භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ඇත. වෙන්දේසිය පැවැත්වෙන වේලාවතෙක්, එම සුළුප්පුව සහ බඩු ගැණුම් කරුවන්ට තබා තිබෙන ස්ථානවලදී පරීක්ෂාකර බැලීමට පුළුවන.

සුළුප්පුව සහ එම බඩු වෙන්දේසියේ ගනු ලබන අයවළුන් විසින් වෙන්දේසිය අවසාන වූ වහාම සම්පූර්ණ මුදල ගෙවා භාරගත යුතුයි.

1. සායම් ටින් 1 යි.
2. භූමිතෙල් ගැලොම් 20 ක් සහිත බෝයා 3 ක් සහ ටින් 3 යි.
3. ඩීසල් තෙල් (ගැලොම් 5½ ක් සහිත) බෝයා එකක් සහ ටින් 1 යි
4. ප්ලාස්ටික් බෝයා 3 යි.
5. පනිවටු 1 යි.
6. කුඩා හිස් පීප්ප 1 යි.
7. කුඩා ලී පෙට්ටි 10 ක් සහිත ගෝනි මලු 1 යි.
8. හිස් බෝතල් සහිත ගෝනි 1 යි.
9. දිග අඩි 10 ටින් ෂීට්ස් 10 යි.
10. දිග අඩි 8 ටින් ෂීට්ස් 7 යි.
11. ලොකු බේසන් 1 යි.
12. ලෑලි පටි මිටි 1 යි.
13. ලොකු ලී පෙට්ටි 1 යි.
14. ඇන්කර් 2 යි.

එච්. බී. වීරරත්න,
අතිරේක දිසාපති,
මාතර ආණ්ඩුවේ ඒජන්ත වෙනුවට.

1969 අගෝස්තු මස 19 වැනි දින,
මාතර, දිසාපති කාර්යාලයේ දී ය.

8–1313—69.8.29 දින අංක 14,869 දරන ගැසට පත්‍රය

---

## පාවිච්චියට ගත නොහැකිවූ බඩු බාහිරාදිය වෙන්දේසියේ විකිණීම

වර්ෂ 1969 සැප්තැම්බර් 8 වෙනි දින පෙරවරු 10 ට රාගම මහර බන්ධනාගාරයේ පාවිච්චියට ගත නොහැකි පහත සඳහන් බඩු ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසියේ විකුණනු ලබන එක් එක් භාණ්ඩයන් සඳහා මුදල් එවෙලේම ගෙවා වෙන්දේසිය අවසන්වූ වහාම බඩු ගෙන ගිය යුතුය.

| | | |
|---|---|---|
| ආර්. සී. ඒ. ඇම්ප්ලිෆයර් යන්ත්‍ර | ... | 1 |
| ගුවන් විදුලි යන්ත්‍ර සඳහා ඩිටෙක්ටර් ස්ටේජ් | ... | 1 |
| ශබ්ද විකාශනයන් | ... | 12 |
| ශබ්ද විකාශනයන් පිනික්ස් ජූනියර් | ... | 1 |

ජේ. පී. දෙල්ගොඩ,
අධිකාරි,
මහර බන්ධනාගාරය, රාගම.

1969 අගෝස්තු මස 15 වැනි දින.

8–1225—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## අරක්කු තැබෑරුම් රේන්දය නැවත විකිණීම— නුවරඑළිය දිස්ත්‍රික්කය, 1969/70

1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා නුවරඑළිය දිස්ත්‍රික්කයෙහි පිහිටි පහත සඳහන් අරක්කු තැබෑරුම්වල සිල්ලරට අරක්කු විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිළදී ගැනීම සඳහා 1969 ජූලි මස 4 වන දින මවිසින් ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකරණ ලද නුවරඑළිය දිස්ත්‍රික්කයෙහි අරක්කු තැබෑරුම් විකිණීමේ දැන්වීමෙහි සඳහන් නීතිරීතිවලට හා කොන්දේසිවලට අනුකූලව ටෙන්ඩර් පත් මෙයින් කැඳවනු ලැබේ.

2. ටෙන්ඩර් පත් 1969 සැප්තැම්බර් මස 5 වන දින පහත උපලේඛනයේ එක් එක් තැබෑරුමේ ඉදිරියෙන් දක්වා ඇති වේලාවට වසනු ලැබේ.

පී. ඇම්. විජේකෝන්,
නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිසාපති.

1969 අගෝස්තු මස 17 වන දින,
නුවරඑළියේ දිසාපති කායාාලයේ දීය.

### උපලේඛනය

නුවරඑළිය දිස්ත්‍රික්කයේ අරක්කු තැබෑරුම් ලැයිස්තුව 1969–70

| තැබෑරුම් අංකය | කොට්ඨාශය | තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රාදේශීය කොට්ඨාශය | ටෙන්ඩර් වසන වේලාව |
|---|---|---|---|
| 1 ... | කොත්මලේ | රම්බොඩ නගරය තුළ ... | පෙ.ව.10.00 |

8–1332—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## මඩකලපු දිස්ත්‍රික්කයේ තොටුපොල රේන්ද විකිණීම, 1969–70

1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා ඇති කාල පරිච්ඡෙදය තුළ තොටුපල රේන්ද විකිණීම පිළිබඳ කොන්දේසිවලට යටත්ව, මඩකලපුව දිස්ත්‍රික්කයේ මෙහි පහත සඳහන් තොටුපලවල ගෙවිය යුතු රේන්ද ලබාගැනීමේ සහ අයකිරීමේ තනි අයිතිය මිළදී ගැනීම සඳහා ටැන්ඩර්පත් මෙයින් කැඳවනු ලැබේ.

2. එක් එක් ටෙන්ඩර් පත්‍රය සඳහා රු. 100 ක තැන්පත් මුදලක් ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පත්‍රයට ඇමිණිය යුතුය. ඒ ඒ ටෙන්ඩර් පත්‍රය සම්බන්ධයෙන් රු. 100 යේ මුදල තැන්පත් කළ බවට කුවිතාන්සිය මඩකලපුව කච්චේරියට 1969.9.26 වැනි දිනට පෙර ඉදිරිපත් කර ලබාගත් පෝර්මවල ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම, සීල් තබන ලද ලියුම් කවරයක බහා එම ලියුම් කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ "මඩකලපුව දිස්ත්‍රික්කයේ (තොටුපලේ නම)...........තොටුපල රේන්දය සඳහා ටෙන්ඩර් "යනුවෙන් සඳහන් කර, ටෙන්ඩර් පත් භාරගැනීම අවසාන කිරීමට නියම කර ඇති වේලාවට පෙර මඩකලපුවේ දිසාපති තැන වෙත ඉදිරිපත් කළ යුතුය.

4. 1969 සැප්තැම්බර් මස 27 වැනි දින මෙහි පහත සඳහන් වේලාවලදී ටෙන්ඩර්පත් භාරගනු ලැබේ. ටෙන්ඩර්පත් භාරගැනීම අවසාන කරන වේලාවේ දී ටෙන්ඩර් පත් කරුවන් මේ දිසාපති කාර්යාලයට පැමිණ සිටිය යුතුය. සෑම ටෙන්ඩර් පත් කරුවෙකු විසින්ම ටෙන්ඩර් පත්‍රය ඉදිරිපත් කරනු ලබන කොන්ත්‍රාත්තුව කරගෙන යෑම සඳහා ධන ශක්තිය තිබෙන බවට සහතිකයක්, තම ප්‍රදේශයේ ආණ්ඩුවේ දිසාපති තැනගෙන් හෝ ප්‍රාදේශිය ආදායම් නිලධාරි තැනගෙන් ලබාගෙන ටෙන්ඩර්පත් විවෘත කරන වේලාවේදී ඉදිරිපත් කළ යුතුය. විවිධසේවා සමුපකාර සමිති මගින් ඉදිරිපත් කෙරෙන ටෙන්ඩර් පත් සඳහා එම සමිතියට මෙම කොන්ත්‍රාත්තුව නිසියාකාරව ගෙන යෑමට මුදල් තත්ත්වය අතින් හැකියාවක් ඇති බවද, පහත සඳහන් ප්‍රකාර ටෙන්ඩර් පෝර්මයක් සමග නියමිත ඇප මුදල සම්පූර්ණයෙන් ම තැන්පත් කිරීමට ශක්තියක් ඇති බවට, තම ප්‍රදේශයේ සමුපකාර සංවර්ධන උප කොමසාරිස් තැන ගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

5. අයිතිය මිළදී ගත් බවට ප්‍රකාශ කළ වහාම තෝරාගනු ලැබූ ටෙන්ඩර් කරු විසින් තොටුපල රේන්ද විකිණීම පිළිබඳ කොන්දේසි අත්සන් කර ඇප තැන්පත් මුදල වශයෙන් මිළදී ගත් මුදලෙන් තුනෙන් පංගුවකට සමාන මුදලක් මඩකලපුවේ දිසාපති තැනට ගෙවිය යුතුය.

6. අයිතිය මිළදී ගත් තැනැත්තා වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ යම්කිසි ටෙන්ඩර්පත්කරුවෙක් කොන්දේසි අත්සන් කිරීමට ප්‍රතික්ෂෙප කළහොත් හෝ අවශ්‍ය ඇපය තැන්පත් කිරීමට අසමත් වුවහොත් හෝ ඇප ඔප්පුව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මුදල් තැන්පත් කිරීමට අසමත් වුවහොත්, ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල අහිමි කර, මින් ඉදිරියේ දී ආණ්ඩුවේ කිසිම කොන්ත්‍රාත්තුවක් කිරීමට නොහැකි ලෙස ප්‍රකාශ කරනු ලැබේ. මෙම කොන්දේසිවලට යටත්ව, තෝරාගත් ටෙන්ඩර්පත් කරු හෝ ටෙන්ඩර් පත් කරුවන් විසින් ඉහත සඳහන් තොටුපල රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කර ඇප මුදල තැන්පත් කළ පසු ටෙන්ඩර්පත් කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු දෙනු ලැබේ.

7. කිසිම හේතුවක් සඳහන් නොකර ටෙන්ඩර් පත්‍රයක් හෝ ටෙන්ඩර් පත්‍ර සියල්ලම හෝ ප්‍රතික්ෂෙප කිරීමේ බලය දිසාපති තැනවෙත පැවරී තිබේ.

8. දැනට බෝට්ටු වැඩ කරන තොටුපලවලට බෝට්ටු සපයනු ලැබේ. ලබාගතහැකි අවස්ථාවලදී කුඩා බෝට්ටු (වල්ලම්) සපයනු ලැබේ. රජයෙන් සැපයීමට කුඩා බෝට්ටු නැති අවස්ථාවලදී තොටුපලේ සාර්ථක ලෙස වැඩ කිරීම සඳහා තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුවන් විසින්ම කුඩා බෝට්ටු සපයාගත යුතුය.

9. තොටුපල රේන්ද කොන්දේසි අනුව, තැපැල් ගෙන යාමට තැපැල් පණිවුඩකරුවන් සහ රජයේ වාහන වලට තොටුපල කුළී ගෙවිය යුතු නැත. තෝරාගත් ටෙන්ඩර්පත්කරුවන් තැපැල් පණිවුඩකරුවන්ගෙන් සහ රජයේ වාහන වලින් තොටුපල කුලී අයකිරීම නොකළ යුතුය.

10. අවශ්‍ය වැඩි විස්තර මඩකලපුවේ දිසාපති කාර්යාලයෙන් ලබාගත හැක.

ඊ. ප්‍රනාන්දු,
මඩකලපු දිස්ත්‍රික්කයේ අතිරේක දිසාපති.

1969 අගෝස්තු මස 18 වැනි දින,
මඩකලපු දිසාපති කාර්යාලයේ දී ය.

| තොටුපලේ නම | තොටුපල පිහිටි ප්‍රාදේශීය ආදායම් නිළධාරි කොට්ඨාශය | ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන වේලාව පෙරවරු |
|---|---|---|
| වෙරුගල් ... | කෝරළේ පත්තු ... ... | 10.00 |
| පනිච්චන්කර්ණි ... | කෝරළේ පත්තු ... ... | 10.15 |
| කිරාන් ... | කෝරළේ පත්තු ... ... | 10.30 |
| තිම්ලතිව් ... | මන්මුනෙයි පත්තු උතුර ... | 10.45 |
| වලයරව් ... | මන්මුනෙයි පත්තු උතුර ... | 11.00 |
| මන්මුනෙයි ... | මන්මුනෙයි පත්තු උතුර ... | 11.15 |
| තුරෙයිනීලාවනී ... | මන්මුනෙයි දකුණ සහ එරුවිල් පෝරතිව් පත්තු ... ... | 11.30 |
| අම්පිලාන්තුරෙයි | මන්මුනෙයි දකුණ සහ එරුවිල් පෝරතිව් පත්තු ... ... | 11.45 |
| කුරුමන්වෙලි ... | මන්මුනෙයි දකුණ සහ එරුවිල් පෝරතිව් පත්තු ... ... | 12.00 |

8—1299–69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## 1969–70 වර්ෂයට බදුල්ල දිස්ත්‍රික්කයේ රටබීම රේන්ද නැවත විකිණීම

වර්ෂ 1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කාලය තුළ බණ්ඩාරවෙල අංක 1 දරණ රටබීම (මෙරට සාදන ධාන්‍ය මත්පැන් ඇතුළුව) සිල්ලරට විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර පහත සඳහන් කොන්දේසියට යටත්ව භාර ගනු ලැබේ.

(අ) 1969 ජූලි මස 11 වැනි දින අංක 14,862 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීම අනුව,

2. ඉහත සඳහන් තැබෑරුම සඳහා ටෙන්ඩර්පත් 1969.9.4 වැනි දින, පෙරවරු 10.00 ට හෝ ඊට ප්‍රථමයෙන් මා වෙත ලැබිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍රය එවනු ලැබූ අය පුද්ගලිකව බදුල්ල කච්චේරියට නොපැමිණියහොත් ඔවුන්ගේ ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. වැඩි විස්තර බදුල්ල දිසාපති කායර්‍යාලයෙන් දැනගත හැකිය.

ඩබ්ලිව්. තිලකරත්න,
බදුල්ල දිසාවේ අතිරේක දිසාපති.

1969 අගෝස්තු 15 වැනි දින,
බදුල්ලේ,
දිසාපති කායර්‍යාලයේදීය.

8–1253—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

## 1969–70 වර්ෂයේ අරක්කු තැබෑරුම් නැවත විකිණීම—පුත්තලම් දිස්ත්‍රික්කය

1969 ඔක්තෝබර මස 1 වෙනි දින සිට 1970 සැප්තැම්බර මස 30 වැනි දිනය තෙක් වූ කාලසීමාව තුළ පහත සඳහන් ස්ථානයන්හි අරක්කු සිල්ලරයෙන් විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍රිකා පුත්තලමේ දිසාපති තැන විසින් පුත්තලමේ දිසාපති කාර්යාලයේ දී භාරගනු ලැබේ. මෙම ටැන්ඩර් පත්‍රිකා භාරගනු ලබන්නේ 1969.6.27 වැනි දින ප්‍රකාශයට පත් අංක 14,860 දරණ රජයේ ගැසට් පත්‍රයේ 1969–70 වර්ෂයේ අරක්කු තැබෑරුම් විකිණීම සම්බන්ධව මා විසින් පළ කරවන ලද කොන්දේසිවලට යටත්වය.

ඇම්. ඩබ්. ඇස්. ගුණරත්න,
පුත්තලමේ දිසාපති.

1969 අගෝස්තු මස 21 වැනි දින,
පුත්තලම් දිසාපති කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| අනු අංක | කොට්ඨාශය | ග්‍රාමය | ටැන්ඩර් පත්‍රිකා භාරගන්නා දිනය හා අවසාන වේලාවන් |
|---|---|---|---|
| 3 | පුත්තලම් පත්තුව | තේතාපොළ | 1969.9.7 පෙරවරු 9.20 |
| 4 | එම | කන්දතොඩුවාව | 1969.9.7 පෙරවරු 9.40 |
| 7 | එම | කට්ටෙයිකාඩු | 1969.9.7 පෙරවරු 10.00 |
| 8 | එම | ඔත්තපානි පෙරිය | 1969.9.7 පෙරවරු 10.20 |
| 10 | එම | ආඩිමුනේ | 1969.9.7 පෙරවරු 10.40 |
| 11 | කල්පිටිය | සෝත්තුපිටිය වාඩිය | 1969.9.7 පෙරවරු 11.00 |
| 12 | එම | ඒත්තාලේ | 1969.9.7 පෙරවරු 11.20 |
| 13 | එම | නාරක්කල්ලිය | 1969.9.7 පෙරවරු 11.40 |
| 14 | දෙමළ හත්පත්තුව | ඉහළ මණ්ඩලාන | 1969.9.7 මධ්‍යාහ්න 12.00 |
| 15 | උතුරු පිටිගල් කෝරලය | උඩප්පුව | 1969.9.7 පස්වරු 12.20 |
| 16 | එම | වෙල්ලාවල | 1969.9.7 පස්වරු 1.20 |
| 17 | එම | රාජකදලුව | 1969.9.7 පස්වරු 1.40 |
| 18 | එම | කරුකුපොනේ | 1969.9.7 පස්වරු 2.00 |
| 19 | එම | දෙමටපිටිය | 1969.9.7 පස්වරු 2.20 |
| 20 | එම | බණ්ඩාරවත්ත | 1969.9.7 පස්වරු 2.40 |
| 21 | එම | පම්බල | 1969.9.8 පෙරවරු 9.20 |
| 22 | එම | අඹකඳවිල | 1969.9.8 පෙරවරු 9.40 |
| 23 | එම | උදලාවල | 1969.9.8 පෙරවරු 10.00 |
| 26 | නාත්තන්ඩිය | උතුරු තොඩුවාව | 1969.9.8 පෙරවරු 10.20 |
| 29 | එම | පහළ තල්ගස් අගාර | 1969.9.8 පෙරවරු 10.40 |
| 32 | එම | දෙමටපිටිය | 1969.9.8 පෙරවරු 11.00 |
| 35 | වෙන්නප්පුව | උල්හිටියාව | 1969.9.8 පෙරවරු 11.20 |
| 37 | එම | බොරලැස්ස | 1969.9.8 පෙරවරු 11.40 |
| 39 | එම | නන්ජුන්ඩන්කරේ | 1969.9.8 මධ්‍යාහ්න 12.00 |

සැ.යු.—අංක 35—උල්හිටියාව තැබෑරුම වෙන්නප්පුව සුළු නගර සභා සීමාව තුළ පිහිටුවීමට බලය දෙනු නොලැබේ.

8–1397—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

## අරක්කු රේන්ද නැවත විකිණීම—රත්නපුර දිස්ත්‍රික්කය—1969–70

1969 ඔක්තෝබර් මාසයේ 1 වෙනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා ඇති කාල සීමාව තුළ මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ප්‍රදේශයන්හි, අරක්කු සිල්ලර වශයෙන් විකිණීම පිණිස, පහත දක්වෙන නීතිවලට අනුකූලව ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

(i) 1969 ජූනි මස 6 වෙනි දින අංක 14,857 දරණ රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි අනුව, හා

(ii) සුරාබද්ද නිවේදනයේ දක්වෙන සෑම සුරාබද්ද බලපත්‍රයක් කෙරෙහි ම බලපාන පොදු කොන්දේසි මාලාවට යටත්වය.

2. සෑම ටෙන්ඩර්කරුවෙක් විසින්ම ඕනෑම කච්චේරියකින් ලබා ගන්නා ලද නියමිත ආකෘති පත්‍රයක් සම්පූර්ණ කර එවිය යුතුයි. එසේ ඉදිරිපත් කරන සෑම ටෙන්ඩරයක් සමඟම කච්චේරියේ මුදල් තැන්පත් කළ බවට ලබා ගත් කුවිතාන්සියක් ද අමුණා තිබිය යුතුයි. බලංගොඩ අංක 1 දරණ අරක්කු තැබෑරුම සඳහා රු. 2,000 ක් තැන්පත් කළ යුතුයි.

3. ඉදිරිපත් කරන ටෙන්ඩරය සුරක්ෂිත ලෙස කවරයක බහා සීල් තබා වම් කෙළවරෙ මුදුනේ තැබෑරුමේ නම සහ අංකය පැහැදිලිව සඳහන් කර ටෙන්ඩර් වහන නියමිත වේලාවට පෙර ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය. තැපෑලෙන් එවන්නේ නම්, '' රත්නපුර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතැන, රත්නපුර '' යන ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. නැතහොත් කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි බහාලිය යුතුයි.

4. සෑම ටෙන්ඩර්කරුවෙක්ම තමාගේ නමින්ම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. නියෝජිතයන්ගේ මාර්ගයෙන් හෝ ලාංකික නොවන අයගේ නමින් අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසිවල 6 වැනි කොන්දේසිය අනුව නුසුදුස්සෙකු වූ අයගේ නමින් හෝ ටෙන්ඩර් පිළිගනු නොලැබේ.

5. එක් අයෙකුට එක් තැබෑරුමක් සඳහා එක් ටෙන්ඩර් පත්‍රයකට වඩා එවිය නොහැක. එක් තැබෑරුමක් සඳහා පස් දෙනෙකුට වැඩි අයවලුන් විසින් ද ටෙන්ඩර් ඉදිරිපත් කළ නොහැක.

6. ටෙන්ඩරයේ මුදල අකුරෙන් සහ ඉලක්කමෙන් දක්විය යුතුය. ටෙන්ඩරයේ කරන සෑම වෙනස් වීමක්ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන සහ දිනය යොදු සහතික කළ යුතුය. මේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

7. තෝරා ගත් ටෙන්ඩර්කරු, මිළදී ගත් තැනැත්තා හැටියට ප්‍රකාශ කළ විගසින්ම රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා, දිසාපති තැන විසින් නියම කරන ලද මුදල ඇප වශයෙන් තැන්පත් කළ යුතුයි.

8. කිසිදු හේතුවක් නොදක්වා, කිසියම් ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම හෝ ස්වකීය අභිමතය පරිදි ප්‍රතික්ෂෙප කිරීමේ බලය ආණ්ඩුවේ ඒජන්ත වෙතට පැවරී ඇත.

9. පහත සඳහන් පරිදි, එක් එක් තැබෑරුමකට නියම කර ඇති වේලාවන්හිදී, 1969 සැප්තැම්බර් 11 වෙනි බ්‍රහස්පතින්ද ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. සෑම ටෙන්ඩර්කරුවෙක්ම එකී නියමිත වේලාවට කච්චේරියේ පෙනී සිටිය යුතුය.

10. ටෙන්ඩර්කරුගේ දැනගැනීම සඳහා මෙම දිස්ත්‍රික්කයේ වතුවල තිබෙන කැන්ටින් ලැයිස්තුවක් ද පහත සඳහන් කර ඇත.

11. වැඩි විස්තර රත්නපුර කච්චේරියෙන් විමසා දැනගත හැකිය.

අ. පු. බ. මනම්පේරි,
රත්නපුර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තැන.

1969 අගෝස්තු මස 17 වැනි දින,
රත්නපුර දිසාපති කාර්යාලයේ දී ය.

## උපලේඛනය

| අනුක්‍රමික අංක | කොට්ඨාශය | පිහිටි ප්‍රදේශය | කැබැරුම විවෘත කරන වේලාව | කැබැරුම වහන වේලාව | ටෙන්ඩර් වහන වේලාව |
|---|---|---|---|---|---|
| 1. | බලංගොඩ නගර සභා කොට්ඨාශය ... | බලංගොඩ නගර සභාවේ අංක 5 දරණ නාගරික කොට්ඨාශය | පූර්වභාග 8.30 ... | අපරභාග 8.30 ... | පූර්වභාග 10.30 |

වතු කැන්ටීන් (ටෙන්ඩර් කිරීම සඳහා නොවේ)

| | | | |
|---|---|---|---|
| 2. | අටකලන් කෝරළය ... | මාදම්පේ වත්ත ... | ... වත්තේ අධිකාරීගේ මනාපය උඩ පවතී. |

8–1252—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

## ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

### නූල් වෙළඳ ගබඩාව

කොළඹ 10, අංක 180 ඩීන්ස් පාරේ පිහිටි, ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ''නූල් වෙළඳ ගබඩාව'' බඩු ගණන් ගැනීම සඳහා 1969 සැප්තැම්බර් මස 11 දින සිට ඔක්තෝබර් මස 17 දක්වා දෙදිනම ඇතුළුව වසා තබනු ලැබේ.

පී. එච්. පී. ද සිල්වා,
අධ්‍යක්ෂ.

ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
කොළඹ 7,
1969 අගෝස්තු මස 22 වන දින.

8–1370—69.8.29 දින අංක 14,869 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳ වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතුවන බව සලකන්න.

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්‍යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

උපලේඛනය

**1969**

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| ජූනි | 69. 6. 6 සිකුරාද | 69. 5.30 සිකුරාද | දවල් 12.00 |
| | 69. 6.13 සිකුරාද | 69. 6. 6 සිකුරාද | දවල් 12.00 |
| | 69. 6.20 සිකුරාද | 69. 6.13 සිකුරාද | දවල් 12.00 |
| | 69. 6.27 සිකුරාද | 69. 6.20 සිකුරාද | ප.ව. 3.30 |
| ජූලි | 69. 7. 4 සිකුරාද | 69. 6.27 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 7.11 සිකුරාද | 69. 7. 4 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 7.18 සිකුරාද | 69. 7.11 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 7.25 සිකුරාද | 69. 7.18 සිකුරාද | ප.ව. 3.30 |
| අගෝස්තු | 69. 8. 1 සිකුරාද | 69. 7.25 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8. 8 සිකුරාද | 69. 8. 1 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8.15 සිකුරාද | 69. 8. 8 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8.22 සිකුරාද | 69. 8.15 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8.29 සිකුරාද | 69. 8.22 සිකුරාද | ප.ව. 3.30 |
| සැප්තැම්බර් | 69. 9. 5 සිකුරාද | 69. 8.29 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 9.12 සිකුරාද | 69. 9. 5 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 9.19 සිකුරාද | 69. 9.12 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 9.26 සිකුරාද | 69. 9.19 සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් | 69.10. 2 බ්‍රහස්පතින්ද | 69. 9.26 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.10. 9 බ්‍රහස්පතින්ද | 69.10. 2 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 69.10.17 සිකුරාද | 69.10. 9 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 69.10.24 සිකුරාද | 69.10.17 සිකුරාද | දවල් 12.00 |
| | 69.10.31 සිකුරාද | 69.10.24 සිකුරාද | දවල් 12.00 |
| නොවැම්බර් | 69.11. 7 සිකුරාද | 69.10.31 සිකුරාද | දවල් 12.00 |
| | 69.11.14 සිකුරාද | 69.11. 6 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 69.11.21 සිකුරාද | 69.11.14 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.11.28 සිකුරාද | 69.11.21 සිකුරාද | ප.ව. 3.30 |
| දෙසැම්බර් | 69.12. 5 සිකුරාද | 69.11.28 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.12.12 සිකුරාද | 69.12. 4 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 69.12.19 සිකුරාද | 69.12.12 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.12.26 සිකුරාද | 69.12.18 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

1969 ජූනි මස 13 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි